
මානව හිමිකම් හා
ජාතික ආරක්ෂාව



මාංචු පිට

අත්තනෝමතික රඳවා තබා ගැනීම හා ජාතික ආරක්ෂාව

AMNESTY
INTERNATIONAL

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වනාහි ලොව පුරා මිලියන තුනක ආධාරකරුවන්, සාමාජිකයින් හා ක්‍රියාධරයින් සහිත රටවල් හා භූගෝලීය කලාප 150ක් පුරා ව්‍යාප්ත ව ඇති, බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් අවසන් කිරීම පිණිස වන ගෝලීය ව්‍යාපාරයකි.

අප ගේ දැක්ම වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රකාශනයන් හි අඩංගු මානව හිමිකම් ලොව පුරා වාසය කරන සෑම පුද්ගලයෙකු විසින් ම භුක්ති විඳිනු දකින්නට ලැබීමයි.

අප සියළු රාජ්‍යයන්, දේශපාලන මතවාද හා ආර්ථික, ආගමික උවමනාවන් ගෙන් ස්වාධීන වූ සංවිධානයකි. අප, සාමාජිකත්වය හා මහජනතාව විසින් සපයන අරමුදල් මත ක්‍රියා කරන සංවිධානයකි.

AMNESTY
INTERNATIONAL

ප්‍රථම මුද්‍රණය 2012
Amnesty International Ltd
Peter Benenson House
1 Easton Street
London WC1X 0DW
United Kingdom

© Amnesty International 2012

සුචිය: ASA 37/003/2012 Sinhala
මුල් ප්‍රකාශනය ඉංග්‍රීසි බසිනි
ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසින් මුද්‍රණය කරන ලදී.
International Secretariat, United Kingdom

සියළු හිමිකම් ඇහිරිණ. මෙහි අයිතිය ප්‍රකාශකයන් සතුය. එහෙත් මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු නොමිලේ සිදු කරන මානව හිමිකම් උද්ඝෝෂණ ව්‍යාපාර,ප්‍රචාරණය හා අධ්‍යාපනික අරමුණු පිණිස අවසරයකින් තොරව උපුටා දක්විය හැකි අතර එබඳු අවස්ථාවන් අප වෙත දැනුම් දීම මෙම ප්‍රකාශනයේ බලපෑම පිළිබඳව තක්සේරු කිරීමට උපකාර වනු ඇත. ඒ හැර මෙම ප්‍රකාශනය පිටපත් කිරීම, උපුටා දක්වීම, පරිවර්තනය හෝ අනුවර්තනය පිණිස ප්‍රකාශක ගෙන් ලිඛිත අවසරයක් ලබා ගෙන ගෙවීමක් ද කළ යුතු බව සලකන්න. අවසර ලබා ගැනීම පිණිස කරුණු ලබන සියළු විමසිම් copyright@amnesty.org යන විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

කවරය: බන්ධනාගාර නිල නිවාස, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ, ශ්‍රී ලංකාව.
© ගැස්ටන් ලාකෝම්බේ: ඉන්ටර්නැෂනල් බිර්ජස් ටු ජස්ටිස්

www.amnesty.org

මාංචු පිට

රැදවුම් භාරයට ගැනීම හා ජාතික ආරක්ෂාව

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය

ප්‍රථම මුද්‍රණය 2012

Amnesty International Ltd
Peter Benenson House
1 Easton Street

London WC1X 0DW

United Kingdom

© Amnesty International 2012

සුචිය: ASA 37/003/2012

මුල් ප්‍රකාශනය ඉංග්‍රිසි බසිනි.

සියළු හිමිකම් ඇහිරිණ. මෙහි අයිතිය ප්‍රකාශකයන් සතුය. එහෙත් මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු නොමිලේ සිදු කරන මානව හිමිකම් උද්ඝෝෂණ ව්‍යාපාර,ප්‍රචාරණය හා අධ්‍යාපනික අරමුණු පිණිස අවසරයකින් තොරව උපුටා දැක්විය හැකි අතරඋ එබඳු අවස්ථාවන් අප වෙත දැනුම් දීම මෙම ප්‍රකාශනයේ බලපෑම පිළිබඳව තක්සේරු කිරීමට උපකාර වනු ඇත. ඒ හැර මෙම ප්‍රකාශනය පිටපත් කිරීම, උපුටා දැක්වීම, පරිවර්තනය හෝ අනුවර්තනය පිණිස ප්‍රකාශක ගෙන් ලිඛිත අවසරයක් ලබා ගෙන ගෙවීමක් ද කළ යුතු බව සලකන්න.

අවසර ලබා ගැනීම පිණිස කරණු ලබන සියළු විමසිම් copyright@amnesty.org යන විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

කවරය: බන්ධනාගාර නිල නිවාස, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ, ශ්‍රී ලංකාව.

© ගැස්ටන් ලාකෝම්බේ: ඉන්ටර්නැෂනල් බ්‍රිර්ජස් ටු ජස්ටිස්

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වනාහි ලොව පුරා මිලියන තුනක ආධාරකරුවන්, සාමාජිකයින් හා ක්‍රියාධරයින් සහිත රටවල් හා භූගෝලීය කලාප 150ක් පුරා ව්‍යාප්ත ව ඇති, බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් අවසන් කිරීම පිණිස වන ගෝලීය ව්‍යාපාරයකි.අප ගේ දැක්ම වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රකාශනයන් හි අඩංගු මානව හිමිකම් ලොව පුරා වාසය කරන සෑම පුද්ගලයෙකු විසින් ම භුක්ති විඳිනු දකින්නට ලැබිමයි. අප සියළු රාජ්‍යයන්, දේශපාලන මතවාද හා ආර්ථික, ආගමික උවමනාවන් ගෙන් ස්වාධින වූ සංවිධානයකි. අප, සාමාජිකත්වය හා මහජනතාව විසින් සපයන අරමුදල් මත ක්‍රියා කරන සංවිධානයකි.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය

පටුන

1	සාරංශය	5
2	හැඳින්වීම	6
3	අත්තනෝමතිකව රඳවා තබා ගැනීම: නීතීමය රාමුව	14
	ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත	17
4	ශ්‍රී ලංකාවේ අන්තනෝමතිකව රඳවා තබා ගැනීමේ රටාව	20
	නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටිය අහිමි කිරීම	24
	වධ හිංසාවලට භාජන කිරීම	29
	ඥාතීන් හෝ මිත්‍රයන් මුණ ගැසීමට ඉඩ නොදීම	34
	නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමට ඉඩ නොදීම	37
	රැදවියන්ට සංදේශනයට ඉඩ නොදීම හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම	39
	තර්ජනය කිරීම	44
	අල්ලස් ඉල්ලා සිටීම	47
5	පුනරුත්ථාපනය ?	47
6	නිගමනයන්	54
	නිර්දේශ	55
7	උපග්‍රන්ථය	57
	නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටිය ප්‍රතික්ෂේප කිරීම	57
	2011 අගෝස්තු 29 දින ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ සාදන ලද නියෝග	58
	ශ්‍රී ලංකාවේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත එවන ලද ලිපිය 2011 මැයි	59
8	පසු සටහන්	61

නිදහසට ඇති අයිතිවාසිකම: සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය. 9 වන වගන්තිය

1- සෑම කෙනකුටම පුද්ගල නිදහසට හා සුරක්ෂිතභාවයට අයිතිවාසිකම් ඇත්තේය. කිසිම කෙනෙකු අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම නොකළ යුතුය. නීතියෙහි ලා ප්‍රතිෂ්ඨාපිත හේතු මත සහ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම කෙනෙකුට ඔහුගේ නිදහස අහිමි නොකළ යුතුය.

2- ඔහු සිරභාරයට ගනු ලබන ඕනෑම තැනැත්තෙකුට ඔහු එසේ සිරභාරයට ගැනීමට හේතු සිරභාරයට ගනු ලබන අවස්ථාවෙහි දැන්විය යුතු අතර, ඔහුට විරුද්ධව ඇති චෝදනා ද නොපමාව දැන්විය යුතුය.

3- සාපාරාධී චෝදනාවක් මත සිරභාරයට ගනු ලබන ඕනෑම කෙනකු විනිශ්චයකරුවකු හෝ විනිශ්චය බලතල ක්‍රියාත්මක කිරීමට බලය දෙනු ලැබූ වෙනත් ඕනෑම නිලධාරියකු හමුවට නොපමාව පත්කළ යුතු අතර, සාධාරණ කාලයක් ඇතුළත නඩු විභාග කරනු ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය. නඩු විභාගයක් පොරොත්තුව සිටින තැනැත්තන් සිරභාරයෙහි තබා ගැනීම සාමාන්‍ය රීතිය නොවිය යුතුය. එහෙත්, නිදහස් කර හැරීම, නඩු විභාගයට විනිශ්චයක කෘත්‍යයෙහි ඕනෑම අවස්ථාවක සහ අවශ්‍ය වුවහොත් නඩු තීන්දුව ක්‍රියාත්මක කරන අවස්ථාවේ දී පෙනී සිටින බවට කෙරෙන සහතිකවීම්වලට යටත්ව සිදු කළ යුතුය.

4- සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හේතු කොට ගෙන සිය නිදහස අහිමි වූ ඕනෑම කෙනකුට, ඔහු එසේ සිරභාරයෙහි රඳවා ගැනීම නීත්‍යානුකූල නොවන්නේ නම්, ඔහු මුදා හැරීමට නියෝග කිරීමත් සඳහා අධිකරණයක ඉදිරියෙහි නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට හිමිකම් ඇත්තේය.

5- නීත්‍යානුකූල නොවන සිරභාරයට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට භාජන වූ ඕනෑම තැනැත්තෙකුට වන්දි ලබා ගැනීම සඳහා බලාත්මක කළ හැකි අයිතිවාසිමක් ඇත්තේය.

1- සාරාංශය

දැවිඩ ඊලාම් විමුක්ති කොටීන් සමග දිර්ඝ කාලයක් පවත්වා ගෙන ගිය යුද්ධය 2009 දී ශ්‍රී ලංකා රජය විසින් ජයග්‍රහණය කරන ලදී. නමුත් යුද්ධ ගැටුම් පැවති යුගයේ පාවිච්චි කළ අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම හා රඳවා තබා ගැනීමේ පුරුද්ද තවදුරටත් පවත්වා ගෙන යයි. ව්‍යවස්ථානුකූල වගන්ති, නෛතික විධිවිධාන හා රෙගුලාසි මගින් පුද්ගලයින් අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීමෙන් හා නඩු විභාග නොකර සිටීම වළක්වා ඇත. නමුත් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා හදිසි නීති .රෙගුලාසි මඟින් මානව අයිතිවාසිකම් හා නීතියේ ආධිපත්‍ය උල්ලංඝණය කරන අතර ආරක්ෂක හමුදා අතිවිශාල රැකවරණයක් භුක්ති විඳිති.

පසුගිය දශක තුන තුළ, ශ්‍රී ලංකා බලධාරීන් නීතියට පරිබාහිරව ක්‍රියාකරමින් පොදුවේ යුක්තය පසිඳලීමෙහි ක්‍රියා පටිපාටිය අඩංගු විධිවිධාන නොසලකා හරිමින් ඒවා උල්ලංඝණය කරන ලදී. එසේ කරන ලද්දේ බොහෝ විට සාක්ෂි හෝ වරෙන්තුවකින් තොරව සැකකරුවකු අත් අඩංගුවට ගැනීමට හා චෝදනා ඉදිරිපත් කිරීමකින් හෝ නඩු පැවරීමකින් තොරව රඳවා තබා ගත්තේ ආරක්ෂක නීති රීති හා රෙගුලාසි වල ආධාරයෙනි. මෙම ආරක්ෂක ආධිපත්‍ය, දශක ගණනාවක් තිස්සේම ප්‍රතිපත්ති සම්පාදකයින්ටත්, පොලීස් හා ආරක්ෂ හමුදා හා සිවිල් සේවකයින්ටත් පමණක් නොව සාමාන්‍ය මහජනතාවට ද දෛනික ජීවිතයේ අංගයක් බවට පත් වුයේය. එමඟින් යුක්තිය පිළිබඳ සංකල්ප හා නෛතික ක්‍රියාපටිපාටි හකුලා දමන ලද අතර හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ මහජන විශ්වාසය සෝදා පාළුවට ලක් කරන ලදී. එමඟින් විධායකය සංවරණයට ලක් කිරීම අඩපණ කළ අතර අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් ඉහළ නැගුනි. රඳවා තබා ගැනීම් හා තොරතුරු දැන ගැනීම පිණිස අධිකරණයේ පිහිට පැතීම වළක්වාලීම වර්ධනය විය. මේ සියල්ලෙහි වන්දිය ගෙවන්නට සිදු වුයේ මානව හිමිකම්වලටය.

ආයුධ සන්නද්ධ අරගලය නිමාවීමත් සමගම මෙම භාවිතයන් ද නිමා(අඩු තරමින් අවම විමක්වත්) වනු ඇතැයි අපේක්ෂා කළ නමුත් එසේ සිදුනොවීම කණගාටුවට කරුණකි. අවම ශ්‍රී ලංකා බලධාරින් සැකකරුවන්ට අවම ආරක්ෂාවක්වත් සහතික නොකරමින් ඔවුන් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම් දිගටම සිදු කරයි. ශ්‍රී ලංකා නීතියට අනුව වැඩිදුරටත් විමර්ශන කටයුතු කිරීම පිණිස, රැදවියන් සිර මැදිරියෙන් එළියට රැගෙන යාමට පොලීසියට බලය තිබේ. නමුත් එය රැදවියන් වධහිංසාවන්ට භාජනය කිරීමට හා අත් අඩංගුවේ දී ඝාතනය කිරීමට ඉඩ දෙන පුරුද්දකි. රැදවියන්ට සිය ඥාතීන් හා මිත්‍රයින් සමග සංදේශනයට ඉඩ දෙනු නොලැබේ. පුද්ගලික නිවාස, කඳවුරු බවට පරිවර්තනය කළ පාසැල්, පරිපාලන හා ගබඩා වැනි නිල නොවන රැඳවුම් මධ්‍යස්ථානයන් හි මෙම සැකකරුවන් රඳවා ගන්නා අතර එහිදී ඔවුහු වධහිංසාවන්ට භාජනය කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ මෙම අත්තනෝමතික රඳවා තබා ගැනීමේ පුරුද්ද නිසා වධහිංසා පැමිණවීම,

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම, අධිකරණ බාහ්‍ය ඝාතන අත්තනෝමතික ලෙස අත්අඩංගුවේ තබා ගැනීම පුරුද්ද නිසා ඇති වී තිබේ. ශ්‍රී ලංකාවේ ආයුධ සන්නද්ධ අරගලයත් සමගම වර්ධනය වූ වරදින් නිදෙස් කිරීමේ සංස්කෘතිය මඟින් නීතියේ ආධිපත්‍ය යටපත් කරන අතරෙ යුක්තිය පසඳලීම වළක්වයි.

මෙම වාර්තාව විසින් ආයුධ සන්නද්ධ අරගලය නිමා වීමෙන් පසුත් අඛණ්ඩව වර්ධනය වන මානව හිමිකම් උල්ලංඝණය කිරීමේ එක් ක්‍රමයක් වන නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටිය අනනුකූලව රඳවා ගැනීම පිළිබඳ පුරුද්ද අනාවරණය කරයි. ශ්‍රී ලංකා බලධාරීන් මෙම පුරුද්ද වහාම අත්හළ යුතු අතරෙ රැඳවියන් සම්බන්ධයෙන් සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන් වහාම විමර්ශනය කොට වගකිව යුත්තන් අධිකරණය ඉදිරියට ගෙන ආ යුතුය අතරෙ අන්තර් ජාතික මානව හිමිකම් නීතියට ප්‍රතිවිරුද්ධ නීති අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කළ යුතුයැයි අපි නිර්දේශ කරන්නෙමු.

2- හැඳින්වීම

ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කිරීමේ දෛනික මෙවලමක් බවට අත්තනෝමතික හා නීතියට පරිබාහිර රඳවා තබා ගැනීම් පත් වී ඇත. ශ්‍රී ලංකා ආණ්ඩු විසින් ඉහත කී මෙවලම් මහජන ආරක්ෂාවට තර්ජන වනු ඇතැයි සැක කරන හා, ආයුධ සන්නද්ධ කණ්ඩායම් සාමාජිකයින් පමණක් නොව ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් හා මිත්‍රයින් සම්බන්ධයෙන්ද ක්‍රියාත්මක කරයි. එපමණක් නොව විවෘතව අදහස් පළ කරන නිදහස් මතධාරීන්ද, මාධ්‍යවේදීන් ඇතුළු දේශපාලන විරුද්ධවාදීන්ද ඉහත කී මෙවලම්වල ගොදුරු බවට පත් වේ. සුප්‍රසිද්ධ බරපතළ අපරාධකරුවන් පමණක් නොව පුද්ගලයින් ද මෙම මෙවලම්වල ගොදුරු බවට පත් වේ.[1] මෙලෙස අත් අඩංගුවට ගනු ලබන තැනැත්තන් ගෙන් ඇතැමුන් නඩු විභාගයකින් තොරව වර්ෂ ගණනාවක් අත් අඩංගුවේ තබා ගෙන සිටින බව වාර්තා වෙයි. කල් පසු වී අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූ බොහෝ දෙනෙක් නඩු පවත්වා ගෙන යාමට සාක්ෂි ප්‍රමාණවත් නොමැති නිසා නිදහස් කරනු ලබයි.

එල්. ටී. ටී. ඊ. සංවිධානය විසින් ද අරගලය පැවැති කාලපරිච්ඡේදය තුළ දහස් ගණනක් සිරකරුවන් වශයෙන් තමන්ට ප්‍රතිපක්ෂ දෑවිඩ ජාතිකයින් මෙන්ම රජයේ ආරක්ෂක හමුද

---

[1] "Six migrants detained under PTA," *BBC Sinhala.com*, 14 September 2011 http://www.bbc.co.uk/sinhala/news/story/2011/09/printable/110914_boatpeople.shtml, accessed 19 February 2012:

කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය විසින් ශ්‍රී ලංකාවෙන් පලා යාමට තැත් කළ පුද්ගලයින් පිරිසක් රිමාන්ඩ් භාරයට පත් කරන ලදී. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කල්මුනේට ආසන්න මුහුදේ දී දෑවිඩ ජාතිකයින් 44 දෙනෙක් රැගත් බෝට්ටුවක් අත් අඩංගුවට ගත්තේය. මෙම පිරිස ශ්‍රී ලංකා පොලිසියට බාර දෙන ලද අතර ඔවුහු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් කළේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ ඉල්ලීම පරිදි මහේස්ත්‍රාත්වරයා විසින් සය දෙනෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ද, ඉතිරි තිස් හය දෙනා ආගමන හා විගමන පනත යටතේ ද රිමාන්ඩ් කරන ලද්දේය. අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට අනුව ඉහත කී සය දෙනාට විරුද්ධව එල් ටී ටී ඊ සංවිධානය සමග සම්බන්ධතා තිබූ බවට පිළිගත හැකි සඳහන් කළේය. මෙම පිරිස බුස්සට රැඳවුම් කඳවුරේ රඳවා ගෙන විමර්ශන කටයුතු කරන බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තු නිලධාරීන් අධිකරණයට කියා සිටියේය. ශ්‍රී ලංකා නාවික හමුදාව තමන් අත්අඩංගුවට ගත් බෝට්ටුව සංක්‍රමණිකයන් රැගෙන ඕස්ට්‍රේලියාව බලා යාත්‍රා කරමින් සිටි බව ප්‍රකාශ කළේය. අත් අඩංගුවට ගත් පිරිස අතර කාන්තාවන් හා ළමුන් ද සිටියෝය. ළමුන් දෙදෙනකුට මානුෂික හා සානුකම්පික හේතූන් මත ඇප ලබා දෙන ලදී.

සාමාජිකයින්ද, සිංහළ හා මුස්ලිම් සිවිල් වැසියන් ද අත්අඩංගුවට ගත්තේයය. ඔවුන් ගෙන් බහුතරයකට පිටස්තර ලෝකය සමග තොරතුරු හුවමාරු කර ගැනීමට ඉඩක් නොදුන් අතර, දරුණු වධ බන්ධන වලට ලක් කොට අවසානයේදී ඝාතනය කරන ලද්දේය.[2]

ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල නොවන රඳවා තබා ගැනීම් ඇතුළු සියළුම ආකාරයේ මානව හිමිකම් උල්ලංඝණයන් විමර්ශනය නොකිරීමත්, දඩුවම් නොකිරීම හා වරදින් නිදෙස් කිරීමේ වාතාවරණය හා සම්බන්ධය. නීත්‍යානුකූල නොවන රඳවා තබා ගැනීම් නිසා අහිංසක තැනැත්තන් අත්අඩංගුවේ පසු විය හැක; එසේම වංචනික අපරාධකරුවන්ට වගවීමෙන් මඟහැර සිටීමට ද එය හේතුවක් වේ. ශ්‍රී ලංකාවේ අත්අඩංගුවේ රඳවා ගෙන සිටින බොහෝ දෙනෙක් රඳවා ගෙන සිටින්නේ යම්කිසි වරදක් පිළිබඳ පැහැදිලි සාක්ෂි මත නොවන අතරඋ පිළිගත හැකි සාක්ෂි මත නඩු පැවරිය හැකි පිරිස අතලොස්සක් වෙයි. ඔවුන් නීතිය ඉදිරියට නොපමාව ගෙන ආ යුතුය.

ජාත්‍යන්තර නීතියට අනුව අත්තනෝමතික රඳවා ගැනීම් තහනම්ය. " බලහත්කාරයෙන් අත් අඩංගුවට ගැනීමට, රඳවා තැබීමට, පිටුවහල් කිරීමට හෝ කිසිම පුද්ගලයෙකු භාජන නොකළ යුතුය" යනුවෙන් අන්තර් ජාතික මානව හිමිකම් ප්‍රකාශනයේ 9වන වගන්තියේ සඳහන් වේ. අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනිම නීති විරෝධී බව ජාත්‍යන්තර නීති සම්ප්‍රදය විසින් ද පිළි ගනු ලැබේ. මේ නිසා ඕනෑම රටක් ජාත්‍යන්තර ගිවිසුම වලින් බැඳි සිටියත් නැතත් අත්තනෝමතික රඳවා තබා ගැනීමේ නීති විරෝධී ලෙස පිළිගන්නට බැඳී සිටියි. මෙය යුද්ධයක් පවතින අවස්ථාවලට ද එකසේ අදළය.[3]

ශ්‍රී ලංකා බලධාරින් පුද්ගලයන් නීති විරෝධී ක්‍රියාවන් හි නිරත වූයේය යන චෝදනාව මත මාස හා අවුරුදු ගණන් රැඳවුම් භාරයේ තබා ගන්නා අතර, ඒ තැනැත්තන් අධිකරණයක් ඉදිරියට පමුණුවා කඩ කරන ලද්දේ යැයි සැක කරන නීති සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් කිරීමට සැලකිලිමත් නොවේ. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් හි මතය වන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉහත පිළිවෙත සංක්ෂිප්තව " අත්තනෝමතික අත් අඩංගුවට ගැනිම හා රඳවා ගැනිම " ලෙස අර්ථ දැක්විය හැකි බවයි.

ශ්‍රී ලංකාවේ ආයුධ සන්නද්ධ කණ්ඩායම් සාමාජිකයින් අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනිමේ ඉතිහාසය දශක ගණනාවක් ආපස්සට දිව යන්නකි. 1988-1991 කාල පරිච්ඡේදය

---

[2] 1993 දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් පළකළ වාර්තාවකට අනුව 2,000 කට ආසන්න සංඛ්‍යාවක් එල් ටි ටි ඊ අත්අඩංගුවේ පසු වූ බවත් " එල් ටි ටි ඊ සංවිධානය විසින් මෙම රැදවියන් ගේ ඥාතීන්ට හෝ හිතවතුන්ට දැනුම් දීමක් නොකළා පමණක් නොව බොහෝ දෙනෙකු වධහිංසා වලට ලක් කිරීමෙන් පසු ඝාතනය කරන ලදැයි වාර්තා කරයි. එල් ටි ටි ඊ සංවිධානයද කප්පම් ගැනිම පිණිස පැහැර ගැනිම් කළේය. බලන්න:Amnesty International, *Sri Lanka: "An assessment of the human rights situation*" (Index: ASA 37/001/1993) http://www.amnesty.org/en/library/info/ASA37/001/1993/en. See also, Amnesty International, *Sri Lanka: "A Climate of Fear in the East*" (ASA 37/001/2006) http://www.amnesty.org/en/library/asset/ASA37/001/2006/en/2ad73d22-d46f-11dd-8743-d305bea2b2c7/asa370012006en.pdf.

[3] ජාත්‍යන්තර නීතිය කිසිම ආණ්ඩුවකට මුළු රටේම සමස්ත ජනතාවටම බලපාන ජාතික හදිසි අවස්ථාවකදී හැර පුද්ගල නිදහසට ඇති අයිතියට සීමාවන් පැනවීමට අවසර නොදෙන අතර එබඳු අවස්ථා ඉතාමත් කෙටි කාලයකට පමණක් සීමා කරන මෙන් ද අවධාරණය කර තිබේ. UN Human Rights Committee, " General Comment 29, states of Emergency (article 4) U.N.Doc.CCPR /C/21/Rev.1/Add.11 (2011)

තුල ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයින් යැයි සැක කරන ලද පුද්ගලයින් 5000කට ආසන්න පිරිසක් දේශපාලන සිරකරුවන් වශයෙන් අත්තනෝමතික ලෙස රැඳවුම් කඳවුරු, බන්ධනාගාර, පුනරුත්ථාපන කඳවුරු හා පොලිස් අත්අඩංගුවේ රඳවා ගෙන ඇති බව 1993 දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසින් පළ කළ වාර්තාවකින් හෙළිදරව් කරන ලදි.[4] 1983 සිට එල්. ටි. ටි. ඊ. සංවිධානය සමග ආයුධ සන්නද්ධ අරගලය නැවත උත්සන්න වූ අවස්ථාවේ, එල්. ටි. ටි. ඊ. සමග සම්බන්ධතා ඇතැයි සැකකරන ලද තැනැත්තන් දහස් ගණනක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත[5] හා මහජන ආරක්ෂක පණත[6] යටතේ පනවන ලද හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවට ගෙන නඩු විභාගයකින් තොරව රඳවා ගන්නා ලදි. එසේ රඳවා තබා ගැනීමට හේතුව ලෙස දක්වන ලද්දේ එක්කෝ වැඩිදුරටත් පරීක්ෂණ පැවැත්වීම එසේත් නැත්නම් බුද්ධි අංශ හා ආරක්ෂ අංශ විසින් තවදුරටත් ප්‍රශ්න කිරීම වශයෙනි.[7]

ශ්‍රී ලංකාව 2011 අගෝස්තු මස 30 වන දින එතෙක් 1971[8] සිට ක්‍රියාත්මකව පැවති හදිසි නීති රෙගුලාසි ඉවත් කරන ලද නමුත් ඒ සමාන වගන්නති අඩංගුව තිබෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත එලෙසම පවතින්නට ඉඩ හරින ලදි.[9] හදිසි නීති රෙගුලාසි අහෝසි කිරීමට සමාන්තරවම බලධාරීන් විසින් නව රෙගුලාසි ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ හඳුන්වා දුන්නේය. මේ අනුව එල්. ටි. ටි. ඊ. සංවිධානය තවදුරටත් තහනම් සංවිධානයක් වූ අතරඋ එල්. ටි. ටි. ඊ. සම්බන්ධකම් ඇතැයි සැක කරනු ලබන පුද්ගලයින් තවදුරටත් චෝදනා ඉදිරිපත් කිරීමකින් හෝ නඩු විභාගයකින් තොරව රඳවා තබා ගැනීමට ඉඩ ලැබින.[10] මාස හෝ අවුරුදු ගණනාවකට පසු රැඳවුම් භාරයෙන් නිදහස් කරන ලද පුද්ගලයන් නොකඩවාම ආරක්ෂක අංශවල පරීක්ෂාවට ඉලක්ක වීය. ඔවුන්ට නොකඩවාම ඇතැම් විට සතියකට වරක් එසේත නැත්නම් මසකට වරක් ආසන්න පොලිස් ස්ථානයට වාර්තා කිරීමට නියම වි තිබුනි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව උතුරු පළාතේ ඉතා විශාල හමුදා

---

[4] Amnesty International , Sri Lanka: " An assessment of the human rights situation" (Index: ASA 37/001/1993) http://www.amnesty.org/en/library/info/ASA37/001/1993/en

[5] Prevention of Terrorism Act No 48 of 1979

[6] Public Security Ordinance No 25 of 1947 (PSO) 19June 1947

[7] උදාහරණයක් වශයෙන් 2002 සටන් විරාමය ප්‍රකාශයට පත් කිරීමත් සමඟම ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා ගෙන සිටි 1500-2000 අතර පිරිසක් දින කිහිපයක් තුළ නිදහස් කරන ලදි. මාධ්‍ය වාර්තාවලට අනුව 2000 වසරේ දී පමණක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා හදිසි නීති රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගනු ලැබූ සංඛ්‍යාව 13000 ක් පමණ විය. 2009 මැද භාගය වන විට හදිසි නීති රෙගුලාසි යටතේ එල් ටි ටි ඊ සමඟ සම්බන්ධතා ඇතැයි සැක කරන ලද පුද්ගලයන් 12000 ආසන්න සංඛ්‍යාවක් පුනරුත්ථාපන කඳවුරු තුළ රඳවා සිටියේය. තවත් 2000 කට ආසන්න පිරිසක් එක්කෝ පොලිස් අත් අඩංගුවේ එසේත් නැත්නම් රිමාන්ඩ් බන්ධනාගාර හෝ රැඳවුම් කඳවුරු තුළ රඳවා සිටියෝය.

[8] දශක හතරක කාලය ශ්‍රී ලංකාව හදිසි නීතිය ක්‍රියාත්මකව නොපැවතුනේ පස් අවුරුද්දක් කරම් කෙටි කාලයක් පමණි. ඒ හැර 1971 මාර්තු මස සිට 1977 පෙබරවාරි දක්වා ද, 1981 අගෝස්තු සිට 1982 ජනවාරි දක්වාද, 1982 ජූලි 30 දින සිට 1982 අගෝස්තු 30 දක්වාද, 1982 ඔක්තෝබර් 20 වන දින සිට 1983 ජනවාරි 20 දක්වාද, 1983 මැයි 18 දින සිට 1989 ජනවාරි 11 දින දක්වාද, 1989 ජුනි මස 20වන දින සිට 1994 සැප්තැම්බර්මස 4 වන දින දක්වාද, 1998 අගෝස්තු 4වන දින සිට 2001 ජූලි 4 දින දක්වාද, 2003 නොවැම්බර් 5 දින සිට 2003 නොවැම්බර් 06 දින දක්වාද, 2005 අගෝස්තු 12වන සිට 2011 අගොස්තු 30 වන දින දක්වාද ශ්‍රී ලංකාවේ හදිසි නීතිය ක්‍රියාත්මකව පැවතින.

[9] වැරදි හා දඩුවම්, පාපෝච්චාරණ පිළි ගැනීම, හදිසි වැටලීම් හා අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා රැදවියන්ට සීමා පැනවීම, තොරතුරු පළ කිරීම වැනි කාරණා සම්බන්ධයෙන් අහෝසි කරනු ලැබූ හදිසි නීති රෙගුලාසි වල අඩංගු වූ කාරණාම ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතෙහි ද අඩංගුව තිබින.

[10] ත්‍රස්තවාදය වැළැක්වීමේ රෙගුලාසි (රැදවියන් හා රිමාන්ඩ් සිරකරුවන්) අංක 4 2011

භටයන් සංඛ්‍යාවක් අනුයුක්ත කොට තිබේ.[11] රජය ආරක්ෂක හමුදා හා විශේෂ කාර්ය බලකාය සිවිල් පරිපාලනය පිණිස යොදවා ගෙන තිබෙන්නේ මහජන ආරක්ෂක පණතේ විධිවිධාන යටතේය.[12] විශේෂ කාර්ය බලකාය ත්‍රස්තවාදය මර්දනය කිරීම පිණිස පිහිටුවන ලද විශේෂ බලකායක් වන අතරඋ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ ඉතිහාසයක් තිබෙන හමුදා කණ්ඩායකි.[13]

මානව හිමිකම් ආරක්ෂකයෙක් රැදවුම් භාරයෙන් නිදහස් කළ පසු බලහත්කාරයෙන් අතුරුදහන් වෙයි.

මාස තුනක් කොළඹ පොලිස් අත් අඩංගුවේ සිටි සි එච් ආර් ඩි හෙවත් මානව හිමිකම් හා සංවර්ධන කේන්ද්‍රය නම් සංවිධානයේ ව්‍යාපෘති කළමනාකාරවරයා වූ ස්ටීවන් සුන්තරාජා 2009 මැයි මස අත් අඩංගුවෙන් නිදහස් කළ පසු යුද්ධ ඇඳුම් ඇද ගත් ආයුධ සන්නද්ධ කණ්ඩායමක් විසින් පැහැර ගන්නා ලදි. මේ මොහොත දක්වාම (2011 මාර්තු) මේ බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳ කිසිදු තොරතුරක් වාර්තා නොවන අතරඋ කරන ලද පරීක්ෂණයන්හි කිසිදු ප්‍රගතියක් ද මේ දක්වා වාර්තා නොවේ.

සි එච් ආර් ඩි සංවිධානයට අනුව සුන්තරාජා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් කොල්ලුපිටියේ සිය කාර්යාලය ඉදිරිපිට දී 2009 පෙබරවාරි 12 දින අත් අඩංගුවට ගෙන 2009 මැයි මස 7 දින දක්වා රඳවා තබා ගැනින. ඔහු නිදහස් කරන ලෙස ඉල්ලා ගොනු කරන ලද මූලික අයිතිවාසකම් පෙත්සම (අංක SCFR 265/2009) තවමත් පොරොත්තු ලේඛනයේ ඇතුලත්ව පවතී. ඔහු ගේ බිරිඳ විසින් බලධාරින්ට අවස්ථා කිහිපයකම කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පසු සුන්තරාජා 2009 මැයි මස 07 දින කොළඹ මහේස්ත්‍රාත්

---

[11] " සිවිල් යුද්ධය අවසන් වී වර්ෂ තුනක් ගත වී ඇතත් උතුරු අර්ධද්වීපයෙහි එක් සිවිල් වැසියෙකුට ආරක්ෂ භටයින් 11 බැගින් අනුයක්ත කර ඇත. උතුරෙහි සිවිල් වැසියන් 600,000 පමණ පදිංචි වී සිටින අතර 40-50,000 පමණ ආරක්ෂක භට පිරිසක් උතුරෙහි සිටිති." මෙලනි මානෙල් පෙරේරා- " tamil refugees and war widows in militarised jaffna" 2011 Dec 14 asia news , http://www.asianews.it/news-en/Tamil-refugees-and-war-widows-in-militarised-Jaffna-23440.html, accessed 19 February 2012.

[12] ශ්‍රී ලංකා මහජන ආරක්ෂක ආඥාව 1947 අංක 25 3 වන කොටස 12 (1)

[13] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය 1985 සිට විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව ප්‍රලේඛනය කර ඇත. (විශේෂ කාර්ය බලකාය විසින් දැඩිඩ පුද්ගලයින් 63 දෙනෙකු අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ මහා ලේකම් විසින් එකල ජනාධිපතිව සිටි ජේ.ආර්. ජයවර්ධන මහතාට 1985 ජූනි 7 වන දින යැවූ ලිපිය.) නැගෙනහිර පළාතේ 1995 අප්‍රියෙල් හා 1996 මැයි මාසය අතර පුද්ගලයන් 8 දෙනෙකු අතුරුදහන් කිරීම සම්බන්ධයෙන්ද, 1995 දැඩිඩ තරුණයන් 21 දෙනෙකු ඝාතනය කොට කොළඹට නුදුරු බොල්ගොඩ ඔයෙහි පා කර හැරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ විශේෂ කාර්ය බලකායේ සාමාජිකයින්ට නඩු පවරනු ලැබූ නමුත්, පසුව අභිචෝදනා ඉදිරිපත් කළ නීතීඥවරයා අධිකරණයේ පෙනී නොසිටීම නිසා විසී කරන ලද නඩුව සම්බන්ධයෙන් ද, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් ප්‍රලේඛනය කර තිබේ. 2006 ජනවාරි මස ත්‍රිකුණාමලේ දී සමූල ඝාතනය කරන ලද ආකාරයෙන් ඝාතනය කරන ලද දැඩිඩ ශිෂ්‍යයන් පස් දෙනා සම්බන්ධයෙන් ද විශේෂ කාර්ය බලකාය වගවිය යුතු බවට විශ්වාස කරනු ලැබේ. 2010 හා 2011 දී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්, එරාවුර් හා කල්මුනේ ප්‍රදේශයේ දී 2008 සිදුවූ බලහත්කාර අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකායට චෝදනා කරන ලදි. 2010 ඔක්තෝබර් 9වන දින මඩකලපුව දිස්ත්‍රික්කයේදි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකාරියක් (අංක 8) තම සැමියා 2009 පෙබරවාරි 19 දින කුඹරෙහි වැඩ කරමින් සිටිය දී විශේෂ කාර්ය බලකාය විසින් පැහැර ගෙන ගිය බව කියා සිටි ඇය ඊට වගකිව යුතු නිලධාරියා ගේ නම කොමිෂන් සභාව ඉදිරියේ සඳහන් කරන ලදි.

අධිකරණයට ඉදිරිපත් කළ අතරෙ සවස 3.30 පමණ පොලිස් අත්අඩංගුවෙන් නිදහස් කරන ලදි.

සිය නිතිඥ කේ. එස්. රත්නවේල් සමග ස්ටීවන් සුන්තරාජා සහ ඔහුගේ බිරිඳ උසාවියේ සිට කොල්ලුපිටියට මෝටර් රථයකින් ගමන් කරමින් සිටි අතරෙ මෝටර් සයිකලයක නැඟුන දෙදෙනකු තමන් පසු පස හඹා එන බව ඔවුන් නිරීක්ෂණය කළෝය. මෙම තැනැත්තන් දෙදෙනා ස්ටීවන් පොලිස් අත්අඩංගුවේ පසු වෙද්දී ඔහු රැදවුම් භාරයෙන් නිදහස් කිරීමට විරුද්ධ වූ සිවිල් ඇඳුමෙන් සැරසුන බුද්ධි අංශයේ නිලධාරීන් දෙදෙනකු බව හඳුනා ගැනීමට ඔවුන්ට වැඩි වේලාවක් ගත නොවීය. මෝටර් සයිකලයේ නැගුන දෙදෙනා තමන් ඇතුළු පිරිස කොල්ලුපිටියේ සි. එච්. ආර්. ඩි. කාර්යාලයට ළඟා වනතුරුම තමන් පසුපසින් පැමිණි බව මෝටර් රථයේ සිටින පිරිසට මේ වන විට ඒත්තු ගොස් තිබිණ.

ස්ටීවන් සිය බිරිඳ හා දරුවන් සමග සි. එච්. ආර්. ඩි. කාර්යාලයෙන් එදින සවස 6.00 ටපමණ පිටත් වී කොල්ලුපිටිය පොලිස් සථානයට ගොස් සිය ජංගම දුරකථනය, ගුවන් ගමන් බලපත්‍රය හා බැංකු ඉතිරි කිරිමේ ගිනුම් පොත ලබා ගෙන තිබුණි. මෙම කණ්ඩායම කොළඹ ටවුන් හෝල් මංසන්ධියට ළඟා වනවාත් සමග මෝටර් සයිකලයකින් පැමිණි දෙදෙනකු විසින් මාර්ගය අහුරනවාත් සමග සුදු වෑන් රථයකින් බට පිරිසක් විසින් වෑන් රියෙහි සිටි සුන්තරාජා පැහැර ගෙන තිබුණි.. වෑන් රථයෙන් පැමිණි පිරිසට හතර දෙනෙක් හෝ පස් දෙනෙක් ඇතුළත් වූ බවත්ෙ ඔවුහු යුද්ධ හමුදු ඇඳුමට සමාන ඇඳුම් වලින් සැරසී සිටි බවත්, පිස්තෝල වලින් සන්නද්ධව සිටි බවත්ෙ පසුව වාර්තා වූයේය. සුන්තිරාජා ඇතුළු පිරිස ගමන් කරමින් සිටි වෑන් රථයේ යතුර ද ඔවුන් විසින් පැහැර ගෙන තිබුණි.

පසුව කුරුඳුවත්ත පොලිසිය විසින් පැමිණ වාහනය හා කණ්ඩායම පොලිසියට රැගෙන ගොස් ප්‍රකාශ සටහන් කර ගෙන තිබුණි. සි.ආර්.එච්.ඩි. සංවිධානයට අනුව මෙම පැහැර ගැනිම සම්බන්ධයෙන් විදේශ කටයුතු පිලිබඳ අමාත්‍යාංශයේ ලේකම් පාලිත කොහොන මහතා විසින් ඔහු පැහැර ගත්තා නොව පොලිසිය විසින් අත්අඩංගුවට ගත් බවත්ෙ යථා කාලයේ දී අධිකරණයට ඉදිරිපත් කරන බව ප්‍රකාශ කර තිබුණි.[14] මෙම සිදුවිම සිදු වී තුන් වසරක් ගෙවී ගොස් ඇතැත්, මේ වන තුරු නිල වශයෙන් ස්ටීවන් සුන්නතිරාජා අත්අඩංගුවේ පසු වන බව හෝ ඔහු ජීවතුන් අතරෙ සිටින නොසිටින බව ඔහු ගේ පවුලේ උදවියට වාර්තා කිරිමක් කර නැත.

ශ්‍රී ලංකාවේ පොලිසිය, ආරක්ෂක හමුදු (විශේෂයෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදුව හා ශ්‍රී ලංකා නාවික හමුදුව) හා ඔවුන්ට අනුබද්ධිත බුද්ධි අංශ සිරකරුවන් රඳවා ගෙන ප්‍රශ්න කරයි. ආයුධ සන්නද්ධ දුවිඩ හමුදු, ශ්‍රී ලංකා ආණ්ඩුව සමග අත්වැල් බැඳ ගෙන රජයේ හමුදුවේ අවසරය හා උවමනාව පිට පුද්ගලයින් සිරභාරයට රඳවා තබා ගැනීම් හා ප්‍රශ්න කිරිම් කරන බව ප්‍රසිද්ධ කාරණයකි. මේ සෑම

[14] Centre for Human Rights and Developmnet , " Arrest and abduction of Stephen Suntharaj-No progress in investigations" htttp: www.chrdsrilanka.org/PAGES/newsupdates6.html. accessed 2012 පෙබරවාරි 12

ආයතනක්ම රැඳවියන් රඳවා තබා ගන්නා අතරඋ ඔවුන්ට සිය ඥාතීන් හා මිත්‍රයන් සමග සංදේශනයට ඉඩක් නොදෙන බවටත්, චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමක් නොකරන බවටත් චෝදනා ඉදිරිපත් වේ. නිදහස් කරනු ලැබූ ඇතැම් රැඳවියන්ට එසේ නිදහස් කිරීමට පෙර, තමන් රඳවා සිටි කාලය පිළිබඳ තොරතුරු විශේෂයෙන්ම මානව හිමිකම් සංවිධානවලට ලබා දීමෙන් වලකින ලෙසටත්, එසේ නොකළහොත් නැවත අත් අඩංගුවට ගැනීම හෝ මරණය යන දෙකෙන් එකක් සිදුවිය හැකි බවට තර්ජනය කරන බවට වාර්තා වේ. තවත් සමහරුන්ට නිදහස් කිරීම පිණිස වෙනත් ආකාරයේ යෝජනා ඉදිරිපත් කරයි.. ඒවා අතරඋ තමන් විසින් බලධාරීන්ට අහිතකර ලෙස බලපෑ ප්‍රකාශ ප්‍රතික්ෂේප කිරීම, වෙනත් පුද්ගලයින් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීම ආදිය දක්නට ලැබේ. ආරක්ෂක හමුදා, සාමාජිකයින්, රැඳවියන් රඳවා තබා ගන්නා අභිරහස් ස්ථාන තිබෙන අතර, එම ස්ථානයන්හි දී ඔවුන් ප්‍රශ්න කිරීම හා වධහිංසවන්ට ලක් කිරීම කරනු ලබයි. මෙයින් ඇතැම් දෙනෙක් මිය යනතෙක් වධහිංසා වන්ට භාජනය කරන බවත්, සමහරු අධිකරණ බාහ්‍ය ඝාතනයන්ට ගොදුරු වන බවත්උ වාර්තා වේ. ආරක්ෂක හමුදාවන්ට අවශ්‍ය සිටින එහෙත් අත්අඩංගුවට ගනු නොලැබූ තැනැත්තන් ගේ පවුලේ උදවිය අත් අඩංගුවට ගෙන ප්‍රශ්න කරන බවත්උ සමහර විට ඔවුන් ද ඝාතනය කිරීම හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් කරන බවටත් වාර්තා වේ.

රජයේ අත්තනෝමතික රඳවා තබා ගැනීමට එරෙහිව ක්‍රියාකරන්නන්ද අඩන්තේට්ටම් වලට, පහර දීම් වලට හා අත්තනෝමතික රඳවා තබා ගැනීම් වලට ඉලක්ක වේ. 2011 දෙසැම්බර් 9 දින යාපනයේ චෝදනායකින් තොරව රඳවා ගෙන සිටින දවඩ රැඳවියන් ගේ පවුල් වල සාමාජිකයින් ගේ රැස්වීමක් සංවිධානය කරමින් සිටි ක්‍රියාධරයන් දෙදෙනකු බලහත්කාර අතුරුදහන් කරන ලදි.[15] ඔවුන් ගේ මිත්‍රයින්ට මෙම පැහැර ගැනීම කරන ලද්දේ යුද්ධ හමුදාව විසින් බවත්, ඔවුන් දෙදෙනා යම්කිසි රහසිගත ස්ථානයක සංදේශනයකින් තොර රඳවා ඇතැයි විශ්වාස කරනු ලබයි.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය, යම්කිසි පුද්ගලයෙක් මහජන සාමයට හා ආරක්ෂාවට තර්ජනයක් යැයි කියමින් ප්‍රමාණවත් සාක්ෂි නොමැතිව රඳවා තබා ගැනීම ඇතුළු සෑම ආකාරයකම රඳවා තබා ගැනීම් වලට විරුද්ධය. යුක්තිය පසඳලීම පිණිස ව්‍යවස්ථාපිත නීතියේ දක්වා ඇති පුද්ගලයින් ගේ නිදහස අරක්ෂා කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටි නොසලකා හැරීම පිළිගත නොහැකිය. අධිකරණයකට ඉදිරිපත් නොකොට පුද්ගලයින් රඳවා ගැනීම අධිකරණයක් මඟින් සිදු කරන යුක්තිය පසඳලීමකට ආදේශ කළ නොහැක. ඇත්ත වශයෙන්ම පොලීසියට යම් සැකකරුවෙක් නීත්‍යානුකූල නොවන කටයුතු වල නියැලී සිටින බවට සැකයක් ඇතැත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂි නැත්නම් ඒ පුද්ගලයා පරිපාලනමය රඳවා ගැනීමට භාජනය කළ නොහැක.

---

[15] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්- Sri lanka: " Fears for missing Sri Lankan activists" (Index: ASA 37/018/2011) http;//www.amnesty.org/en/library/asset/ASA37/019/2011/en http://www.amnesty.org/en/library/asset/ASA37/019/2011/en/8a2e72bb-1951-4202-8ceb-27e001422dc9/asa370192011en.html.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය නීති, ආඥාවන් හා රෙගුලාසි මඟින් බලධාරීන්ට පුද්ගලයින් අධිකරණයකට ඉදිරිපත් නොකොට, පරිපාලනයමය වශයෙන් රඳවා තබා ගැනීමට තිබෙන අවසරය අහෝසි කළ යුතු යැයි ඉල්ලා සිටින අතර, දැනට අත් අඩංගුවේ සිටින චෝදනා ඉදිරිපත් කොට අන්තර් ජාතික වශයෙන් පිළිගත් අධිකරණයකට ඉදිරිපත් කරන මෙන්ද, අනෙක් සියළුම රැඳවියන් වහාම නිදහස් කරන මෙන් ද ඉල්ලා සිටියි.

මෙම වාර්තාව සැකසීම පිණිස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය කරනු ලැබූ අධ්‍යයන්හි දී, නිදහස් කරනු ලැබූ රැඳවියන් මෙන්ම දැනට රඳවා ගෙන සිටින පුද්ගලයන් ගේ ඥාතීන් හා හිතවතුන් සමග ද සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබිණ. නමුත් තමන් බලධාරීන් ගේ පළිගැනීමට ලක් විමට ඉඩ තිබෙන නිසා, ඔවුහු සිය අනන්‍යතාවය හෙළිදරව් නොකරන ලෙස ඉල්ලා සිටියෝය. තවද, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත දැනට අධිකරණය හමුවේ පවරා ඇති නඩු සම්බන්ධ ලිපි ගොනු විමර්ශනය කිරීමට අවස්ථාව ලැබුන අතර, ඊට අමතරව නීති පර්යේෂකයින් හා වෙනත් සංවිධාන විසින් රැස් කරන ලද තොරතුරු ද පරිශීලනය කිරීමේ අවස්ථාව ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ලැබුණි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම වාර්තාවට පදනම් කර ගන්නා සිද්ධීන් හා සම්බන්ධ රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් ඔවුහු වැරදිකරුවන් ද එසේ නැත්නම් නිවරදිකරුවන් ද යන්න විනිශ්චය නොකරයි. නමුත් අප අවධාරණය කරන වැදගත් කාරණය නම් සෑම තැනැත්තෙකුටම ජාතික හා අන්තර් ජාතික නීතිය විසින් පිළිගෙන ඇති මානව අයිතිවාසිකම් භුක්ති දිමේ නිදහස තිබිය යුතු බවත්, විශේෂයෙන්ම නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස, කිසිදු තැනැත්තෙකු සිරභාරයට ගැනීම, බන්ධනාගාර ගත කිරීම හෝ අන්‍යාකාරයකින් ශාරීරික අවරෝධනයකට පාත්‍ර නොකිරීමේ නිදහස භුක්ති විඳිමේ අයිති ඇති බවත්ය.

අප විසින් රැස් කරන ලද සිද්ධීන් පරීක්ෂා කිරීමේදී පොදුවේ ඉදිරිපත් කළ හැකි චෝදනා පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

- අත්අඩංගුවට ගැනීම්- සැක කටයුතු පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම පැහැර ගැනීම් විලාශයක් පෙන්නුම් කළ අතර, සිවිල් ඇඳුමෙන් සැරසුන වරෙන්තුවක් නොමැති හඳුනා ගත නොහැකි පුද්ගලයින් විසින් කරනු ලැබින. රඳවා තබා ගැනීම් පිණිස භාවිතා කොට ඇත්තේ නිල නොවන ස්ථානයන්ය. ප්‍රශ්න කිරීම් කරන ලද්දේ අත්අඩංගුවට ගත් ආකාරයෙන්ම සිවිල් ඇඳුමෙන් සැරසුන හඳුනා ගත නොහැකි පුද්ගලයින් විසිනි. බොහෝ රැඳවියන් තමන් අත්අඩංගුවට ගනු ලැබුයේ කවර ආරක්ෂක අංශයක් විසින් ද යන්න වත් තමන් අත්අඩංගුවට ගත් නිලධාරියාගේ නමවත් නොදනී.
- බලධාරින් විසින් ප්‍රශ්න කිරීම සඳහා අවශ්‍යව සිටින පුද්ගලයින් ගේ පවුලේ සාමාජිකයින්ට බොහෝ අවස්ථාවලදී, අවමන් සහගත ලෙස සලකන ලද අතර, තර්ජනය කිරීම් හා රඳවා තබා ගැනීම් වලට ලක් කෙරින.
- බොහෝ දෙනෙක් ඔවුන් අත්අඩංගුවට ගැනීමට හේතු තමන් කොපමණ කාලයක් කවර නීතියක් යටතේ රඳවා තබා ගන්නේද යන්න නිල වශයෙන් දැනුම් නොදෙයි. රැඳවුම් භාරයට ගත්

පුද්ගලයා ගේ ඥාතීන් නීතිය හා ක්‍රියාපටිපාටි පිළිබඳ පරිචයක් නොමැති නිසා බලධාරීන් තවදුරටත් ඔවුන් අපහසුවට පත් කරයි.

- රැඳවියන් සමග ඒ පුද්ගලයාගේ පවුලේ උදවියට සංදේශනයට නිරන්තරයෙන්ම බාධා පමුණුවන ලදි. යම් කිසි තැනැත්තෙක් අත්අඩංගුවට ගත් බවට ඒ තැනැත්තා ගේ පවුලේ උදවියට දැනුම් දීමෙහි විධිමත් ක්‍රියාපටිපාටියක් පෙන්නුම් නොකරන අතර, රැඳවියන් එක් රැඳවුම් මධ්‍යස්ථානයකින් තවත් රැඳවුම් මධ්‍යස්ථානයකට මාරු කිරීම ද එලෙසම අවිධිමත් විය.
- රැඳවියන් අත්අඩංගුවට ගෙන සති මාස ගනන් යන තෙක් නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමට ඉඩ නොදෙයි. මේ නිසා බොහෝ රැඳවියන් තමන් රැඳවුම් භාරයට ගත් පසු තමන්ට නීතීඥ උපදෙස් ලබා ගැනීමට අයිතියක් නැතැයි විශ්වාස කිරීමට ඔවුහු පෙළඹී සිටිති.
- රැඳවියන්ට තමන් රැඳවුම් භාරයට ගැනීම, අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට ඉඩ දී ඇත්තේ ඉතාමත් කලාතුරකිනි. බෙහෝ අධිකරණයන් ගෙන් සිදුවන්නේ රැඳවුම් නියෝගයට සිය මුද්‍රාව තැබීම පමණි.
- රැඳවියන් තමන් වධ හිංසාවලට, කෲර, අමානුෂික අවමන් සහගත සැලකිලිවලට ආරක්ෂක හමුද, රජයේ සමග සහයෝගයෙන් ක්‍රියා කරන අතුරු හමුද පමණක් නොව බන්ධනාගාර නිලධාරීන් මෙන්ම වෙනත් සිරකරුවන් ද විසින් ලක් කරන බවට චෝදනා ඉදිරිපත් කරයි.
- පොලීසිය හා ආරක්ෂක අංශ නිලධාරීන්, රැඳවියන් අල්ලස් මත මුද හැරි අවස්ථා වාර්තා වේ.
- බලධාරීන් විසින් නිදහස් කළ පුද්ගලයින් නොකඩවාම යුද්ධ හමුදාවේ නිත්‍ය පරීක්ෂාවට සමහර විට නැවත අත්අඩංගුවට ගැනීමට හා අඩන්තේට්ටම් වලට භාජනය වෙයි. සමහර රැඳවියන්ට තමන්ට විඳින්නට සිදු වූ දුක් ගැහට පිළිබඳ කිසිවක් හෙළිදරව් නොකරන මෙන් අවවාද කළ අවස්ථා වාර්තා වේ. ශ්‍රී ලංකාවෙන් පිටමංව සිටින වින්දිතයින් බොහෝ දෙනෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට කියා සිටියේ තමන් මුහුණ දුන් සිද්ධීන් පිළිබඳව ප්‍රසිද්ධියේ කථා කළහොත් තවමත් ශ්‍රී ලංකාවේ ජීවත් වන සිය ඥාතීන් අනතුරට පත් විය හැකි බවයි.

3. අත්තනෝමතිකව රඳවා තබා ගැනීම: නීතීමය රාමුව:

උතුරේ යුද්ධය නීමාවිමෙන් පසු සිවිල් බලධාරීන්ට "බාරවන තැනැත්තන්" ඔවුන්ටම රඳවා තබා ගැනීමට ශ්‍රී ලංකාවේ බලපවත්වන හදිසි නීතිය හා ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති මඟින් අවසර ලැබෙනවා පමණක් නොව, මෙම නීති උල්ලංඝණය කළ බවට සැක කරන තැනැත්තන්, මෙම බලධාරීන් විසින්

ක්‍රියාත්මක කරන පුනරුත්ථාපන වැඩ සටහන් වලට සහභාගී වීම ද අනිවාර්ය ද වේ[16]. මෙම තාවකාලික හදිසි අවස්ථා රෙගුලාසි 2011 අගෝස්තු මස හදිසි නීතිය අහෝසිවීමත් සමගම අහෝසි විය. නමුත් සිවිල් බලධාරීන් තවදුරටත් ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ නීතිය යටතේ (1979) මෙම රැඳවියන් සිය අත්අඩංගුවේ තබා ගෙන සිටිති. අතීතයේදීත්, විවිධ අවස්ථාවලදි අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් රැඳවුම් භාරයේ තබා ගැනීමට මෙම සිවිල් නීති උපයෝගි කර ගන්නා ලදී. මෙම නීතිඥානුකූල නෛතිකරාමුව ගැටුමක් පවතින අවස්ථා වන්හිදී සාධාරණීයකරණය කළ හැකි වුවත් මෙම නීති සාම කාල පරිච්ඡේදයකට නොගැලපෙයි. 2009 දී බලධාරීන් විසින් මෙම 22 වන වගන්තිය තවදුරටත් පුළුල් කරමින් " 12,000 ආසන්න යුද්ධය අවසාන අදිරයේ දී එක්කෝ රජයට බාර වූ හෝ යටත් වූ හිටපු එල්. ටී. ටී. ඊ. සාමාජිකයින් පුනරුත්ථාපනය හා නැවත සමාජගත කිරීම පිණිස රඳවා තබා ගැනීමට " පාවිච්චි කරන ලදී.[17]

තමන් රඳවා ගෙන සිටින්නේ කවර නීති හා රෙගුලාසි යටතේ ද යන්න තමන්ට සෑම විටම අවිනිශ්චිත වූ බවත්, තමන් ගේ රැඳවුම් කාලය දිර්ඝ කිරීම පිණිස නීති හා රෙගුලාසි එකකට වැඩි සංඛ්‍යාවක් යොදා ගත් බවත්, හිටපු රැඳවියන් හා වර්තමාන රැඳවියන් ගේ ඥාතීන් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත ලබා දුන් ප්‍රකාශයින් හී සඳහන් කර තිබේ. නිදර්ශනයක් වශයෙන් 2011 මාර්තු මස මහත් ප්‍රසිද්ධියක් දෙමින් බුස්සේ කඳවුරින් නිදහස් කරන ලද හිටපු එල්. ටී. ටී. ඊ. සාමාජිකයින් 118 දෙනා, ඇත්ත වශයෙන්ම එක් රජයේ ආයතනයක සිට වෙනත් රාජ්‍ය ආයතනයකට ඔවුන් මාරු කිරීමක් පමණි. මෙම හිටපු එල්. ටී. ටී. ඊ. සාමාජික සාමාජිකවන් මුල් අවස්ථාවේදී පොලිස් ත්‍රස්තවාදී මර්දන ඒකකය යටතේ සිටි අතර, පසුව වවුනියාවේ පුතෝටම් නැමැති රැඳවුම් කඳවුරුට මාරු කරනු ලැබ එහි නිසි චෝදනා පත්‍රයක් නොලබා රැඳවුම් භාරයේ සිටි තැනැත්තන්ය.

2011 මැයි මාසයේදී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ශ්‍රී ලංකාවේ බන්ධනාගාර කොමසාරිස්වරයාට ලිපියක් එවමින් බන්ධනාගාර දෙපාර්තුමේන්තුව යටතේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ හා හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා තබා ඇති පුද්ගලයින් ගේ සංඛ්‍යාව පිළිබඳ දත්ත ඉල්ලා සිටි නමුත් මේ දක්වාද (2012 මාර්තු අග) ඊට පිළිතුරුක් ලබා දී නොමැත.

2011 අගොස්තු මස 29 දින ජනාධිපතිවරයා විසින් හදිසි නීති රෙගුලාසි අහෝසි කිරීමට පැය විසිහතරකට පෙර ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ නව රෙගුලාසි මාලාවක් ප්‍රකාශයට පත් කරන ලදි. ඒ අනුව හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා සිටින පුද්ගලයින්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ නව රෙගුලාසි නිකුත් කරන තෙක් තව දින 30කට රඳවා තබා ගැනීමට ඉඩ සලසන ලදි. රජයේ ප්‍රකාශයටකට අනුව 2011 සැප්තැම්බර් 1 ද සිට අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් හෝ රඳවා තබනු ලබන තැනැත්තන් සම්බන්ධයෙන් එක්කෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ හෝ අපරාධ යුක්ති විධිවිධාන පණත යටතේ ක්‍රියාකරන බව කියා සිටියේය.

---

[16] 2005 අගොස්තු මස 13 දින අංක 1405/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ කලින් කල සංශෝධිත, මහජන ආරක්ෂක ආඥා පනතේ 2අ වගන්තිය ප්‍රකාර බලාත්මකව පවතින බවට සලකනු ලබන, 2005 අංක 01 දරන හදිසි අවස්ථා (විශේෂ විධිවිධාන හා බලතල) නියෝග, එහි 22 වැනි නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබීය. ඒ අනුව "භාර වන්නා" යන්න නිර්වචනය කරන ලද්දේ, පුපුරණ දව්‍ය පනත, 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත, තුවක්කු ආඥා පනත, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනත හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය, VII වැනි පරිච්ඡේදය හෝ VIII වැනි පරිච්ඡේදය හෝ යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට බියෙන් යම් පොලිස් නිලධරයකුට, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයකුට, යම් රජයේ නිලධරයකුට හෝ ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් බලය පවරන ලද යම් වෙනත් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ භාරවන (මෙහි මින් මතු භාරවන්නා යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට ඔහු ස්වේච්ඡාවෙන් භාරවන බවට වූ ලිඛිත ප්‍රකාශයක් නිලධරයාට හෝ ඒ වෙනුවෙන් බලයලත් තැනැත්තාට දෙන ලද තැනැත්තා: 2009 මැයි මාසයේ දී බලධාරීන් මෙම රෙගුලාසි අනුව යමින් එල්.ටී.ටී.ඊ සාමාජිකයින් යැයි සැකකරන තැනැත්තන් 12,000 කට ආසන්න ප්‍රමාණයක් සිය රැඳවුම් භාරයට ගන්නා ලදී.

[17] පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙබ් අඩවිය:http://www.bcgr.gov.lk/news.php?id=108

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ 27 වන වගන්තියට අනුව ප්‍රකාශයට පත් කරන ලද නව රෙගුලාසි මඟින් හදිසි නීතිය අහෝසි වීම නිසා අත් අඩංගුවේ හෝ රඳවා ගෙන සිටින තැනැත්තන් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කර තිබුනි.

1. හදිසි නීතිය යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගෙන සිටින පුද්ගලයින් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කොට සැකකරු තවදුරටත් අත්අඩංගුවේ හෝ රඳවා තබා ගැනීම පිණිස අපරාධ විධිවිධාන පණත යටතේ අවසර ලබා ගත යුතුය.
2. 2011 අගෝස්තු 30 වන දින සිට 30ක් ඇතුළත යම් පුද්ගලයෙකු මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වෙයි නම් හෝ මහේස්ත්‍රාත්වරයෙක් ඒ පුද්ගලයා අපරාධ විධිවිධාන පණත යටතේ රිමාන්ඩ් භාරයට පත් කිරීමට හෝ රඳවා තැබීමට අසමත් වෙයි නම් ඒ පුද්ගලයා නිදහස් කළ යුතුය.
3. රඳවා තබා ගැනීමේ නියෝගය නිකුත් කර ඇත්තේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත දෙවන කොටස වන විමර්ශන යටතේ හෝ තෙවන කොටස වන රඳවා තබා ගැනීම හා සීමාවන් පැණවීම යන කොටස යටතේ නම් රැඳවියා ඇප පණතේ කොන්දේසි යටතේ නිදහස් නොකළ යුතුය.
4. යම් කිසි පුද්ගලයෙක් අහෝසි වූ හදිසි නීතිය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු විසින් රිමාන්ඩ් භාරයට පත් කරන ලද තැනැත්තෙක් වෙයි නම් ඒ පුද්ගලයා මින් ඉදිරියට ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ රිමාන්ඩ් භාරයට පත් කළ තැනැත්තෙක් වශයෙන් සැලකිය යුතුය.[18] ශ්‍රී ලංකාවේ මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාවට ද පිළිතුරු සෙවීමට තුඩු දෙන බරපතළ ප්‍රශ්නයක් නම් 2011 සැප්තැම්බර් 1 වනදායින් පසුව ශ්‍රී ලංකාවේ හදිසි නීතිය යටතේ අත්අඩංගුවේ හා රඳවා තබා ගෙන සිටි තැනැත්තන්ට කුමක් වුයේ ද යන්නයි. පළවන මාධ්‍ය වාර්තා හා ශ්‍රී ලංකාවේ නීතිඥයින් සමග ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් කරන ලද සාකච්ඡාවන්හි දී සැලකිල්ලට යොමු වූ කාරණයක් නම් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන් නිදහස් කරන බවට හෝ එසේ නැත්නම් නඩු පවරන බවට දිගින් දිගටම රජය විසින් දෙන ලද පොරොන්දුව ව්‍යාජ එකක් බවත්, රැඳවුම් භාරයේ පසුවන පුද්ගලයින් බොහොමයක් අතරමංව සිටින බවත්ය. හදිසි නීති රෙගුලාසි යටතේ අත් අඩංගුවේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තන් ගේ පොදු නාමලේඛනයක් නඩත්තු නොකළ නිසා හදිසි නීතිය අහෝසි වීමෙන් පසු ඒ පුද්ගලයින්ට සිදු වුයේ කුමක්දැයි පැහැදිලි කිරීම ඉතාමත් දුෂ්කර බව පෙනී යයි. එපමණක් නොව ඔවුන් කවර නීතියක් යටතේ අත්අඩංගුවේ, එසේ නැත්නම් රඳවා තබා ගෙන සිටි දැයි කිසිවකුට කිව නොහැකිය.

   එල්. ටී. ටී. ඊ. සංවිධානය සමග යම් සම්බන්ධතාවයක් තිබීම හෝ සමාගමයක් තිබීමේ හේතුවෙන් රජයට භාර වූ දහස් සංඛ්‍යාත පුද්ගලයින් මෙන්ම ඉහත කී කාරණය මතම රජයේ හමුදා විසින් අත් අඩංගුවට ගත් පුද්ගලයින්ද පුනරුත්ථාපන කඳවුරු තුළ රඳවා තබා ගන්නා ලද්දේ හදිසි නීතිය හදිසි නීතිය යටතේය[19]. මෙම රැඳවුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් අධිකරණයට මැදිහත් වීමේ අධිකාරියක් නොවීය. ඇත්ත වශයෙන්ම මේ අවස්ථාවේ අධිකරණයේ භූමිකාව වී ඇත්තේ එක් රැඳවුම් කඳවුරකින් වෙනත් කඳවුරකට මාරු කරනු ලබන රැඳවියන්ට නීතිමය ආවරණයක් සැපයීමය. උදාහරණයක් වශයෙන් පොලිස් ත්‍රස්තවාදී ඒකකයේ සිට පුනරුත්ථාපන කඳවුරකට මාරු කිරීම දැක්වීය හැක. අධිකරණයේ කාර්යභාරය හුදෙක් පරිපාලනමය එකක් වී ඇති අතර, රැඳවියන් අධීක්ෂණය පුනරුත්ථාපන අමාත්‍යාංශයේ කාර්යභාරයක් බවට පත් කොට ඇත. ශ්‍රී ලංකා බලධාරීන් පුරුද්දක් වශයෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අත් අඩංගුවේ තබා ගෙන සිටින පුද්ගලයෙක් එම කාල සීමාව ඉකුත් වූ පසු, ඒ පුද්ගලයා නිදහස් කරනු වෙනුවට

[18] Sri Government " Responses to the list of issues to be considered during the examination of Sri Lank's 3rd and 4th combined periodic reports on the Convention Against Torture and other Crual, Inhuman or Degrading Treatment or Punishment" http://www2.ohchr.org/english/bodies/cat/docs/CAT.C.LKA.Q.3-4.Add.1_en.pdf

[19] මහජන ආරක්ෂක පණතේ 5වන වගන්තිය යටතේ 2006 සැප්තැම්බර් 12 වන දින සාදන ලද හදිසි අවස්ථා නියෝග

පුනරුත්ථාපන කඳවුරකට මාරු කරයි. අධිකරණ නියෝගයකින් තොරව ගනු ලබන මෙම පියවර කිසිම සිවිල් පුරවැසියෙකුට අභියෝගයට ලක් කිරීමට බලධාරීන් ඉඩ දෙනු නොලැබේ.
ශ්‍රී ලංකික බලධාරීන් ගේ තර්කය වන්නේ , මෙම පුද්ගලයින් සිය කැමැත්තෙන්ම රජයට භාර වූ තැනැත්තන් නිසා ඔවුහු "පුනරුත්ථාපනය" පිණිස රඳවා තබා ගැනීම කිසිසේත්ම අත්අඩංගුවේ තබා ගැනීමක් නොවන බවයි. පොලිස් ත්‍රස්තවාදී ඒකකය විසින් මාස ගණනාවක් සිය අත්අඩංගුවේ තබා ගෙන සිටින පුද්ගලයින් "පුනරුත්ථාපනය" පිණිස පුනරුත්ථාපන කඳවුරකට අධිකරණයේ අවසරයක් නොමැතිව මාරු කිරීම, බොහෝ අධිකරණයන් සළකන්නේ රැඳවියා විසින් ස්වේච්ඡාවෙන් ගත් තීරණයක් වශයෙනි.
මයිල්වානගම් විනෝදලිංගම් 2009 යුද්ධය නිමාවීමත් සමගම ආරක්ෂක හමුදු වෙත සිය කැමැත්තෙන් භාරවූ පුද්ගලයෙකි. ඔහු පොලිස් ත්‍රස්තවාදී මර්දන ඒකකය විසින් රඳවා තබා ගත් අතර, 2012 ජනවාරි මස ඔහු පුනරුත්ථාපන කඳවුරකට මාරු කිරීම පිණිස අධිකරණ නියෝගයක් ලබා ගැනීම පිණිස කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කළේය. පොලිස් ත්‍රස්තවාදී මර්දන ඒකකයේ ඉල්ලීමට අධිකරණය විසින් අවසර දුන් අතර, විනෝදලිංගම් එහිදී තමාට තව කොපමණ කාලයක් "පුනරුත්ථාපන කඳවුරේ" සිටින්නට වේදැයි විමසුවේය. අධිකරණයේ පිළිතුර වූයේ "යම්කිසි පුද්ගලයෙක් පුනරුත්ථාපන කඳවුරේ රඳවා තබන කාලය පුනරුත්ථාපන බලධාරීන් විසින් තීරණය කරන්නක් මිස එය අධිකරණයට තීරණය කළ නොහැකි " බවය[20].
වර්තමාන ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජාත්‍යන්තර නීතියේ පිළි ගන්නා ආකාරයටම " නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස, කිසිදු තැනැත්තෙකු සිරභාරයට ගැනීම, බන්ධනාගාරගත කිරීම හෝ අන්‍යාකාරයකින් ශාරීරික අවරෝධනයට පාත්‍ර කිරීම හෝ නොකළ යුතුයැයි" පිළි ගන්නා අතරම කිසිදු තැනැත්තෙකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු යැයි ප්‍රකාශ කරයි. මහජන ආරක්ෂක පණත හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත් වලට මුවා වෙන් ශ්‍රී ලංකා බලධාරීන් මෙම ව්‍යවස්ථානුකූල වගන්ති නොසලකා හරිති.

ශ්‍රී ලංකා අපරාධ විධිවිධාන සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 37 වන වගන්තියට අනුව වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගනු ලබන පුද්ගලයින් පැය 24 ක් ඇතුළත මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කළ යුතුය. 2007 අංක 42 දරන අපරාධ විධිවිධාන (විශේෂ විධිවිධාන) පණත මඟින් ඇතැම් වැරදි සම්බන්ධයෙන් පුද්ගලයකු මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීමකින් තොරව පැය 48 ක කාලයක් රඳවා තබා ගැනීමට අවසර දෙන ලදි. නමුත් මෙම පණත 2009 දී අහෝසි වූ නමුත්, ආණ්ඩුව වෙනත් රෙගුලාසියක් මඟින් රඳවා තබා ගැනීමේ කාලය පැය 48 කළේය.
මහජනතාව අතර නීතිය හා සාමය පවත්වා ගැනීම පිණිස ආරක්ෂක හමුදු ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ පිළිගත් ප්‍රමිතීන්ට මෙය නොගැලපෙයි. මානව හිමිකම් පිළිබඳ නීතිඥවරියක් වන ක්‍රීශාන්ති පින්ටෝ මේ තත්වය පිළිබඳ මෙලෙස ප්‍රකාශ කරයි.
"සාමාන්‍යයෙන් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තෙක් පිළිබඳ හේතු සැපයීමට ඇති අයිතියට ගරු නොකරයි. සැකකරුවන් ඔවුන්ට විරුද්ධව ඇති චෝදනා පිළිබඳව දැන ගැනීමට ඇති අයිතිය නොසලකා සැකකරුවන් රඳවා ගෙන සිටින අතර, බොහෝ අවස්ථාවලදී ආරක්ෂක අංශ විසින් ගොතන ලද චෝදනා ඉදිරිපත් කරමින් තමන් විසින් අත්අඩංගුවට ගැනීම සාධාරණීයකරණය කරන බවද වාර්තා වේ. පැය විසිහතරක කාලයක් තුළ සැකකරුවෙකු මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කළ යුතුය යන නීතිය සම්පූරණයෙන්ම නොසලකා හරින අතර, සාමාන්‍යයෙන් සැකකරු මහේස්ත්‍රාත්වරයාගේ නිල

[20] "Court 'cannot decide' on rehabilitation,", *BBC Sinhala.com*, 06 January 2012 http://www.bbc.co.uk/sinhala/news/story/2012/01/120106_court_rehabilitation.shtml

නිවසට රැගෙන ගොස් අදළ අවසරය ලබා ගනී. මේ නිසා සැකකරු වධහිංසාවන්ට භාජනය වුයේ ද යන්න පිළිබඳව මහේස්ත්‍රාත්වරයාගේ අවධානයට යොමු නොවේ. අත්අඩංගුවට ගනු ලැබූ තැනැත්තා ගේ ඥාතීන්ට අත්අඩංගුවට ගැනීම පිළිබඳව දැනුම් නොදෙන අතර, ඔවුන්ට අත්අඩංගුවේ පසු වෙන තැනැත්තා හමුවීමට ද ඉඩ නොදෙයි. සැකකරුට නීතිඥ සාහය ලබා ගැනීමට දෙන ඉඩකඩ ද ඉතාමත් සීමාසහිත වන අතර ඉඩ ලැබුනත් සිය සේවාදයකයා සමග පෞද්ගලික හමුවිමටකට අවසර නොදෙයි. රැඳවියන්ට බාහිර තමන්ට අභිමත වෛද්‍යවරයෙකු ගෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට ද අවසරයක් නැත. සැකකරුවන් වෛද්‍යවරුන් වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදී ද බොහෝ විට සිදුවන්නේ සැකකරුට වධහිංසා පමුණුවන ලද නිලධාරියා විසින්ම ඒ තැනැත්තා වෛද්‍යවරයා වෙත කැටුව යාමයි. නීතියේ ආධිපත්‍යයේ ඇති මෙම පිරිහීම වඩාත් දරුණු ලෙස දක්නට ලැබෙන්නේ හදිසි නීති රෙගුලාසි යටතේ කරනු ලබන අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙනී[21].

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත

තාවකාලික පණතක් වශයෙන්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත මුල්වරට හඳුන්වා දෙන ලද්දේ 1979 දීය. 1982 දී ඉදිරිපත් කරන ලද සංශෝධනයක් මඟින් මෙම පණත ස්ථිර පණතක් බවට පත් කළේය[22]. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත පාවිච්චි කරන ලද්දේ හදිසි නීති රෙගුලාසි යටතේ දීර්ඝ කාලයක් රඳවා තබා ගන්නා ලද තැනැත්තන් තවදුරටත් රඳවා තබා ගැනීම පිණිසය. උදාහරණයක් වශයෙන හදිසි නීති රෙගුලාසි යටතේ යම්කිසි තැනැත්තෙක් රඳවා තබා ගත හැකි උපරිම කාලය වන මාස 12ක කාලයක් රඳවා තබා ගෙන එම කාලය ඉකුත් වන විට, ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන් ලබා ගන්නා නියෝගයක් මත, පොලීසියට තවත් මාස 18ක් කිසිදු චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමකින් තොරව, එම තැනැත්තා රඳවා තබා ගත හැකිය. මෙම කාල පරිච්ඡේදයද ඉකුත් වූ විට මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරන අතර, නඩු විභාගයක් පොරොත්තුවෙන් එම තැනැත්තා නැවත රැඳවුම් භාරයට පත් කරන නමුත්, කිසිදු අවස්ථාවක චෝදනා ගොනු කිරීමක් වාර්තා නොවේ.
ශ්‍රී ලංකාවේ සාක්ෂි ආඥා පණතට අනුව සාමාන්‍ය අපරාධ සම්බන්ධයෙන් අත්අඩංගුවේ පසුවෙන පුද්ගලයෙක් මහෙස්ත්‍රාත්වරයෙකු වෙනුවට පොලිස් හෝ පරිපාලන සේවයේ නිලධාරීයෙකුට කරන ප්‍රකාශයන් සාක්ෂි ආඥා පණතට අනුව බැහැර කරනු ලබයි. නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතට අනුව එබඳු පාපෝච්චාරයන් සාක්ෂි වශයෙන් බාර ගනු ලැබේ.

ඕනෑම නඩුවක් සම්බන්ධයෙන් " පොළඹන ලැබූ, තර්ජන හෝ පොරොන්දු " මත දෙනු ලබන සාක්ෂි වලංගු සාක්ෂි වශයෙන් පිළි ගනු නොලැබේ. නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ මෙම ක්‍රමය සම්පුර්ණයෙන්ම උඩු යටිකුරු කරන ලදී. මෙම පණත යටතේ යම් කිසි පාපෝච්චාරණයක් ලබා ගන්නා ලද්දේ බලහත්කාරයෙන් යැයි අධිකරණය ඉදිරියේ ඔප්පු කිරීමේ වගකීම පැවරෙන්නේ සැකකරුටය[23].

---

[21] Kishali Pinto-Jayawardena," rule of Law in Decline" The Rehabilitation and Rserch Centre for Torture Victims(RCT) p12 , http://www.ruleoflawsrilanka.org/resources/THE-RULE-OF-LAW-OF-DECLINE.pdf/view, accessed 27 February 2012.

[22] ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ 29 වගන්තිය මඟින් මෙම පණත ක්‍රියාත්මකව පවතින කාලය තුන් අවුරුද්දකට සීමා කරන ලදී. 1982 සංශෝධනය මඟින් මෙම වගන්තිය අහෝසි කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත නීති පුස්තකයේ ස්ථිර පණතක් බවට පත් කරන ලදී.

[23] ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ 16 (2) වගන්තිය.

2010 දී අධිකරණය ජේ.එස්.තිස්සනායගම්, ත්‍රස්තවාදය යටතේ වැරදිකරුවකු කරනු ලබන්නේ ඔහු විසින් ම කරන ලද ප්‍රකාශයක් මුල් කර ගනිමිනී. ඔහු තමා ගේ මෙම ප්‍රකාශය එම අවස්ථාවේදී කරන ලද්දේ බලවත් පීඩනයක් යටතේ පොලීසියේ උවමනාව මත යැයි ප්‍රකාශ කළත්, අධිකරණය ඔහු ගේ එම ප්‍රකාශය සැලකිල්ලට ගත්තේ නැත. අධිකරණය සිය තීන්දුව ප්‍රකාශයකට පත් කරමින් ඔහු වසර 20ක සිර දඬුවමකට යටත් කරන ලදී. මෙම විවාදයට තුඩු දෙන නඩු තීන්දුව සම්බන්ධයෙන් මෙරට හා ජාත්‍යයන්තරව විශාල උද්ඝෝෂණයක් පැන නැඟුන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු නිදහස් කෙරින. (පසුව ශ්‍රී ලංකාවෙන් පිටමං වූ ඔහු අද විදේශීය රටක දේශපාලන රැකවරණය ලබා සිටියි.)

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ බලධාරීන්ට රැඳවියන් එක් මධ්‍යස්ථානයක සිට ඔවුන්ට අභිමත වෙනත් රැඳවුම් මධ්‍යස්ථානයකට මාරු කළ හැකිය. මෙම බලධාරීන් භුක්ති විඳින මෙම අධිකාරීය නිසා රැඳවියන් බොහෝ අවස්ථාවල වධහිංසාවන්ට ගොදුරු වන බව වාර්තා වේ[24].

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ 9 (1) වගන්තියට අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ලබා ගන්නා නියෝගයක් මත කිසිදු චෝදනාවකින් තොරව යම් කිසි තැනැත්තෙක් මාස 18ක කාලයක් රඳවා තබා ගත හැකිය. බොහෝ විට මේ කාලය තුළ සිදුවන්නේ ඒ තැනැත්තාට විරුද්ධව ඉදිරිපත් කළ සාක්ෂි පිළිබඳව විමර්ශන පැවැත්වීමයි. මෙබඳු තැනැත්තන් නිදහස් කළ පසුද මෙම පණතට අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඒ තැනැත්තා ගේ අයිතීන් සම්බන්ධයෙන් අතිරේක සීමාවන් පැනවීමට බලය ලබා දී ඇත. මේ අනුව පුද්ගලයෙකුගේ යාමේ ඊමේ නිදහස, සිතීමේ හා සමාගමයේ නිදහස සීමා කිරමින් නියෝග නිකුත් කිරීමට හැකිය[25]. මෙම නියෝග අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කළ නොහැකිය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතේ 10 වන වගන්තියට අනුව " එම පණතේ 9 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම්කිසි නියෝගයක් අවසාන නියෝගයක් වන අතර□ යම්කිසි අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්න කිරීමට හෝ රිට් ආඥාවක් ලබා ගැනීමට ද නොහැකිය"[26].

ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ පොලීසිය විසින් අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝගයකින් තොරව පැය 72ක කාලයක් මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකොට රඳවා තබා ගත හැක. අනතුරුව මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරන විට එම තැනැත්තා රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව පොලීසියෙන් ප්‍රශ්න කිරීමේ බලයක් මහේස්ත්‍රාත්වරයාට නැති අතර, මහේස්ත්‍රාත්වරයාට බලය දී ඇත්තේ එම තැනැත්තා "විමර්ශන කටයුතු අවසාන වනතුරු" තවදුරටත් රිමාන්ඩ් භාරයේ තැබීමට අවසර දීමට පමණි; මෙම නීතිය විසින් රඳවා තබා ගැනීමට හෝ රිමාන්ඩ්භාරයේ තැබීමට පෙර චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ යුතුව බවට සඳහනක් නොවේ[27]. මෙම පණත යටතේ පුද්ගලයින් දහස් ගණනක් චෝදනා පත්‍රයක් භාර දීමකින් හෝ නඩු විභාගයකින් තොරව අත්අඩංගුවේ හෝ රඳවා තබා ගෙන සිටිති. මෙම පුද්ගලයින්ට බලධාරීන් චෝදනා පත්‍රයක් කිසි කළෙක ලබා නොදෙන අතර, මේ නිසා නඩු පැවරීමක් ද සිදු නොවේ. මීට අමතරව ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමයේ ඇති අකාර්යක්ෂමභාවය නිසා පවරන ලද නඩු සඳහා තීන්දුවක් ලබා දීම පිණිස ඇදහිය නොහැකි තරම් දිර්ඝ කාලයක් සමහර විට අවුරුදු පහළොවක් විස්සක් තරම් කාලයක් ගෙන තිබේ.

---

[24] 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත (තාවකාලික විධිවිධාන) පණතේ 7 (3) වගන්තිය

[25] ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත 9 (1) හා 11 (1) වගන්ති

[26] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 10 වන වගන්තිය

[27] ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත දෙවන කොටස වරදවල් සම්බන්ධයෙන් විමර්ශනය 7 (1) වගන්තිය

2011 දෙසැම්බර් මස පළ වූ මාධ්‍ය වාර්තාවකට අනුව " අනුරාධපුර බන්ධනාගාරයේ රඳවා සිටින දෙමළ රැඳවියන් 65 දෙනා අතරින් චෝදනා ඉදිරිපත් කර තිබෙන්නේ පුද්ගලයින් 23 දෙනෙකු සම්බන්ධයෙන් පමණි. ඉතිරි 42 නාම කිසිදු චෝදනාවක් නොලබා වසර දෙකත් හයත් අතර, කාලයක් රිමාන්ඩ් භාරයේ පසු වෙයි[28].

ඉහත කී මාධ්‍ය වාර්තාවට අනුව ඇටර්නි ජනරාල් වරයා විසින් නිදහස් කරන ලද රැඳවියන් පවා තවදුරටත් රිමාන්ඩ් භාරයේ තබා ගෙන සිටින අතර, ඔවුන් විට විට නැවත නැවතත් අධිකරණයට ඉදිරිපත් කරනවා මිස නිදහස් කිරීමක් සිදු වී නැත. තීරුමඟල් නැමති එල්. ටී. ටී. ඊ. සැකකාරිය නිදසුනක් වශයෙන් දක්වන මෙම මාධ්‍ය වාර්තාව මේසේ සඳහන් කරයි. " මේ ඇය රැඳවියක් වශයෙන් ගත කරන 15 වන වසර වන අතර, 429 වතාවක් උසාවියට ඉදිරිපත් කර ඇත. ඇය නඟන ප්‍රශ්නය වන්නේ නිදහස් කිරීමට පෙර ඇය තව කොපමණ වතාවක් අධිකරණයට යාමට ඒමට වේද යන්නයි"[29]
ඉහත වාර්තාවට පදනම් වූ තීරුමඟල් චිත්‍රාසේනානන් රොබට් අත් අඩංගුවට ගන්නා ලද්දේ 1996 සැප්තැම්බර් 8 වන දින කොළඹ කොල්ලුපිටියේදීය. ඇයත් සමග ඇය ගේ සැමියා වන මැක්සිලන් අන්තෝනිපිල්ලෙයි රොබට් ද අත්අඩංගුවට ගත් අතර, ඔවුහු එල්. ටී. ටී. ඊ. ය සමග සම්බන්ධතා ඇතැයි සැක කරන ලදි. 1996 නොවැම්බර් මස තීරුමඟල් ගේ මව, සිය දියණිය නිදහස් කරන මෙන් හේබෙයාස් කොෆුස් ආඥාවක් අධිකරණයෙන් ඉල්ලා සිටිය නමුත් එම ප්‍රයත්නය අසාර්ථක විය. ඇය අත්අඩංගුවට ගැනීමෙන් අවුරුදු 8කට පසු 2004 ජූනි මස 22වන දින එක්සත් ජාතීන් ගේ සංවිධානයේ අත්තනෝමතික රඳවා තබා ගැනීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව ඇය ඇතුළු තවත් 12 දෙනෙකු අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම පිළිබඳ තොරතුරු විමසා එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් ප්‍රකාශනයේ 14 වන වගන්තිය හා සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 10 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එම සංදේශයට අනුව;

අප වෙත වාර්තා වන අන්දමට මෙම පුද්ගලයින් අත්අඩංගුවට ගෙන තිබෙන්නේ ඔවුන් ගේ ජනවාර්ගික පදනම මතය. කොටින් කියනවා නම් ඔවුහු දෙමළ ජාතිකයින් විමත් එල්. ටී. ටී. ඊ. සංවිධානයේ සාමාජිකයින් විය හැකි බවටත් සැක කරමිනි. කිසිදු චෝදනාවකින් තොරව ඔවුහු මාස ගණනාවක් රඳවා තබා ගත් අතර, පසුව තමන් විසින් කරන ලදැයි කියන ලද ප්‍රකාශයන්ට බලහත්කාරයෙන් අත්සන් කිරීමට පොළඹවනු පිණිස විවිධ වධදීම් වලට ලක් කරනු ලැබූ අතර, ඒ ප්‍රකාශ පදනම් කොට ගෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ චෝදනා ඉදිරිපත් කරන ලදී. ඔවුන් පිළිබඳ නඩු විභාගය පවත්වා ගෙන යන්නේ ඉතාමත් මන්දගාමී ලෙසටය. ඔවුන්ට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා බොහොමයක් ගොතන ලද ඒවා බව පැහැදිලිය. පුදුමයකට මෙන් දෙමළ ජාතිකයින් වන ඔවුන් කරන ලද පාපෝච්චාරණ සිංහල භාෂාවෙන් කර තිබෙන අතර, ඔවුන්ට අත්සන් කර තිබෙන්නේ ද සිංහළ පිටපතකටය[30].

ශ්‍රී ලංකාවේ අන්තනෝමතිකව රඳවා තබා ගැනීමේ රටාව:

[28] Ranga Jayasuriya: " Were detainees sadistically beaten at A'pur?' Lakbima 4 Dec 2011 http://www.lakbimanews.lk/index.php?option=com_content&view=article&id=3748:were-detainees-sadistically-beaten-at-apura&catid=35:news-features&Itemid=37m, accessed 19 February 2012.
[29] ඉහත ලිපිය බලන්න
[30] Maxilan Anthonypillai Robert et al Vs Sri Lanka, working group on Arbitrary Detention UN Doc E/CN.4/2006/7/Add.1at 33 (2005) Opinion No 8/2005 (Sri Lanka) Communcation addressed to the Sri Lanka Government on 22 June 2004.

ශ්‍රී ලංකාවේ බලධාරීන් මහජන සාමය හා ආරක්ෂාව නමින් ඉතා විශාල දැලක් එළා අත්අඩංගුවට ගනු ලබන හා රඳවා තබා ගන්නා තැනැත්තන් සම්බන්ධයෙන් ජාත්‍යයන්තරව පිළිගත් රැකවරණයන් පිළිපැදීමට අපොහොසත් වෙයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ අත්අඩංගුවට හෝ රැඳවුම් භාරයට පත්වන තැනැත්තන් ට නීතියේ පිළිසරණ ලබා ගැනීම ඉතාමත් දුෂ්කර කටයුත්තක් වී තිබේ. සමහර ජාත්‍යන්තර නීතිමය රැකවරණයන් ශ්‍රී ලංකා නීති මාලාවෙන්ම ගිලිහි ගොස්ය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත මඟින් වරෙන්තුවක් නොමැතිව ස්ථානයන් පරීක්ෂා කිරීමටත් පුද්ගලයින් අත්ඩංගුවට ගැනීමටත් බලධාරීන්ට අවසර ලැබෙන අතර, මෙකී ක්‍රියාමාර්ග අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට නොපුළුවන. මෙම නීති යටතේ යම් කිසි ක්‍රියා මාර්ගයක් ගැනීමේදී ඒ සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නියෝග මාලාවක් තිබෙන අතර, එය පිළිපැදීම අපේක්ෂිතය. එහෙත් එය ප්‍රායෝගිකව සිදු නොවේ. නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීම සහතික කොට ඇත්තේ නඩු විභාගයන් සම්බන්ධ සැකකරුවන්ට වන අතර, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වැනි සිවිල් බලධාරීන් විසින් රඳවා ගෙන සිටින තැනැත්තන්ට ඒ වරප්‍රසාදය හිමි නොවේ. මීට අමතරව පොලිස් අත්අඩංගුවේ පසුවන විට නීතිඥ රැකවරණය ලබා දීමද ආරක්ෂා කොට නැත.

2009 අප්‍රියෙල් මස එවකට ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ ප්‍රධානියාව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සි. එන්. වාකිස්ට සම්මුඛ සාකච්ජාවකදී, සිය දෙපාර්තුමේන්තුව ත්‍රස්ත විරෝධී කාර්ය පටිපාටිය හා නඩු පැවරීමේ ප්‍රමාදයට කරුණු පැහැදිලි කළේය. ඒ අනුව ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් තමන් කළ වරදක් නිසා රජයේ භාරයට පත් වී සිටින බවත්, එසේ අත්අඩංගුවේ සිටීම රට වෙනුවෙන් කරනු ලබන සේවයක් වශයෙන් සැලකිය යුතු බවත් පැවසීය.

> ත්‍රස්තවාදය වැළැක්වීම යන්නට පරීක්ෂාවෙන් සිටීම, බුද්ධි තොරතුරු රැස් කිරීම හා ගොනු කිරීම මෙන්ම අත්අඩංගුවට ගැනීම ද ඇතුළත්ය. මෙම ක්‍රියා මාර්ග ණිසා අපි එල්. ටී. ටී. ඊ. ජාලය බිඳ දැමීමට සමත් වුවෙමු. මේ නිසා ඇතැමුන් අපි මිනිසුන් ගේ නිදහසට බාධා කරන බවට චෝදනා කළත්, ඇත්ත වශයෙන්ම මෙම ක්‍රියා පටිපාටිය නිසා ඉතා විශාල සේවයක් සිදුවෙයි. අත් අඩංගුවේ පසු වෙන්නන් කිසිම ලෙසකින් තමන් ගේ නිදහස ඇහිරී ඇති බව නොසිතිය යුතුය. බොහෝ අවස්ථාවලදී ආරක්ෂක අංශයේ නිලධාරීන්ට පැය 24ක් ඇතුළත සැකකරුවෙක් සම්පූර්ණයෙන් ම පරීක්ෂා කළ නොහැකිය. මේ නිසා පුද්ගලයින් දිර්ඝ කාලයක් අත් අඩංගුවේ තබා ගැනීමට සිදුවේ. අත්අඩංගුවේ සිටීමින් ඔවුන් පරිත්‍යාග තරන කාලය ඇත්ත වශයෙන්ම දේශයේ නීතිය හා සාමය පවත්වා ගෙන යාම පිණිස කරන පරිත්‍යාගයක් වශයෙන් සැලකිය යුතුය. රැඳවියන් සම්බන්ධයෙන් අපේ ස්ථාවරය මෙය වන අතර, අපි මේ කාරණය ඔවුන්ටත් පැහැදිලි කිරීමට උත්සාහ කරමු. සිදුවෙන අපහසුතාවයන්ට අපි කණගාටුව ප්‍රකාශ කරමු..අපි ඔවුන්ට සෑම විටම ප්‍රකාශ කරන කාරණයක් නම් ඔවුන් අත් අඩංගුවට පත් වීම නිසා රටට ඉතා විශාල සේවයක් වු බවයි."[31].
>
> ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් වර්ෂ තුනකට ආසන්න කාලයක් රඳවා ගෙන සිටි තැනැත්තෙක් මෙම ගැටළුව දකින්නේ වෙනස් ආකාරයකිනි.
>
> "ඉස්සේල්ලාම ඔබව ත්‍රස්ත විමර්ශන ඒකකයට අර ගෙන ගිහින් පරීක්ෂා කරනවා. එහිදී ඔබ ඔවුන්ට සහයෝගය දෙන්නේ නැති බව හැඟි යනවා නං ඔබව බුස්ස කඳවුරට යාවාවි. අපිව රඳවා ගෙන සිටි බුස්ස ඇත්තටම හිර ගෙයක් නෙමෙයි. ඒක ත්‍රස්ත විමර්ශන ඒකකයේ රැඳවුම් මධ්‍යස්ථානයක්. ඒක ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධීක්ෂණය යටතේ තිබෙන වෙනමම

[31] Senior Superintendent Of Police - C N Wakishta (TID Director), *Business Today*, April 2009, http://businesstoday.lk/cover_page.php?article=205&issue=206, accessed 19 February 2012.

ඒකකයක්. එහි බන්ධනාගාර නිලධාරීන් නෑ. ඔබ රෝහලට ගෙන ගියත් ඔබව, කැටුව යන්නේ ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීයෙක් මිස බන්ධනාගාර නිලධාරියෙක් නෙවෙයි.[32]

කිසිදු නීතිමය ආරක්ෂාවකින් තොරව සිටින රැඳවියන් නිරන්තරයෙන්ම වධහිංසාවන්ට ගොදුරු වෙයි.

ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදාව, පොලීසිය හෝ අතුරු හමුද, අත්අඩංගුවට ගත් හෝ රඳවා ගෙන ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තන් හා ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට අත්තනෝමතික රඳවා තබා ගැනීම් පිළිබඳ ඔවුන් ගේ අත්දැකීම් විස්තර කොට ඇත.
මේ වාර්තාවන්ට අනුව වවුනියාව අවට යුද්ධ හමුදාව විසින් තාවකාලික ස්ථානයන් රැඳවුම් මධ්‍යස්ථාන ලෙස පාවිච්චි කරමින් එල්. ටී. ටී. ඊ.ය හා සම්බන්ධකම් ඇතැයි සැක කරන පුද්ගලයින් රඳවා තබා ගන්නා අතර, පසුව ගාල්ලේ පිහිටි බුස්ස කඳවුරට හෝ කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකක මූලස්ථානයට මාරු කර යවනු ලබයි. ඇතැම් රැඳවියන් එක්කෝ වැලිකඩ බන්ධනාගාරයට හෝ මහනුවර බන්ධනාගාරයට මාරු කර යවන අතර, එම ස්ථානයන් හි දීර්ඝ කාලයක් රඳවා තබනු ලැබින.
නිදහස ලැබූ රැඳවියන් හා රැඳවියන් ගේ පවුල් වල සාමාජිකයින් විසින් ඉදිරිපත් කරන ලද එක් චෝදනාවක් වුයේ අත්අඩංගුවට ගනු ලැබූ ආකාරය නීති විරෝධී බවයි. සෑම විටම පාහේ සිදුවී ඇත්තේ සිවිල් ඇඳුමින් සැරසුන ආරක්ෂක නිලධාරීන් විසින් ඒ තැනැත්තා පැහැර ගැනීමක ස්වරූපයෙන් අත්අඩංගුවට ගත් බවයි. තමන් රහසිගත ස්ථානයන් හි සති ගණනාවක් රඳවා ගෙන සිටි බව ඇතැමුන් ප්‍රකාශ කරයි. ඉන් පසු විවිධ රැඳවුම් මධ්‍යස්ථානයන්ට හා සමහර විට පොලීස් ස්ථානයන්ට සැකකරු ප්‍රශ්න කිරීම පිණිස මාරු කර යවයි.
තොරතුරු සැපයුවන් ගේ තොරතුරු සංසන්දනය කර බලන විට විවිධ කණ්ඩායම් විවිධ ක්‍රමෝපායන් ප්‍රශ්න කිරීම හා වධහිංසා පැමිණ විම පිණිස යොදු ගෙන තිබෙන බව හෙළිදරව් වුවත් ඒ සියල්ලටම පොදු ලක්ෂණ කිහිපයක් සාරංශ කොට දැක්විය හැක.

- ජාතිකත්වය ගැටළුවක් වීම- දිවයින පුරාම සිංහළ හා මුස්ලිම් ජාතිකයින්ට සාපේක්ෂකව දෘඩ ජාතිකයින් අත් අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම සිදු වේ. අත්අඩංගුවට ගත් සෑම තැනැත්තෙක්ම වධහිංසාවන්ට භාජනය කොට තිබේ. එල්. ටී. ටී. ඊ. සංවිධානයට සහයෝගය දීම පිළිබඳ සැක පිට අත්අඩංගුවට ගනු ලබන සිංහළයන් විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ට ඉතාමත් නීන්දිත ආකාරයෙන් සලකනු ලැබූ අතර, ඔවුන් ඉලක්ක කොට ගෙන ජන මාධ්‍ය හරහා විශේෂ ප්‍රචාරයන් පවා ගෙන යාම;[33]
- පදිංචි ස්ථානය ගැටළුවක් වීම- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම දිවයින පුරාම වාර්තා වන අතරඋ එය යුද්ධ කලාපයට පමණක් සීමා වුවක් නොවේ. එහෙත් යුද්ධයේ

[32] රහස්‍ය සම්මුඛ සාකච්ඡාවක් 2012 ජනවාරි

[33] නිදර්ශනයක් වශයෙන් 2007 දී අත්අඩංගුවට ගනු ලැබූ ලලිත් සෙනෙවිරත්න, සිසිර ප්‍රියංකර හා නිමල් සේරසිංහ යන වෘත්තීය සමිති සාමාජිකයින් තිදෙනා " සිංහළ කොටී" යැයි හඳුන්වා දෙමින් ජනමාධ්‍ය හරහා විශාල ප්‍රචාරයක් දෙන ලදි.ඔවුන් විසින් කරන ලදැයි කියන ප්‍රකාශයක් විඩියෝ පටි ගත කර ජන මාධ්‍යවේදීන්ට ප්‍රදර්ශනය කරනු ලැබින. (2007 මාර්තු 13 දින සමාජවාදී සමානත්මතා පක්ෂය නිකුත් කළ පුවත් පත් නිවේදනය) 2007 වසරේදී සිංහළ ජාතික මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති නායකයින් හා දුම්රිය දෙපාර්තුමේන්තුවේ සේවකයින් 25 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් එල් ටී ටී ඊ සංවිධානය සමඟ සම්බන්ධකම් පැවැත් වීමේ චෝදනාව මත අත්අඩංගුවට ගෙන තිබුණි. 2009 පෙබරවාරි මස මේ කණ්ඩායම අතරින් 11 දෙනෙකු චෝදනා විරහිතව නිදහස් කරන ලද අතර 2009 මාර්තු මාසයේදී ඉතිරි 14 දෙනා සම්බන්ධයෙන් එක්කෝ චෝදනා ඉදිරිපත් කිරීම හෝ නැතිනම් නිදහස් කරන මෙන් ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළේය. ඒ අනුව 2011 සැප්තැම්බර් මස වන විට අත්අඩංගුවේ තබා ගෙන සිටි තිදෙනකු සම්බන්ධයෙන් යාපනය හා කොළඹ අධිකරණයන්හි දී අධිචෝදනා පත්‍ර බාර දෙනු ලැබිණ.(Court Releases Sinhala Tigers- BBC Sinhala Com 13 Feb 2009) http://www.bbc.co.uk/sinhala/news/story/2009/02/090213_sinhala_tigers.shtml, accessed 27 February 2012.

අවසාන අදියරේ දී යුද්ධ කලාපයෙන් පළා ආ දුවිඩ ජාතිකයින් සම්බන්ධයෙන් අනුගමනය කළ ක්‍රියාපටිපාටිය සුවිශේෂ එකක් වීය. ඔවුහු කොටු කරන ලද තාවකාලික රැඳවුම් මධ්‍යස්ථානයන් වෙත යොමු කරන ලදී. ඔවුන්ට සලකන ලද්දේ ඔවුන් නිසා ශ්‍රී ලංකාවට අති විශාල ආරක්ෂක තර්ජනයක් ඇතැයි යන උපකල්පනයෙන් වන අතර, ඔවුන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක පදිංචි විමේ අයිතිය හා සාමාන්‍ය නීතියේ රැකවරණය ඇතැයි ද නොපිළිගැනින.

- අත් අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම හා ප්‍රශ්න කිරීමේදී යුද්ධ හමුදාව, පොලීසිය හා අතුරු හමුදා ඒකාබද්ධව ක්‍රියා කිරීම- (2006 සිට ශ්‍රී ලංකා පොලීසිය තමන් යටතට පවරා ගත් ආරක්ෂක අමාත්‍යාංශය මෙම ඒකාබද්ධ මෙහෙයුම් අනුමත කළේය.)[34] අප වෙත ලැබී ඇති සාක්ෂිකරුවන් ගේ ප්‍රකාශ වලට අනුව විවිධ ආයතන ගණනාවක් විසින් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයින් පිළිබඳව විමර්ශනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, රැඳවියන්ට බාහිර ලෝකයත් සමග සංදේශනය කිරීම වළක්වා ලීම ඇතුළු අනෙකුත් වධහිංසා වලට වැඩියෙන් භාජනය විමට සිදු බව පෙනී යයි.

යුද්ධයේ අවසාන අදියරේ දී, වන්නියේ යුද්ධ කලාපයේ සිට පළා එන සිවිල් වැසියන් ගෙන් මුලතිව් හී රැදී සිටි යුද්ධ හමුදා භටයින් වෙත භාර වීම හා තමන් එල්. ටී. ටී. ඊ. පාක්ෂිකයින් වශයෙන් හඳුන්වා ගැනීමත් අපේක්ෂා කෙරිණ. මෙම සිවිල් වැසියන් ගෙන් නොකඩවා ප්‍රශ්න කළ අතර, බොහෝ දෙනෙකුට නොයෙකුත් වධහිංසා හා අවමන් සහගත සැලකිලි වලට ගොදුරු විමට සිදුවීය. තමන් එල්. ටී. ටී. ඊ. සාමාජිකයින් නොව, එල්. ටී. ටී. ඊ. සංවිධානය හා සම්බන්ධතා පමණක් තිබූ තැනැත්තන් බව සනාථ කර ගත හැකි වුවන් පුනරුත්ථාපනය පිණිස යොමු කරන ලදී. ආරක්ෂක අංශ සමග සහයෝගයෙන් ක්‍රියා නොකළ තැනැත්තන්ට වධහිංසා පමුණුවන ලද අතර, තවදුරටත් ප්‍රශ්න කිරීම පිණිස කොළඹට මාරු කරන ලදී.

කෙසේ වෙතත්, දිවයින පුරා ශ්‍රී ලංකිකයින් විවිධ හේතූන් මත අත් අඩංගුවට පත් වන අතර, ඔවුහු නිල නොවන මධ්‍යස්ථානයන් හි රඳවනු ලබති. කලින් කළට ආරක්ෂක හමුදා විසින් කොළඹ හා ඒ අවට, උඩරට වතුකරය හා නැගෙනහිර පළාත් වට කර සෝදිසි කරනු ලබයි. එහිදී අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් සිවිල් බලධාරීන් යටතේ රඳවා තබන ලබන නමුත් ඔවුන්ට අධිචෝදනා ඉදිරිපත් කරනු ලබන්නේ කලාතුරකිනී. ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් උඩරට වතුකරයේ සැඟවී සිටි, එල්. ටී. ටී. ඊ. සැකකරුවන් 50 දෙනෙක් අත්අඩංගුවට ගැනීම නිදර්ශනයක් වශයෙන් ඉදිරිපත් කළ හැකිය[35]. 2008-2010 අතර, දී උඩරට වතුකරයේ සේවකයින් අඩුම වශයෙන් සය දෙනෙක් එල්. ටී. ටී. ඊ. සැකකරුවන් වශයෙන් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුහු ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ බදුල්ල බන්ධනාගාරයේ රඳවා සිටිති. පොලීසිය විසින් ඔවුන් භාරයේ ගිනි අවි තිබූ බව ප්‍රකාශයට පත් කළත් මේ දක්වා ඔවුන්ට අධිචෝදනා ඉදිරිපත් කොට නොමැති බව මෙම සිද්ධීන් නියාමනය කරන සිවිල් ක්‍රියාකාරීන් පෙන්වා දෙති.

කොළඹ පිහිටි සී. අයි. ඩී. නමින් ප්‍රසිද්ධ අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුව වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් සුප්‍රසිද්ධ බව විත්දිතයින් බොහෝ දෙනෙක් විසින් පෙන්වා දෙන ලදී. යාපනයේදී අත්අඩංගුවට ගනු ලැබූ එක් සැකකරුවෙක් සිය අත්දැකීම් මේසේ විස්තර කළේය.

---

[34]- Senior Superintendent of Police-C.N.Wakishta(TID Director) Business Today April 2009, " 2006 වර්ෂයේදී අපට ඉතා විශාල වගකීමක් පවරනු ලැබුවා.අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුව, ත්‍රස්තවාදී විමර්ශන ඒකකය, හමුදා බුද්ධි අංශය හා පොලීස් බුද්ධි අංශ යන සියළුම කොටස් එකම අංශයක් බවට පත් වුනා.මම ත්‍රස්තවාදී විමර්ශන කටයුතු වල 1981 සිට නිරතව සිටි කෙනෙක්. නමුත් මම ප්‍රථම වතාවට තමයි දකින්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා තම ගේ වගකීම ඉටු කිරීමට ඇප කැප වී ක්‍රියා කරන ආකාරය.ඔහු අපිත් එක්ක එකට වැඩ කළා.අපිට මඟ හැරුන යමක් තිබුනොත් එය වහාම ඔහු ගේ නෙත ගැටුනා" http://businesstoday.lk/cover_page.php?article=205&issue=206, accessed 19 February 2012

[35] -අංක 34 බලන්න

" කොළඹට ගෙන යාම භායනකයි..... ඉතාමත් භායනකයි..... මේවා ඔක්කෝම කෲර වධහිංසා පැමිණ විම්.....ඒ විදුලි පුටුවක් තියෙනවා.....ඒක ගැන මට හිතන්නඩවත් බෑ.....ඔබ දන්නවා කියමනක් තියෙනවා..... දෙවෙනි තට්ටුව විමර්ශන.....හතරවන තට්ටුව වධදීම් එක්ක විමර්ශන....ඔබ හයවන තට්ටුවට ගියොත්.....තවත් වධ විදිනවා විතරක් නෙමෙයි ආයේ එන්නේත් නෑ[36]. ත්‍රස්තවාදී විමර්ශන ඒකකය යටතේ වධහිංසා පැමිණවීම කොළඹ මෙන්ම බුස්සේ රැඳවුම් මධ්‍යස්ථානයේද සිදුවන බන වාර්තා වේ. ත්‍රස්තාවදී විමර්ශන ඒකකයේ නිලධාරීන් අතළොස්සක් වධහිංසා පැමිණවීමේ අපරාධකරුවන් වශයෙන් හඳුනා ගෙන තිබෙන අතර, ඔවුහු බැලූ බැල්මට වධ හිංසා පැමිණවීම කරනු ලබන්නේ බුද්ධි තොරතුරු ලබා ගැනීමට හෝ සහයෝගය නොදීමට දඬුවමක් වශයෙන් පමණක්ම නොව විත්දිතයින් ගේ පවුල් වල සාමාජිකයින් ගෙන් "උදව්වක් කිරීමට" අල්ලස් ලබා ගැනීමේ ද අරමුණ ඇතිවය.

රැඳවුම් භාරයේ සිටින පොලීස් නිලධාරියා

පොලිස් අධිකාරිවරයෙකු වන ලක්ෂ්මන් කුරේ, අමාත්‍යවරයෙකු ඝාතනය කිරීමට එල්. ටී. ටී. ඊ. සංවිධානයට ආධාර කිරීමේ චෝදනාව මත 2009 අගෝස්තු මස ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් අත්අඩංගුවට ගෙන රැඳවුම් භාරයට පත් කරන ලදී. අත්අඩංගුවට ගෙන මාස 17කට පසු ඔහුට විරුද්ධව කොළඹ අධිකරණයේදී අධිචෝදනා පත්‍ර බාර දෙනු ලබන්නේ 2011 පෙබරවාරි 7 වන දීය. මෙහි දී ලක්ෂ්මන් කුරේ තවදුරටත් බුස්සේ කඳවුරේ රැඳවුම් භාරේ තබන ලෙසට ත්‍රස්ත විමර්ශන ඒකකය කළ ඉල්ලීමට මහා අධිකරණ විනිසුරුවරයා ඉඩ දුන්නේය. මෙම තීරණයට විරෝධය පළ කළ ලක්ෂ්මන් කුරේ ගේ නීතිඥවරයා බුස්සේ කඳවුරේ දී තම සේවාදයකයා වධහිංසාවන්ට ගොදුරු වූ බව සඳහන් කරමින් ඔහු කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය භාරයට පත් කරන මෙන් ඉල්ලා සිටියේය.

2011 අප්‍රියෙල් මස දී නැවත වරක් ලක්ෂ්මන් කුරේ ගේ නීතිඥවරයා තම සේවාදයකයාට සාධාරණ නඩු විභාගයක් ලබා ගැනීම පිණිස, ඔහු ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කරන මෙන් අධිකරණයෙන් ඉල්ලා සිටියේය. තවදුරටත් මෙම ඒකකයේ රඳවා තබා ගෙන, නොකඩවාම වධහිංසා පමුණුවන බව වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරමින් පෙන්වා දුන්නේය. අහි චෝදනා නීතිඥවරයා කරුණු දක්වමින් එල්. ටී. ටී. ඊ. ය සමග ගණුදෙනු කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් වශයෙන් සැකකරු අපරාධ චෝදනා ලැබූ අනෙක් සැකකරුවන්ට මෙන් සැලකීමට නොහැකි බවත්, සැකකරු රිමාන්ඩ් භාරයට පත් කිරීම දැනට කර ගෙන යන විමර්ශන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන බව පෙන්වා දුන්නේය." රජයේ නීතිඥවරයා සැකකරු ගේ සිරුරේ පිළිස්සුම් තුවාල ඇති බව වෛද්‍ය නිලධාරීවරයා විසින් වාර්තා කළත්, එම පිළිස්සුම් තුවාල කවද කෙසේ ඇති වුවක් ද යන්න දක්වා නොමැති බවද කියා සිටියේය. විනිසුරුවරයා ත්‍රස්ත විමර්ශන ඒකකයට, කුරේ ගේ සිරුරෙහි කොපමණ කාලයක සිට මෙම පිළිස්සුම් තුවාල තිබෙන්නේ දැයි වාර්තා කරන ලෙස නියෝග කළේය.

2011 ජුලි මාසයේ දී, තමා නීත්‍යානුකූල නොවන ලෙස රඳවා තබා ගෙන සිටින බවත්, වධහිංසා වලට භාජනය කරන බවත්, දක්වමින් ලක්ෂ්මන් කුරේ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළි ගන්නා ලදී. එම පෙත්සමෙහි වග උත්තරකරුවන් වශයෙන් ත්‍රස්ත විමර්ශන ඒකකයේ ස්ථානාධිපති ප්‍රසන්න. ඩි. අල්විස්, පොලිස්පතිවරයා, ආරක්ෂ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ නීතිපතිවරයා ද සඳහන් කොට තිබුනි.

[36] -සම්මුඛ සාකච්ඡාවක දී හෙළි කළ තොරතුරු (මූලාශ්‍රය රහසිගතයි) 2011 මැයි

මාධ්‍ය වාර්තාවන්ට අනුව රැඳවියා 2009 අගෝස්තු 12 වන දින ගම්පහ පිහිටි ජ්‍යෙෂ්ඨ පොලීස් අධිකාරි කාර්යාලයට කැඳවනු ලැබූ අතර, එහිදී අත්අඩංගුවට ගනු ලැබින. අත්අඩංගුවට ගැනීමට හේතු ඔහුට දැනුම් නොදුන්නේය. ඔහුගේ පවුලේ අයට අත්අඩංගුවට ගත් බවට රිසිට්පතක් නිකුත් නොකළේය. පෙත්සම්කරු තමාට හිස මත පොත් තබා ඊට ගල් වලින් හා පොලු වලින් පහර දෙනු ලැබූ බවත්, තමා මේසයක් මත බාවා යටිපතුල් වලට රිටකින් පහර දුන් බවත්, සිය පෙත්සමින් කියා සිටියේය. පෙත්සම්කරු අඩි හයක් හා අඟලක් උසැති පුද්ගලයෙක් බවත්, තමා අඩි හයක් උසැති අඩි තුනක් පළළැති රැුම් කුටියක තවත් රැඳවුම් කරුවන් කිහිප දෙනෙක් සමග රඳවා සිටි බවත් කියා සිටියේය. තවද තමා පාපෝච්චාරණය නොකළහොත් මරා දමන බවටත්, තමාගේ බිරිඳ අත්අඩංගුවට ගැනීමට සිදුවන බවටත් තර්ජනය කළ බවද පෙත්සම්කරු කියා සිටියේය. ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් සකස් කරන ලද ප්‍රකාශයට අත්සන් කිරීම තමා විසින් ප්‍රතික්ෂේප කළ විට තමාව යාබද කාමරයකට ගෙන ගොස් දුම්වැටි වලින් තම අත් හා ශරීරය පිළිස්සූ බව තවදුරටත් ඔහු කියා සිටියේය[37]

නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටිය අහිමි කිරීම

අන්තර් ජාතික මානව හිමිකම් නීතියට අනුව, විශේෂයෙන්ම ඉහත දක්වන ලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 9වන වගන්තිය යටතේ රාජ්‍ය විසින් යම්කිසි පුද්ගලයෙකුගේ නිදහස අහිමි කරන්නේ නම් එම අහිමි කිරීම අන්තනෝමතික ක්‍රියාවක් නොවන බවට වගබලා ගැනීම පිණිස පියවර ගත යුතුයැයි සඳහන් වෙයි. මීට අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම ඇතුළත් වන අතර, එය නීත්‍යානුකූල විය යුතුය; අත්අඩංගුවට ගත් වහාම ඒ පුද්ගලයාට එරෙහිව තිබෙන චෝදනා කවරේදැයි දැන ගැනීමේ අයිතිය; විනිශ්චයකාරවරයෙකු වෙත හෝ වෙනත් අධිකරණ නිලධාරියකු වෙත නොපමාව ඉදිරිපත් කරවා ගැනීමේ අයිතිය; සාධාරණ කාලයක් තුල දී නඩු විභාගයක් පැවැත්වීම හෝ නිදහස් කිරීම; අධිකරණයකින් ඇප ඉල්ලා සිටීම;(විමර්ශන නිම වන තුරු රඳවා තබා ගැනීම නීතිය නොවේ) අධිකරණයක් ඉදිරියට ගොස් සිය රඳවා තබා ගැනීම අභියෝගයට ලක් කිරීම; නීති විරෝධී අත්අඩංගුවකට ගැනීමේ දී ඊට වන්දි ලබා ගැනීම ඇතුළු අයිතීන් රැසක් අත්අඩංගුවට පත් වන පුද්ගලයින් සතුය.

ශ්‍රී ලංකාවේ අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් රඳවා තබා ගැනිමට අනුගමනය කරන ක්‍රමවේදය, නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියට ප්‍රතිවිරුද්ධ බව මෙම විෂය පිළිබඳව නිරන්තරයෙන්ම අධ්‍යයනය කරන ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය හා ෆිරිඩම් ෆෝ ටෝර්චර් සංවිධානය නිගමනය කරයි. ශ්‍රී ලංකාවේ රැඳවියන් විශේෂයෙන්ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ආයුධ සන්නද්ධ කණ්ඩායම් සමග ගණුදෙනු කිරීමේ සැකය පිට අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින්ට නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටිය නොකඩවාම අහිමි කරන බව පැහැදිලිය.
2011 දෙසැම්බර් මස නිකුත් කළ වාර්තාවක් මඟින් ෆිරිඩම් ෆෝ ටෝචර් සංවිධානය ශ්‍රී ලංකාවේ සිය සේවා දායකයින් 35 දෙනා ගෙන් 32ක්ම රැඳවුම් භාරයේ දී වධහිංසාවන්ට ගොදුරු වී දිවි ගලවා ගත් අය වන අතර, ඔවුහු එක්කෝ යුද්ධ හමුදා කඳවුරු වල, පොලීස් ස්ථානයන්හි, බන්ධනාගාරවල, එසේත් නැත්නම් නිල නොවන රැඳවුම් මධ්‍යස්ථානවල අත්තනෝමතික ලෙස රඳවා සිටි පුද්ගලයෝ වෙති. "පුද්ගලයින් තිදෙනෙක් හැර අනෙක්

[37]- See: " My Client had no terror connections: Defence." Daily Mirror. 26 April 2011.See also," Sri Lanka: SC allows rights petition of SP who bemoans languishing in detention onn fabricated charges," Asian Tribune, 21 July 2011.

සියළුම රැඳවියන්ට නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියේ අයිතීය අහිමි වී තිබිණ. විධිමත් චෝදනා පත්‍රයක් හෝ දඬුවම් දීමක් නොවීය. නීතිඥ සාහය ලබා ගැනීමට අවසර නොලැබිණ. විනිසුරුවරයෙක් ඉදිරියේ නඩු විභාග නොවිණ. රැඳවියන් රඳවා තබන ස්ථාන පිළිබඳව ඒ පුද්ගලයාගේ පවුලේ උදවියට තොරතුරු සපයා නොතිබිණ. ස්වාධීන වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට අවස්ථාවක් නොවිණ[38]". 2008 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බුස්සේ රැඳවුම් කඳවුරෙහි කළ සංචාරයකින් පසු පළ කළ වාර්තාවේ " රැඳවියන් තුනෙන් දෙකක් ම ඔවුන් අත්අඩංගුවට ගත් අවස්ථාවේ අත්අඩංගුවට ගැනීමට හේතු නොදැන සිටියේ යැයි" සඳහන් කරයි[39].

හුදකලාව සිව් වසරක්

ටී. රවීන්දර්න් (අන්වර්ථ නාමයකි) කිසිදු චෝදනාවකින් තොරව කොළඹ හා පසුව බුස්සේ රැඳවුම් කඳවුරේ සිව් වසරක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රඳවා තබා ගන්නා ලදී. මේ කාල පරිච්ඡේදයෙන් වැඩි කාල වේලාවක් ඔහු ගත කළේ හුදකලාවය. රවින්දර්න් ශ්‍රී ලාංකික දවිඩ සම්භවයක් ඇති යුරෝපීය පුරවැසිභාවය ලැබූ තැනැත්තෙකි. 2007 සැප්තැම්බර් මස 5 දින ඔහු කටුනායක ගුවන් තොටුපළේ දී එල්. ටී. ටී. ඊ. සමග ගණුදෙණු කළ පුද්ගලයෙක් වශයෙන් සැක කොට ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් වරෙන්තුවකින් තොරව අත්අඩංගුවට ගත්තේය. තමාට ඉදිරිපත් කළ චෝදනා ප්‍රතික්ෂේප කළ ඔහු තමාගේම ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බවත්, තමාට එල්. ටී. ටී. ඊ. ය සමග තමාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බවත්, ඔහු විසින් දිගින් දිගමට ප්‍රකාශ කළේය.
2008 ජුනි 13 දින, රවින්දර්න් හදිසියේම බුස්සේ රැඳවුම් කඳවුරට මාරු කරන ලද අතර, එහිදි ඔහු අඳුරු හුදකලා මැදිරියක රඳවන ලැබින. ඔහුට ව්‍යායාම කිරීමටවත් අවසර නොලැබිණ. 2012 වැලිකඩ රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කරන තෙක් අවස්ථා කිහිපයකදීම රඳවා තබන ස්ථානය මාරු කරනු ලැබිණ.
රවින්දර්න් ගේ පවුලේ සාමාජිකයින්ට ඔහු රඳවා ගෙන සිටින්නේ කවර නීතියක් යටතේ දැයි නිශ්චිත අදහසක් නොමැත. ඔහු ගේ බිරිඳ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කරමින් කියා සිටියේ ආරම්භයේදී සිය සැමියා හදිසි අවස්ථා නියෝග යටතේ රඳවා ගෙන සිටි අතර, මාස තිහකට පසු ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන් ත්‍රස්තවාදය මර්දනය කිරීමේ පණත යටතේ ලබා ගත් රැඳවුම් නියෝගයක් මත තවදුරටත් රඳවා ගනු ලැබිණ. "තම සැමියා දැනටමත් රැඳවුම් භාරයේ ගත කොට ඇති කාලය ත්‍රස්තවාදය මර්දනය කිරීමේ පණත යටතේ නිකුත් කළ රැඳවුම් නියෝගයේ සඳහන් මාස 18 ක කාලයට වඩා වැඩි බවත්, (මෙම රැඳවුම් නියෝගය මාස තුනෙන් තුනට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ගේ නියෝගයකින් දීර්ඝ කරන ලදී.) මීට හදිසි අවස්ථා නියෝග යටතේ රඳවා තබා ගත් මාස 12 ද එකතු විය යුතු බවත් කියා සිටියාය. තම සැමියාට කිසිදු චෝදනාවක් යටතේ නඩු පවරා නොමැති බවද ඇය වැඩිදුරටත් සඳහන් කළාය. එක්සත් ජාතීන් ගේ සංවිධානයේ අත්තනෝමතික රඳවා තබා ගැනීම් සම්බන්ධ ක්‍රියාකාරී කමිටුව ශ්‍රී ලංකා රජයෙන්, ටී. රවින්දර්න් පිළිබඳව කළ විමසුමකට පිළිතුරු දෙමින්, ඔහු ත්‍රස්තවාදී විමර්ශන ඒකකයෙන් හදිසි අවස්ථා රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගත් බවත්, ඔහුට තමා ගේ රැඳවුම් නියෝගයේ පිටපතක් ලබා දී ඇති බවත්, ඉතා ඉක්මනින් ඔහුට විරුද්ධව ඇති

[38] - Pettit,Jo, " Out of the Silence: New Evidence of Ongoing Torture in Sri Lanka 2009-201" Freedom From Torture, December 2011.
http://www.freedomfromtorture.org/sites/default/files/documents/Sri%20Lanka%20Ongoing%20Torture_Freedom%20from%20Torture_Final%20Nov_07_2011.pdf, accessed 10 February 2012.

[39] Annual Report 2008 Human Rights Commission of Sri Lanka P 12 at 1.2.2

චෝදනා ප්‍රකාශයට පත් කරන බවත්, කියා සිටියේය. නමුත් මේ දක්වාම එබඳු චෝදනා පත්‍ර බාර දීමක් සිදුවී නොමැත.
රවින්දර්න් ගේ පවුලේ සාමාජිකයින් විසින් හේබයාස් කේපුස් නියෝගයක් ඉල්ලා ගොනු කරන ලද පෙත්සම 2008 ජනවාරි 8 වන දින විභාගයට ගන්නා ලදී. මෙම හේබයාස් කේපුස් විභාගය මාස 18ක් තිස්සේ 16 වතාවක් කැඳවන ලද අතර, ඒ කිසිම අවස්ථාවක රවින්දර්න් අධිකරණයට ඉදිරිපත් නොකළේය. මේ අවස්ථාව වන විට ඔහුගේ පවුලේ සාමාජිකයින් විසින් හේබයාස් කේපුස් නියෝගයක් ඉල්ලා ඉදිරිපත් කළ පෙත්සම මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කිරීමේ අරමුණින් ඉල්ලා අස්කර ගන්නා ලදී. ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කිරීම පිණිස අවසර දුන් අතර, ඒ පිළිබඳ විභාගය නොකඩවා කල් දමන්නට පටන් ගත්තේය. 2012 පෙබරවාරි 3වන දින පැවති නඩු දිනයේදී නඩුව 2012 ජුනි මාසය දක්වා කල් තැබිණ.
ඇත්තටම අපි දන්නේ නෑ රවින්දර්න් හුදකලාව රඳවා තබන්නේ ඇයි කියලා. සමහර විට ඔහු පාපෝච්චාරණයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කරන්න ඇති" ඔහු සමග රඳවා සිටින පුද්ගලයෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත ප්‍රකාශ කර සිටියේය.
කිසිම අවස්ථාවක රවින්දර්න් ගේ පවුලේ උදවියට, ඔහු ගේ රැඳවුම් ස්ථානයන් මාරු කිරීම පිළිබඳව බලධාරීන් විසින් දැනුම් දී නොතිබුනී. අවසානයේදී ඔහු රඳවා ඇති ස්ථානය දැනුම් දෙන ලද්දේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසිනී.
බුස්ස රැඳවුම් කඳවුරේ දී රවින්දර්න් ට නිතරම චිකන් ගුන්යා රෝගය වැළැදුණ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ උණට හා දණ හිස් ඉදිමීමේ රෝගයන්ට ප්‍රතිකාර ලබා දීමක් සිදු නොවීය. හන්දි ඉදිමීමේ රෝගය නිසා ඇවිදීමේ අපහසුතා ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ශරීරයෙහි බර පහත වැටුනි. මේ අතර ඔහු ගේ බිරිඳ ප්‍රකාශ කළ පරිදි රවින්දර්න් අධික රුධිර පීඩනයට නිර්දේශ කරනු ලැබූ ඖෂධ ගැනීම නතර කරන ලද්දේ එම ඖෂධ පාවිච්චි කරන්නේ නම් නිතරම මුත්‍රා කිරීමට සිදුවීමත් ඒ සඳහා පහසුකම් රැඳවුම් මැදිරියේ නොවීමත් හේතු කොට ගෙනය.
2008 සැප්තැම්බර් මස අත්තනෝමතික රඳවා තබා ගැනීම් පිළිබඳව එක්සත් ජාතීන් ගේ ක්‍රියාකාරී කමිටුව, ශ්‍රී ලංකා රජය වෙත නිකුත් කළ සංදේශනයකින් රවින්දර්න් ගේ රඳවා තබා ගැනීම " අන්තර් ජාතික මානවඅයිතිවාසිකම් පනතේ 9 සහ 10 යන වගන්ති වලට මෙන්ම, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 9, 14 වන හා 26 වන වගන්ති වලට පටහැනි බව" බවට එළඹෙන ලද තීන්දුව ප්‍රකාශ කරන ලදී. එම සංදේශනයේ දී, එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයේ නිර්දේශයන් වන ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ නීති හා විධිවිධාන, අන්තර් ජාතික නීතිය විශේෂයෙන්ම අන්තර් ජාතික මානව හිමිකම් නීතිය හා එකඟ විය යුතුය යන්න, ශ්‍රී ලංකා රජයට සිහිපත් කරන ලදී. මෙම ක්‍රියාකාරී කමිටුව රවින්දර්න් නිදහස් කරන මෙන් දෙවනවරටත් කරන ලද අභියාචනය 2011 සැප්තැම්බර් මස ශ්‍රී ලංකාණ්ඩුවට ඉදිරිපත් කළ අතර මේ දක්වා රජය විසින් ඊට ප්‍රතිචාරයක් දක්වා නැත.
ඔහු පසුව නැවත වරක් වැලිකඩ රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කරන ලද අතර හර්නියා සැත්කමකට භාජනය කළේය. එහිදී ලත් අත්දැකීම් සමග නැවත වරක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා ඉල්ලුම් නොකරන්නට රවින්දර්න් තීරණය කර සිටියි.

2011 ජනවාරි මස උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව[40] (මෙම කොමිෂන් සභාව 2010 මැයි මස ජනාධිපතිවරයා විසින් පත් කරන ලද්දේ 2002 සටන් විරාම ගිවිසුමත් හා

[40] උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව 2010 මැයි මාසයේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරනු ලබන්නේ ඒ වන විට එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කී මුන් විසින් පත් තරන ලද විද්වත් කමිටුවට පිළිතුරු වශයෙනී. බලන්න-ශ්‍රී ලංකාව: යුක්තිය අද නොවේ හෙට-ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් භාවේ අසමත්භාවය (සිංහල මාධ්‍යයෙන් නිකුත් කොට ඇත)) http://www.amnesty.org/en/library/info/ASA37/008/2011/en

2009 මැයි මාසයේ යුද්ධය අවසානවීමත් අතර, සිදුවීම් විමර්ශනය කොට, නැවත එබඳු සිද්ධීන් ඇති නොවනු පිණිස නීර්දේශ ඉදිරිපත් කිරීමටය. මෙම කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් කතෝලික පුජකවරයෙක්:

"එල්. ටි. ටි. ඊ. ය හා සම්බන්ධකම් ඇතැයි සැක කරන දවිඩ ජාතිකයන් සෑම කෙනෙක්ම වර්ෂයකට ආසන්න කාලයක් රඳවා ගෙන සිටියත් ඔවුන්ට එරෙහිව චෝදනා මේවන තෙක් ගොනු කොට නොමැත. සමහර දෙනෙකුට චෝදනා ඉදිරිපත් කළත් එම නඩු විභාගයන් වසර ගණනාවක් දිග් ගැස්සෙනු ඇත. ඕමන්තෙයි රැඳවුම් කඳවුරෙහි ත්‍රස්ත විමර්ශන ඒකකය භාරයේ සිටින රැඳවියන්ට නීතිඥ සාහය ලබා ගැනීමට, රතු කුරුස සංවිධානයේ හෝ ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් මුණ ගැසීමට හෝ අවසර නොලැබෙනවා පමණක් නොව ආගමික කටයුතු වල නිරත විමටවත් අවසරයක් නොලැබේ. ඥාතීන්ට මෙම රැඳවියන් බැලීම පිණිස යාමේදි දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන අතර, එක් වරකට කුඩා කාමරයකට 10 දෙනෙකු බැගින් රැස් කරන අතර, රැඳවියන් සමග කථාබහ කිරීමට සිදුවි ඇත්තේ ඉතාමත් අමානුෂික ලෙස කම්බි දැලක් හරහාය. ඥාතීන්ට සොයා බැලීම පිණිස රැඳවියන් ගේ තොරතුරු අඩංගු පොදු නාම ලේඛනයක් පිළියෙළ කොට නොමැති කම ද මහත් දුෂ්කරතායකි." යනුවෙන් ප්‍රකාශ කරන ලදී[41]

ශ්‍රී ලංකාවේ අත්තනෝමතික රඳවා තබා ගැනීම කොපමණ බරපතළ ප්‍රශ්නයක් දැයි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ අවසාන වාර්තාවේ නිර්දේශ වලින් ප්‍රකාශ වෙයි. බොහෝ සාක්ෂිකරුවන් නිල වශයෙන් වාර්තා කිරීමකින් තොරව රඳවා ගෙන සිටින පුද්ගලයින් පිළිබඳ තොරතුරු, මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කළෝය. මේ නිසා කොමිෂන් සභාව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් යම් කිසි පුද්ගලයෙක් සිය අත්අඩංගුවට ගැනීමේ දී, එසේ අත්අඩංගුවට ගත් බවට රිසිට් පතක් නිකුත් කිරීම හා ඒ පුද්ගලයා රඳවා තබන ස්ථානය සඳහන් කිරීම වැනි නීත්‍යානුකූල විධිවිධාන පිළිපැදිය යුතු බවට නිර්දේශ කරනු ලැබීය. තවදුරටත් මෙබඳු පුද්ගලයින් රඳවා තැබීය යුත්තේ නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ස්ථාන වල පමණක් බවත්, රැඳවියන් මුණ ගැසීමට ඒ පුද්ගලයා ගේ ආසන්නතම ඥාතීන්ට අවසර දිය යුතු බවටත් නිර්දේශ කරයි.

තවද, කොමිෂන් සභාව ඉදිරියට පැමිණි බොහෝ සාක්ෂිකරුවන් ඉතාමත් පැහැදිලිවම එල්. ටි. ටි. ඊ. ත්‍රස්තවාදය අවසන් කිරීමෙන් පසු, මහජනතාවගේ ප්‍රාර්ථනාව වන්නේ නීතිය හා සාමය පවත්වා ගෙන යාම ශ්‍රී ලංකාවේ සාමාන්‍ය නීතිය යටතේ නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් සිද්ධ වනවා දකින්නට බව ප්‍රකාශ කරන ලදී. කොමසාරිස්වරුන් හදිසි නීති රෙගුලාසි ඉවත් කිරීමේ ප්‍රතිලාභය සාමාන්‍ය සිවිල් ජනතාවට භුක්ති විඳින්නට ඉඩ ලැබෙනවා දැකීම සිය බව සඳහන් කරයි.

කොමසාරිස්වරුද ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් ඉතා දීර්ඝ කාලයක් රඳවා තබා ගෙන සිටින බව නීරීක්ෂණය කර ඇත. මේ සම්බන්ධයෙන් කොමසාරිස්වරුන් ස්වාධීන උපදේශක කමිටුවක් පත් කිරීමට නිර්දේශ කරන අතර, එම කමිටුව විසින් ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා මහජන ආරක්ෂක පණත යටතේ අත් අඩංගුවට ගත්තේදැයි නියාමන කළ යුතුයැයිද ප්‍රකාශ කරයි[42].

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව සිය අවසාන වාර්තාවේ රැඳවියන් ගේ ආරක්ෂාව හා අයිතීන් සුරැකීම පිණිස නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කොට ඇත. ඇත්ත

ශ්‍රී ලංකා ආණ්ඩුව උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වගවීම පිළිබඳ චෝදනාවන්ට එළඳයි ලෙස පිළිතුරු සපයන දේශීය විසඳුමක් බවත් ප්‍රචාරය කරන ලද අතර 2011 අප්‍රියෙල් මස නිකුත් කරන ලද විද්වත් කමිටු වාර්තාව විසින් නිර්දේශ කරන ලද ස්වාධීන අන්තර් ජාතික අපරාධ විමර්ශනය අනවශ්‍ය බව කියා සිටීමට රජය විසින් භාවිතා කළ ප්‍රධාන මෙවලම විය.

[41] උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද සාක්ෂි- Transcript No. LLRC/FV/08-01-11/01.

[42] -උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභා වාර්තාව- 164 වන පිටුව (ඉංග්‍රිසි පිටපත)

වශයෙන්ම මෙම නිර්දේශ පිළි ගෙන ක්‍රියාත්මක කරනු ලබන්නේ නම්, ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික වගවීම් කෙරෙහි විශේෂයෙන්ම සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියට සිය දායකත්වය පිරිනැමුවා යැයි සතුටු විය හැක. පහත දැක්වෙන්නේ උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව විසින් මෙම විෂය සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන නිර්දේශ කිහිපයකි.

- යම් පුද්ගලයෙක් අත් අඩංගුවට ගනු ලැබූ වහාම මහේස්ත්‍රාත්වරයෙක් වෙත ඉදිරිපත් කොට නීතියේ දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු කිරීම;
- යම්කිසි රැඳවියෙකු රඳවා සිටින ස්ථානය වෙනස් කරනු ලබන්නේ නම් ඒ පිළිබඳව වහාම ඒ පුද්ගලයා ගේ ආසන්නම පවුලේ උදවියට හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය;
- මහේස්ත්‍රාත්වරයා පුද්ගලයින් රඳවා තිබෙන මධ්‍යස්ථාන මසකට වරක් පරීක්ෂා කළ යුතුය;
- රැඳවියන් නිදහස් කිරීම අධිකරණයක් මඟින් කළ යුතුය;

යම් කිසි අත්අඩංගුවට ගැනීමක් සම්බන්ධ වාර්තා තබා ගැනීම පොලිසිය විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැරීම හා යම්කිසි පැහැර ගැනීමක් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට අසමත් වෙයි නම් හෝ ඒ පුද්ගලයා අපරාධ නීතිය ප්‍රකාර වරදක් කළා සේ සළකා ඒ නිලධාරීයාට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කළ යුතුය[43].

ඉදිරිපත් කර තිබෙන නිර්දේශයන් රැඳවියන් සම්බන්ධයෙන් නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටියට අනුව ක්‍රියා කිරීම පිළිබඳව ඉතා වැදගත් වන නමුත්, මෙම නිර්දේශ නව නිර්දේශ වශයෙන් හැඳින්වීමට නොපුළුවන. ශ්‍රී ලංකාවේ ආණ්ඩු පසුගිය 20 වසරක තරම් කාලයක් මුළුල්ලේම රැඳවියන් ගේ මූලික ආරක්ෂාව සම්බන්ධයෙන් මේ වැනි නිර්දේශ ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කර ඇතැත් මේ දක්වා කිසිදු ප්‍රගතියක් පෙන්වා නොමැත. වර්තමාන ශ්‍රී ලංකා රජය, අන්තර් ජාතික මානව අයිතිවාසිකම් නීති ප්‍රමිතීන්ට ප්‍රතිවිරුද්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ හා රඳවා තබා ගැනීමේ නීති හා රෙගුලාසි අහෝසි කිරීමත්, සාමාන්‍ය නීතියට පිටින් ක්‍රියාකරන නිලධාරීන්ට විනයානුකූලය ක්‍රියාකරමින් රැඳවියන් ගේ මූලික ආරක්ෂාව සහතික කිරීම සම්බන්ධයෙන් මීට පෙර ආණ්ඩු වලට වඩා ඉදිරි පියවරක් තබනු ඇතැයි විශ්වාස කළ නොහැකිය.

රැඳවුම් භාරයේ දෙවසරක් : වධහිංසා පමණයි, චෝදනා ඉදිරිපත් නොකෙරේ..

මධ්‍යම පළාතේ පදිංචි, තිස් හැවිරිදි "රෝෂාන් "(ආරූඪ නාමය) වෙළඳ නෞකාවක නැවියෙක් වශයෙන් සේවයට බැඳිම පිණිස අවශ්‍ය වෛද්‍ය වාර්තා රැගෙන යමින් සිටිය දී 2008 ජුනි මස දී පැහැර ගැනීමක විලාශයෙන් අත්අඩංගුවට ගන්නා ලදී. තමාට මාංචු දමා, ඇස් බැඳ වෑන් රථයකට බලහත්කාරයෙන් ඇතුළ් කර ගත් දමරිකයන්, සිවිල් ඇඳුමෙන් සැරසුන පොලීස් නිලධාරීන් බව අනාවරණය වුයේ පසුවය. ඇස් බැඳුම් හා මාංචු ගලවා කාමරයකට දමා දෙර අගුලු ලෑමට පෙර ඔහුට ඉතා බරපතළ ලෙස පහර දෙන ලදී. තමාට ඇසුන නැව් වලින් පිටවන සයිරන් හා එන්ජින් හඬින්, තමා රඳවා තබා ඇත්තේ කොළඹ වරාය ආසන්න ස්ථානයක බව ඒත්තු ගියේ යැයි, ඔහු කොළඹ සිටින සිය නීතිඥවරයාට ප්‍රකාශයක් කරමින් කියා සිටියේය. " රෝෂාන් " මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීමට

[43] ඉහත කී වාර්තාව 171 වන පිටුව

පෙර දින 28ක් මෙලෙස රඳවා ගෙන සිටියේය. තමා එල්. ටී. ටී. ඊ. සංවිධානයේ සාමාජිකයෙක් බවත්, එල්. ටී. ටී. ඊ. මිල්ටරි බුද්ධි අංශය සමග සම්බන්ධතා තිබෙන බවටත් පොලිසිය විසින් චෝදනා කරන ලද නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කරයි. එහෙත් තමා 2002 දී එල්. ටී. ටී. ඊ. ය විසින් පැහැර ගත් බව පිළිගත් නමුත් තමා ඉන් පසු ත්‍රස්තවාදී කටයුතු වල නිරත වුයේය යන්න පි.විසිනි. ඔහු රඳවා සිටින වරාය ආසන්නයේ ඔහු රඳවා සිටින ස්ථානයේ සිට දැස් බැඳ, මාංචු සහිතව ඊට පසු සතියකට වරක් පවුලේ උදවියට පෙන්වීම පිණිස ගෑන්ඩ්පාස් පොලිසියට රැගෙන එන ලදී. පවුලේ උදවියට ප්‍රථම වරට ඔහු මුණ ගස්සවන ලද අවස්ථාවේ ඔහුට කරන ලද වධහිංසා හේතු කොට ගෙන ඇවිදීමට හැකියාවක් නොවීය.

2008 ජුලි මාසයේ දී කොළඹ මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, " රෝෂාන් " කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ භාරයට පත් කරන ලදී. 2008 නොවැම්බර් 13වන දින නැවත වරක් කොළඹ මැගසීන් රිමාන්ඩ් බන්ධනාගාරයට මාරු කරන ලදී. මෙදින ඔහු ඇතුළු දුවිඩ සිරකරුවන් 8 දෙනෙකුට සිංහල සිරකරුවන් විසින් බරපතල ලෙස පහර දෙන ලදී. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ලිපියක් ඉදිරිපත් කළ " රෝෂාන් " එම පහර දීම සම්බන්ධයෙන් බන්ධනාගාර නිලධාරීන් වගකිව යුතුයැයි කියා සිටියේය. තමා ඇතුළු දුවිඩ සිරකරුවන් 8 දෙනා ගේ නම් අනෙක් සිංහල සිරකරුවන් ඉදිරියේ හඬ නගා කිය වූ බවත්, ඉන් පසු සිංහල සිරකරුවන් තමන්ට බරපතල ලෙස පහර දුන් බවත්, " රෝෂාන් " සඳහන් කරයි.

" රෝෂාන් අවසානයේ දී මුලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කරමින් තමා චෝදනාවකින් තොරව අත්අඩංගුවේ තබා ගෙන සිටීම හා බන්ධනාගාරයේ දී කළ පහර දීම් අභියෝගයට ලක් කළේය. ආරක්ෂක අංශ විසින් සිය පවුල වෙත එල්ල කරන ලද තර්ජන හා බන්ධනාගාර නිලධාරීන් තමාට එල්ල කරන ලද තර්ජන ද හමුවේ මුලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරියට ගෙන ගිය ඔහු අවසානයේදී නිදහස් ලැබීමට සමත් විය. බන්ධනාගාරයෙන් නිදහස් වූ ඔහු අවසානයේ දී විදේශ ගත වීය.

වධහිංසා පැමිණවීම

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට අනුව යම් පුද්ගලයෙකුට වධහිංසා පැමිණවීම හා වෙනත් අවමන් සහගත සැලකිලි වලට භාජනය කිරීම සපුරා තහනම් වන අතර, විශේෂයකින් තොරව සෑම අවස්ථාවකටම පොදුවේ. ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති මානව හිමිකම් පනත්[44], සිරිත් බැඳී අන්තර් ජාතීය නීතිය[45], ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කළ අනුව ශ්‍රී ලංකා රජයට හා රජයේ නිලධාරීන්ට කිසිම අවස්ථාවක දී කිසිම පුද්ගලයෙකුට අනෙකුත් කාරණා අතර, වධහිංසා පැමිණවීම හා වෙනත් අවමන් සහගත ලෙස සැලකීම කළ නොහැකිය. මීට අමතරව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් සම්මත කර ඇති වධ හිංසාවන්ට එරෙහි සම්මුතිය මඟින් ද වධ හිංසා පැමිණවීම හා වෙනත් අවමන් සහගත සැලකිලි වලට පුද්ගලයින් ලක් කිරීම තහනම්ය[46].

---

[44] -මීට සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ 4වන හා 7 වන වගන්තිද, වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකිරීමේ සම්මුතිය ද ඇතුළත්ය.

[45] -See for instance Nigel S Rodley and Matt Pollard, " The Treatment of Prisoners under International law" Oxford University Press, 2009 P 81

[46] -1994 අංක 22 දරණ වධ හිංසා හා වෙනත් කෲර,අමානුෂික හා අවමන් සහගත සැලකිලි වලට එරෙහි සම්මුතිය: නමුත් 2009 දී ශ්‍රී ලංකික නීතිඥවරියක් වන ක්‍රීෂාන්ති පින්ටෝ සඳහන් කරන පරිදි " වධහිංස පැමිණවීම බරපතළ අපරාධයක්

ජිනීවා සම්මුතියට[47] අනුව යුද්ධයක් පවතින අවස්ථාවකදී වුවත්, වධ හිංසා පැමිණවීම හා අවමන් සහගත සැලකිලිවලට ලක් කිරීම "යුද්ධ අපරාධයක්" වශයෙන් විශ්ව සාධාරණීය ලෙස දඬුවම් කළ හැකි අපරාධයකි. මෙම සම්මුතීන් සාමාන්‍යයෙන් අන්තර් ජාතික යුද්ධ තත්වයන්ට අදාළ වුවත්, සම්මුතීන් හතරෙහිම තුන්වන වගන්තිය ශ්‍රී ලංකාවේ පැවති ආකාරයේ "අන්තර් ජාතික නොවන ආකාරයේ ගැටුම්" වලට අදාළ වේ. ඒ අනුව සෑම අවස්ථාවකම රැඳවියන් හට මානුෂික ලෙස සැලකිය යුතුවාක් මෙන්ම වෙනත් කාරණා අතර, "වධහිංසා වලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ යැයි පිළි ගැනේ.

වධහිංසා පැමිණවීම හා වෙනත් අවමන් සහගත සැලකිලිවලට ලක් කිරීම යුද්ධ අපරාධයක් වන අතර, රෝම ආඥාවට අනුව අන්තර් ජාතික අපරාධ අධිකරණය ඉදිරියේ විනිශ්චය කළ හැකි මානව සංහතියට එරෙහි අපරාධයකි.[48]

ශ්‍රී ලංකාවේ සෑම රැඳවියෙක්ම විශේෂයෙන්ම 2009 යුද්ධයෙහි අවසාන භාගයේදී හමුදාවට භාර වූ තැනැත්තන් දීර්ඝ කාලයක් වධ හිංසාවලට,කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිලි වලට හා දඬුවම් වලට යටත් කරන ලදී. ෆිරිඩම් ෆෝර්ම් ටෝර්චර් සංවිධානය හෙළිදරව් කරන ආකාරයට යුද්ධයේ අවසාන භාගයේ "රජයට භාරවූවන්" වධ හිංසාවලට භාජනය කිරීම ශ්‍රී ලංකික බලධාරීන් විසින් පුරුද්දක් වශයෙන් කරන ලදී[49].

2009 යුද්ධය අවසාන කාල පරිච්ඡේදයේ දී එක්කෝ රජයට භාර වූ එසේත් නැත්නම් ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත් පුද්ගලයින් එල්. ටී. ටී. ඊ. සැකකරුවන් වශයෙන් හඳුනා ගැනීම පිණිස අනුගමනය කරන ලද ක්‍රම අතර, ඉතාමත් අපකීර්තිමත් ක්‍රමය වූයේ " ගෝනි බිල්ලා " ක්‍රමයයි. එහිදී ගෝනියකින් මුහුණ වසා ගත් පුද්ගලයෙක් ඉදිරිපිටට අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් පෙළ ගස්වා ඉදිරිපත් කළ අතර, ඒ පුද්ගලයා හිස වැනිමෙන් යම් රැඳවියෙක් එල්. ටී. ටී. ඊ. සම්බන්ධතා ඇත්තෙක් ද නැත්තෙක් දැයි තීරණය කරන ලදී. මෙහිදී එල්. ටී. ටී. ඊ. සැකකරුවන් වශයෙන් හඳුනා ගන්නා පුද්ගලයින් වෙනත් රැඳවුම් මධ්‍යස්ථාන කරා ගෙන ගිය අතරඋ ඔවුහු වධහිංසා වලට ගොදුරු වුවෝය.[50]

තවත් එක් රැඳවියෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට තොරතුරු සපයමින් කියා සිටියේ තමන් කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකය මඟින් අත්අඩංගුවට ගෙන කිහිප වතාවක්ම

ලෙසට නම් කරමින් නිවර්තකයක් ලෙසට මෙම පණතෙන් කරන බලපෑම ඉතාමත් අල්පය. ඇය සඳහන් කරන පරිදි මෙමපණත ක්‍රියාත්මකව පැවති පළමු 15 වසර තුළ දී තිදෙනෙක් පමණක් වැරදිකරුවන් වන අතර දාහත් දෙනෙක් තමන්ට තිබූ චෝදනා වලින් නිදහස් වී ඇත." See, Kishali Pinto-Jayawardena, " The Rule of in Decline; Study on Prevalence, Determinants and Causes of Torture and Other Forms of Cruel, Inhuman or Degrading Treatment or Punishment in Sri Lanka" Published by The Rehabilitation and Reserch Centre for Torture Victims, May 2009

[47] ජිනීවා සම්මුතිය තෙවන කොටස 130 වගන්තිය හා හතරවන කොටස 147 වන වගන්ති

[48] Rome Statute of the International Criminal Courts, Art 7(1)(f) (Torture) and 7 (1) (k) (other inhumane acts-both as crimes against humanity) Art 8 (1) (Torture or inhuman treatment as war crimes) http://www.icc-cpi.int/NR/rdonlyres/ADD16852-AEE9-4757-ABE7-9CDC7CF02886/283503/RomeStatutEng1.pdf.

[49] 2006 දී සංශෝධිත අංක 1462/8 දරණ ගැසට් පත්‍රයෙන් සංශෝධනය කරන ලද 2005 හදිසි අවස්ථා රෙගුලාසි මාලාවේ 7 වන වගන්තියට අනුව, " බාර වන්නන්" පුනරුත්ථාපනය පිණිස කිසිදු චෝදනාවක් ඉදිරිපත් කිරීමකින් තොරව වර්ෂ දෙකක් වන තෙක් සිවිල් පරිපාලනය යටතේ රඳවා තබා ගැනීමට ඉඩකඩ සලසන ලදී. මෙම රෙගුලාසි මඟින් බාරවන්නන් යන්නට සිය කැමැත්තෙන් රජයට භාර වන්නන් පමණක් නොව ආරක්ෂක හමුදා විසින් යටත් කර ගන්නා ලද තැනැත්තන් ද ඇතුළත් වන පරිදි අර්ථ කථනය කර තිබුනි.

[50] Pettitt, J0 "*Out of the Silence: New Evidence of Ongoing Torture in Sri Lanka 2009–2011"*, Freedom From Torture, December 2011, http://www.freedomfromtorture.org/sites/default/files/documents/Sri%20Lanka%20Ongoing%20Torture_Freedom%20from%20Torture_Final%20Nov_07_2011.pdf, accessed 10 February 2012.

අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කරන ලද නමුත් තමාට කරන ලද වධහිංසා ඔහු විසින් වාර්තා නොකළ බවත්, පොලිස් නිලධාරීන් තමා ගේ වෛද්‍ය වාර්තාවේ දින වෙනස් කොට ඇති බව තම නීතිඥවරයා සොයා ගත් බවත්, කියා සිටියේය.[51]

හිටපු රැඳවියන්, රැඳවියන් ගේ පවුල් වල සාමාජිකයින් ගෙන් මෙබඳු වධහිංසා වලට භාජනය කිරීම පිළිබඳ පැමිණිලි "දුසිම් ගණනක්" ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත ලැබී තිබේ. වෙනත් මූලාශ්‍ර වලින් ලැබෙන සාක්ෂිත් සමග එක්ව ගත් කළ ශ්‍රී ලංකා බලධාරීන් එල්. ටී. ටී. ඊ. සම්බන්ධතා තිබුනේ යැයි සැක කරමින් සිය අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් ක්‍රමානුකූලව වධහිංසාවලට ලක් කරන බව සනාථ වේ. ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල නොවන රඳවා තබා ගැනීම්, වධ හිංසාවලට හා වෙනත් කෲර අමානුෂික අවමන් සහගත ලෙස සඅත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින්ට සැලකීම බුද්ධි තොරතුරු රැස් කිරීමේ ප්‍රධාන මෙවලමක් බවට පත් වී තිබේ.

දහත් වියැති ළමයෙකු වධ හිංසාවලට ලක් කිරීම:

2008 ජනවාරි මාසයේ දී දහසය වියැති කුමාර (අන්වර්ථ නාමයකි) බලහත්කාරයෙන් එල්. ටී. ටී. ඊ. සංවිධානයට බඳවා ගන්නා ලද්දේය. 2009 අප්‍රියෙල් මාසයේ දී ඔහු සිටි එල්. ටී. ටී. ඊ. කඳවුරට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙන් ප්‍රහාරයක් එල්ල කරන ලද අතර, එහිදී තවමත් බාලවයස්කාරයෙක් වූ කුමාර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අත්අඩංගුවට ගත්තේය. උතුරේ රැඳවුම් මධ්‍යස්ථානයන් හි වධ හිංසාවලට ලක් කරමින් මාස 18 රඳවා ගෙන සිටි කුමාඅවසානයේ දී 2010 ඔක්තෝබර් මස කොළඹ වැලිකඩ බන්ධනාගාරයට මාරු කළේය. කුමාර කිසිම දිනයෙක මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකළ අතරඋ කිසිදු වරදක් සම්බන්ධයෙන් අධිචෝදනා ඉදිරිපත් කිරීමක් ද නොවීය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත කුමාර විසින් සපයන ලද ලිඛිත දිවුරුම් ප්‍රකාශනයේ පිටපතක් ඔහු ගේ නීතිඥවරයා විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත ලබා දෙන ලද අතරඋ පහත දැක්වෙන්නේ එයින් උපුටා ගත් කොටස්ය.

මම එල්. ටී. ටී. ඊ. සංවිධානයෙන් පළා ගොස් දින දෙකකට පසු පුදුමතලාන් වෙත ගමන් කරද්දී මාව යුද්ධ හමුදාව විසින් අත්අඩංගුවට ගත්තා. මේ කාලයේ යුද්ධය ඉතාමත් දරුණු විධියට තිබූ අතර, වෙඩි තබා ගැනීම් හා කෑකෝ ගැසිම් හැම පැත්තේන්ම ඇහුනා. එල්. ටී. ටී. ඊ. පාලන ප්‍රදේශයේ සිට පැමිණෙන පුද්ගලයින් යුද්ධ හමුදාව විසින් පරීක්ෂාවට ලක් කරමින් අපි සිවිල් වැසියන් ද එසේ නැත්නම් එල්. ටී. ටී. ඊ. භටයින් දැයි සොයා බැලුවා. මාවත් මෙහිදී අත්අඩංගුවට ගත් අතරඋ මා මෙන්ම තවත් අය සිවිල් වැසියන් ගෙන් වෙන් කොට රඳවා ගත්තා.

කුමාර අධිකරණ බාහ්‍ය ඝාතන සියැසින් දැක තිබේ.

මම යුද්ධ හමුදාව විසින් මිනිසුන් ගෙන් ප්‍රශ්න කර හැටි දැක්කා. එක් මනුස්සයෙකු ගෙන් ඇහුව්වා තමුසේ මොකද කරන්නේ එල්. ටී. ටී. ඊ. කාරයෙක් නේදැයි ඇසුවා. ඔහු කිව්වා නෑ මම ඒ ගොල්ලෝ ළඟ කුලී වැඩ කළා පමණයි කියලා කිව්වා. පලයන් යන්න බොරු නොකියා කියලා කියපු ඒ හමුදා භටයා ඒ මනුස්සයා ගේ ඔළුවටත් ඇඟටත් වෙඩි තිබ්බා.

මාව අත් අඩංගුවට ගත්තාට පස්සේ ඔවුන් මගේ දැස් ගැට ගසා යුද්ධ හමුදා ට්‍රක් රථයක් තුළට නංවා ගත්තා. ඒ ඇතුළේ වෙස් මුහුණක් පැළඳ ගත් හමුදා භටයෙක් සිංහලෙන් මගෙන් විස්තර ඇහුව්වා. මම එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙක් නොව සාමාන්‍ය සිවිල් වැසියෙක් බව මම

[51] සම්මුඛ සාකච්ඡාවක් (මූලාශ්‍රය රහසිගතයි)

ඔවුන්ට කිව්වා. පැය හතරක් පහක් විතර ගමනකින් පස්සේ මාව රම්බිකුලම් කියන හමුදා කඳවුරට ගෙන ආවා. මගේ දැස් විවෘත කළ පසු මම දැක්කා මං වගේම තරුණ අය තව කිහිප දෙනෙක් එතන හිටියා.

කුමාර යුද්ධ හමුදා කඳවුරට ඇතුල් කළ පසු වධ හිංසාවලට ලක් කරමින් ප්‍රශ්න කරන ලදී.

මාව අනෙක් අය ගෙන් වෙන් කර තනිවම කාමරයක රඳවා තැබුවා. මගෙන් ප්‍රශ්න කරන අතර වාරේ මගේ අත් ගැට ගසා තැබුවා. ඔවුන් මගෙන් මම කොපමණ කාලයක් එල්. ටී. ටී. ඊ. සංවිධානයේ හිටියාද? මගේ නායකයෝ කවුද? ඒ ගොල්ලෝ සටන් කරන්නේ මොන ඉසව්වේද? ප්‍රභාකරන් ඉන්නේ කොහේද? හා මම මොන මොන සටන් වලට සහභාගී වී තිබෙනවාද? අයුධ සඟවා තිබෙන්නේ කොහේද? යන වගේ ප්‍රශ්න මගෙන් ඇහුව්වා. ඔවුන් මගේ සම්පූර්ණ නම උපන් දිනය මගේ පවුලේ සාමාජිකයින් ගේ විස්තර ඔවුන් ගේ ලිපිනයන් යනාදියත් මගෙන් ඇහුව්වා. මට දෙන්න තිබුනේ මගේ පරණ ලිපිනය. දෙමාපියන් කොහේ ඉන්නවාදැයි මා දන්නේ නෑ කිව්වා.

ප්‍රශ්න කරන අතරතුරේ දී ඔවුන් මට පහර දුන්නා. ප්‍රශ්න කරන අතරතුරේදීත් ඔවුන් මට පහර දුන්නා.

ඇත්තටම මම එල්. ටී. ටී. ඊ. විසින් රඳවා ගෙන සිටිය නිසා මම නායකයන් ගේ නම් විතරක් නෙවෙයි ආයුධ පවා සඟවා තිබෙන තැන් දැන ගෙන සිටියා. නමුත් මම කිව්වේ නෑ. මම කිව්වේ නැත්තේ කිව්වා නං මාවත් අර මනුස්සයා වගේ මරා දමනවා.

කුමාර තමා සතියක් මුළුල්ලේම වධ හිංසාවලට ලක් කළ බව කියා සිටියා.

සොල්දාදුවෝ මගේ සෙල් එකට ආවා. සමහර විට එක් කෙනෙක්. සමහර විට තුන් දෙනෙක්. සුමානෙකට තුන් හතර පාරක් මගෙන් ප්‍රශ්න කරන ගමන් මාව වධ හිංසාවලට ලක් කළා. මාව අත්අඩංගුවට අර ගෙන සුමාන තුනකට එහෙම නැත්නම් හතරකට පස්සේ මට සිංහලෙන් ලියවිල්ලක් දීලා අත්සන් කරන්න කිව්වා. ඒ ලියවිල්ලේ උඩින්ම ශ්‍රී ලංකා ලාංඡනය ගහලා තිබුනා. මම එය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළාම නැවතත් ඔවුන් මට පහර දුන්නා. තවත් මාසයකට විතර පස්සේ ඔවුන් මගේ ඇඟිලි සලකුණු ගත්තා.

ඔවුන් මට පහර දුන්නේ එස්-ලෝන් බටයකින්. මගේ අත් කකුල පිටු පස්ස ඉස්සරාහ පැත්ත මුළු ඇඟම සිගරට් කොට වලින් පිච්චුවා. මට විසී වෙන්ඩ පයින් ගැහුව්වා. මගේ සෙල් එකේ කිසිම ආලෝකයක් තිබුනේ නෑ. තද කළුවරයි. ජනේල නැහ. මම නිකංම සිමෙන්ති පොලොව උඩ නිදා ගත්තා. මට බොන්නඩ වතුර ඉල්ලුවාට දෙන්නේ නෑ. මට එළියට ගිහින් නාන්න විතරක් අවසර තිබුනා.

කුමාර හුදකලාව සිර කොට තැබූ අතර, ඔහුට සංදේශනය කිරීමේ අවසරය අහිමි කෙරිණ.

මට කිසිම කෙනෙක් එක්ක කථා කරන්නට අවසර තිබුනේ නැහ. මාව බලන්නට කිසිම ආගන්තුකයෙක් ආවේත් නෑ. මම හිතනවා මම හිටපු කඳවුරේ තවත් රැඳවියන් සිටියා. මට හැමදාම මිනිස්සු කෑ ගහන ශබ්දය ඇහෙනවා. ඒ අය වධ හිංසාවලට ලක් කළ බව මට විශ්වාසයි . මට එක පාරක් දෙපාරක් විතර වෙඩි ශබ්දයත් ඇහුනා.

කුමාර තමා 2010 අප්‍රියෙල් දක්වා රඳවා සිටි බව කියයි.

සිවිල් වැසියන් රඳවා සිටියේ අවතැන් වුවන් ගේ කඳවුරු වල. නමුත් මාව රඳවා ගෙන හිටියේ යුද්ධ හමුදා කඳවුරේ සිර මැදිරියක. ඒක සම්පූර්ණයෙන් ම වෙනස් තත්වයක්. මම

නාන්න එළියට ගියාම මම දකින්නේ හැම තැනම සොල්දඳුවෝ. මුළු කඳවුරම ඉතා උස කම්බි වැටකින් වට කරලා තිබුනේ. මුළු අවුරුද්ද පුරාම සොල්දඳුවෝ හැරෙන්නට මං වගේ ම රඳවා ගෙන හිටපු සිවිල් මිනිස්සු හතර පස් දෙනෙක් තමයි මම දැක්කේ. අපිට නාන්න තිබුනේ එළිමහන් තැනක. හමුදා රැකවල් ලා ගෙන සිටිය නිසා මට ඒ මිනිස්සුන්ට කථා කරන්න පුළුවන් කමක් තිබුනේ නෑ. නමුත් මම දැක්කා ඒ මිනිස්සුන් ගේ ඇඟවලත් තුවාල පැල්ලම් තියෙනවා.

2010 අප්‍රියෙල් මාසයේ දී කුමාර වවුනියාව ආසන්න රැඳවුම් කඳවුරකට මාරු කරනු ලැබුවා. නැවත වතාවක් වධ හිංසාවලට ගොදුරු වූ කුමාර මෙවර තමන් සිරභාරයට ගත් තැන්තන් ගේ ලිංගික අතවරවලටත් ගොදුරු වුනා.

2010 අප්‍රියෙල් මාසයේදී මා වෙල්ලිකුලම් යුද්ධ හමුදා කඳවුරට ගෙන විත් ඔක්තෝබර් දක්වා එහි රඳවා තැබුවා. මාව ගෙන ආවේ ඇස බැඳ අත් ගැට ගසා ගෙන. මාව මාරු කළේ ඇයිදැයි මා දන්නේ නෑ. මාව ආයෙත් කළුවර කාමරයකට දැම්මා. දෙරේ තිබුන පුංචි සිදුරකින් කෑම ඇතුලට තල්ලු කළා. ඒ හැරෙන්න ඒ කාමරයට ජනේලයක් වත් විදුලි ආලෝකයවත් තිබුනේ නෑ. මාව රැගෙන ආපු දිනයට පසු දින සොල්දඳුවෝ දෙන්නෙක් ආවා. ඒ ගොල්ලෝත් කලින් කඳවුරේ අය අහපු ප්‍රශ්නම නැවතත් ඇහුවා. මම එදා දීපු උත්තරම තමයි ආයෙත් දුන්නේ. ඔවුන් එකම ප්‍රශ්නය කිහිප වතාවක් ම අහනවා. නමුත් මම කියන උත්තර ඒ ගොල්ලෝ විශ්වාස කළේ නෑ. ඒ නිසා ඔවුන් මාව වධ හිංසාවලට ලක් කළා. මම බොරුකාරයෙක් කියලා මුළු ඇඟම සිගරට් කොට වලින් පිච්චුවා. හමුදා භටයින්ට හිතෙන හිතෙන වේලාවට ඔවුන් මට පහර දුන්නා.

එක දවසක් සොල්දඳුවන් දෙදෙනෙක් කළුවර කාමරයට ඇතුල්වෙලා මට ඇඳුම් ගලවන්න කියලා ඔවුන් මගේ ලිංග ප්‍රදේශය අත ගාන්න උත්සාහ කළා. මම හයියෙන් කෑ ගහලා ඔවුන්ව පැත්තකට තල්ලු කළා. ඔවුන් මට බිම දමා ගෙන පහර දීලා පිටව ගියා.

ආයෙත් සුමාන තුනකට පස්සේ යලිත් ඔවුන් ආවා. එදත් කලින් වගේම මට ලිංගික අතවර කරන්න උත්සහා කළා. මම හයියෙන් කෑ ගහපු නිසා ඔවුන් මට පහර දීලා සිගරට් කොට වලින් මාව පුච්චලා ගියා.

2010 ඔක්තෝබර් මස කුමාර වැලිකඩ බන්ධනාගාරයට මාරු කළා. එහි ඔහු දෙසැම්බර් 25 දින තෙක් සිටියා. ඔහු මාරු කිරීමට පෙර තමන්ට කියවන්නට බැරි, සිංහල භාෂාවෙන් සකස් කරපු ලියවිල්ලකට අත්සන් කරන්නට බල කළා.

මම වැලිකඩට ගෙන ආ දවසේ මට මගේ නම සනාථ කරන්න සිද්ධ වුනා. මම හිතුවේ දෙවන හමුදා කඳවුරෙන් මේ විස්තර සියල්ලම මෙහාට එවන්න ඇති කියලා. යකඩ කම්බි සහිත කුඩා කාමරයක මාව සිර කළා. මම එතනත් හුදකලාව හිටියේ. ඉඳලා හිටලා එක්කෙනෙක් දෙන්නෙක් මගේ කාමරයට දැම්මත් ඉක්මනින් ඔවුන් එතනින් මාරු කළා.

කුමාර තමාට වැලිකඩදීත් අවමන් සහගත ලෙස සැලකූ බව කියා සිටින අතර, මෙහි තත්වය හමුදා කඳවුරු වල තරම් නරක නැතැයි කියයි.

මට සතියකට දෙපාරක්වත් පහර දෙනවා. එක්කෝ මගේ කම්මුලට ගහනවා. එහෙම නැත්නම් බැටන් පොල්ලෙන් ගහනවා. මට හුඟක් වේලාවට කෑම ලැබුනේ නෑ. ලැබුන කෑමත් කන්න පුළුවන් ඒවා නෙවෙයි. සිර මැදිරිය ඇතුළේම පනිවිටුවකට වැසිකිලි යන්නත් මුත්‍රා කරන්නත් ඕනෑ. මේ මුළු කාලයටම මට එළියට යන්න දුන්නේම නෑ. සතියකට වරක් වගේ මගෙන් ප්‍රශ්න කළා. ඒවත් අර මුළින් ම ආහපු ප්‍රශ්නමයි.

වැලිකඩ සිර ගෙදර සිටි වෙනත් සිරකරුවකු මඟින් සිය ඥාතීන් සොයා ගැනීමට සමත් වන කුමාර 2010 දෙසැම්බර් මස දී තැරැව්කරුවෙකුගේ උපකාරයෙන් සිරෙන් මිදී දිවයිනෙන් ද පලා ගියේය.

ඥාතීන් හෝ මිත්‍රයන් මුණ ගැසීමට ඉඩ නොදීම:

රැඳවියන් ගේ ඥාතීන් හා මිත්‍රයන් බහුතරයක් විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඇතුළු වෙනත් මානව හිමිකම් සංවිධානයවල අවධානයට යොමු කරන ලද වැදගත් කරුණක් නම්, රැඳවියන් දැනුම් දීමකින් තොරව නිල වශයෙන් රඳවා තිබෙන ස්ථානයන් ගෙන් ඉවත් කොට නිල නොවුන ස්ථානයන්ට මාරු කිරීම නිසා තමන් ඉමහත් අපහසුතාවයන්ට භාජනය වන බවයි. මේ නිසා සිය ඥාතියා හෝ මිත්‍රයා " රාජ්‍ය ව්‍යුහය" තුළ අතුරුදහන් වන බව ඒ පුද්ගලයා රඳවා සිටින්නේ ද ජීවතුන් අතර, සිටින්නේ ද යන්න පවා දැන ගැනීම දුෂ්කර වන බවයි.

හොංකොං හි පිහිටි ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මේ කාරණය සනාථ කරන නිදර්ශනයක් සපයයි.

හතලිස් අට හැවිරිදි ඇලෙක්සැන්ඩර් තයාෆරන්, මුලතිව් පුතුමතලාන් හි කම්කරුවෙක් වූ අතර, 1990 දී ෂෙල් වෙඩි ප්‍රහාරයක් නිසා පාදයක් අහිමි ව කෘතීම පාදයක් භාවිතා කරන්නේකි. 2009 යුද්ධයේ අවසාන අදියරේ දී තයාෆරන් සිය බිරිඳ හා දරුවන් හතර දෙනා සමග රජයේ හමුදා ප්‍රදේශයට කලපුව හරහා පලා යන්නට තැත් කළ අතර, ඔවුන්ට එහිදී එල්. ටී. ටී. ඊ. සාමාජිකයින් ද කැටුව යාමට එල්. ටී. ටී. ඊ. ය විසින් බල කළේය. 2009 අප්‍රියෙල් 17 දින, සිය බිරිඳ දරුවන් හතර දෙනා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගෙන යාපනය පුනරුත්ථාපන කඳවුරට යවන ලද අතර, වෙනත් බෝට්ටුවකට ගොඩ වී සිටි තයාෆරන් ද ශ්‍රී ලංකා නාවික හමුදා විසින් අත්අඩංගුවට ගත්තේය. සී සී කඩ වූ තයාෆරන් ගේ පවුල නැවත එකිනෙකා මුණ ගැසෙන්නේ 2009 දෙසැම්බර් මස 9 වන දින ගාල්ලේ බුස්සේ රැඳවුම් කඳවුරේදීය. ඒ යාපනය කඳවුරින් නිදහස් වූ තයාෆරන් ගේ බිරිඳ සිය අතුරුදහන් වූ සැමියා සිය දරුවන් සමග සොයා යන්නී, අවසානයේදී ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ පිළිසරණ සෙවීමේ ප්‍රතිඵලයක් වශයෙනී. එහිදී බලධාරීන් තයාෆරන් පිළිබඳ පරීක්ෂණ කටයුතු අවසන් නොවූ බවත්, එම පරීක්ෂණ කටයුතු අවසාන වූ වහාම ඔහු නිදහස් කරන බවත්, කියා සිටියේය. නමුත් මීට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ ක්‍රියාකළ බලධාරීන් 2010 ඔක්තෝබර් 8 වන දින තයාෆරන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කොට කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර ගත කළේය. තමා එල්. ටී. ටී. ඊ. සංවිධානයේ ආධාරකරුවෙක් යැයි ආරක්ෂක අංශ විසින් කරන චෝදනාව ප්‍රතික්ෂේප කළ අතර, ඔහුට එරෙහිව චෝදනා ගොනු කිරීමක් මේ වනතුරු සිදු නොවීය. ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාවේ නීරීක්ෂණය වන්නේ " ත්‍රස්ත විමර්ශන ඒකකය හිතාමතාම තයාෆරන් ගේ විමර්ශන කටයුතු ප්‍රමාද කරන" බවයි[52]

"පැහැර ගත්" ශිෂ්‍යාව ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් මතු වෙයි.

මානව හිමිකම් ක්‍රියාකාරීන්ට අනුව, විසි දෙහැවිරිදි පේරාදෙණිය සරසවියේ කලා අංශයේ ශිෂ්‍යාවක් වූ රාසයියා ද්වරකා 2009 නොවැම්බර් මස 12 වන දින "පැහැර" ගත් අතර, මාස

[52] - See " Sri Lanka: Disabled man illegally and arbitrarily detained for over two years" Asian Human Rights Commission, 16th August 2011. http://www.humanrights.asia/news/urgent-appeals/ahrc-uac-143-2011, accessed 16 February 2012.

දෙකක් යන තෙක් ඇය සිටින ස්ථානය සොයමින් සිටි ඇය ගේ දෙමාපියන්ට, අවසානයේදී මාස දෙකකට පසු ඇය මුණ ගැසෙන්නේ ත්‍රස්ත විමර්ශන ඒකකයට අයත් ගාල්ලේ බුස්සේ රැඳවුම් කඳවුරේදීය.
ද්වරකා කිලිනොච්චියේ ඉපද එහිම හැදී වැඩුන තැනැත්තියක් වන අතර, මලල ක්‍රීඩා සම්බන්ධයෙන් ඇයට සහජ නිපුණතාවයක් තිබිණ. පාසැලේ දී මෙන්ම කිලිනොච්චිය එල් ටි ටි ඊ පාලනය යටතේ තිබූ අවදියේ දී එල්. ටි. ටි. ඊ. විසින් සංවිධානය කරන ලද ක්‍රීඩා තරඟ වලට සහභාගි වී ත්‍යාග හා සහතික පත්‍ර දිනා ගත්තාය. මෙම සහතික පත්‍ර එල්. ටි. ටි. ඊ. ලාංඡනය සහිත ඒවා වූ අතර, විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දී සිය බාහිර කුසලතා සනාථ කිරීම පිණිස මෙම සහතික පත්‍ර විශ්ව විද්‍යාලයට බාර දෙනු ලැබින.
2009 නොවැම්බර් 12 වන දින ඇය රීදී පාට වෑන් රියකින් පැමිණි කණ්ඩායමක් විසින් ඇය පැහැර ගෙන ගත්තේය. 2009 නොවැම්බර් 16 වන දින සිය වැඩිමහල් සොහොයුරියට හා නැන්දනීයට ඇය මුණ ගැසීමට අවසර ලැබුන නමුත් 2010 ජනවාරි මස ගාල්ලේ බුස්ස රැඳවුම් කඳවුරේ දී ඇය මුණ ගැසෙන තෙක් ඇය රඳවා සිටින ස්ථානය හෙළිදරව් නොකරන ලදී.
ද්වරකා විසින් මුලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර, ඇය ඇප මත නිදහස් කිරීමට අධිකරණය තීන්දු කළ අතර, ඇය නැවතත් සරසවියට ඇතුළත් වූ නමුත් අඛණ්ඩවම ත්‍රස්ත විමර්ශන ඒකකයේ විමසුම යටතේ සිටින්නීය.

අත්අඩංගුවට ගනු ලබන පුද්ලයින්ට සිය ඥාතීන් හෝ මිත්‍රයින් සමග සංදේශනය ප්‍රතික්ෂේප කිරීම මඟින් ඒ පුද්ගලයාගේ අයිතිවාසිකම් අහිමි කිරීමක් පමණක් නොව 2007 දී ජනාධිපතිවරයා විසින් "හාර වන තැනැත්තන් " සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියෝග වලට පිටු පෑමක් ද වෙයි. එම නියෝග වලට අනුව (1) අත්අඩංගුවට ගනු ලබන තැනැත්තාට හා ඒ තැනැත්තා ගේ ඥාතීන්ට හා මිත්‍රයින්ට තමා හැඳුනුම් පත පෙන්වා හඳුන්වා දීම (2) අත්අඩංගුවට ගැනීමට හේතු පැහැදිලි කර දීම (3) අත්අඩංගුවට ගැනීම පිළිබඳව රිසිට් පතක් ඒ තැනැත්තා ගේ ඥාතීන්ට හෝ මිත්‍රයින්ට නිකුත් කිරීම[53]

මීට පෙර පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනයකින් ද අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින්ගේ ඥාතීන්ට හෝ මිත්‍රයින්ට එම අත්අඩංගුවට ගැනීම පිළිබඳ රිසිට් පතක් නිකුත් කිරීම ක්‍රියාත්මක නොවන්නා සේම ජනාධිපතිවරයා ගේ මෙම නියෝගය ද සම්පූර්ණයෙන්ම නොසලකා හැර තිබෙන්නකි.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බොහෝ සාක්ෂිකරුවන් තම ඥාතීන් හෝ මිත්‍රයින් කවරෙක් විසින් අත්අඩංගුවට ගන්නා ලද්දේ ද යන්න පමණක් නොව අත්අඩංගුවට ගනු ලැබූ පසු කවර ස්ථානයක රඳවා තබන්නේ ද යන්න පිළිබඳවත් තමන්ට නිසි තොරතුරු ලබා නොදෙන බව කියා සිටියෝය.

මුලතිව් හි පදිංචිකරුවෙක් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ප්‍රකාශයක් කරමින් " 2012 ජනවාරි මස වෛද්‍ය ශිෂ්‍යාවක් වූ සිය සොහොයුරා වව්නියාවේ අපරාධ පරීක්ෂණ

[53] " Secretary Defence re-circulates Presidential Directives on Protecting Fundermental Rights of Persons Arrested and or Detained" Minstry of Foreign Aaaairs, Colombo 24th April 2007. Ministry of Defence and Urban Development Website, April 25th 2007. , http://www.defence.lk/new.asp?fname=20070425_02, accessed, 16 February 2012.

දෙපාර්තුමේන්තුව විසින් රඳවා ගෙන සිටින බව ප්‍රකාශ කළේය. මම ඇත්ත වශයෙන්ම ඔහු කොහේ රඳවා ගෙන සිටින්නේ දැයි දන්නේ නෑ. මගේ ඥාතීන් කියන ආකාරයට ඔහුට තදින් පහර දී වධහිංසා පමුණුවා ඇති අතර, සිහිසුන්ව වව්නියා රෝහලට ගෙනවිත් තිබුනා. රෝහලට ඇතුල් කොට දින තුනකට පසු එහි සේවය කරන අපේ මිත්‍රයෙක් මගේ සහෝදරයා දැක අපට දැනුම් දුන්නා. එතකොටයි අපි දන්නේ ඔහු අත්අඩංගුවට අර ගෙන කියලා. අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව කිසිම අවස්ථාවක අපිට මේ බව දැනුම් දී නෑ"[54] .

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් ඉදිරිපත් කළ පැමිණිළි මඟින් ද මෙම ගැටළුවෙහි බරපතළකම මැනවින් ප්‍රදර්ශනය විය. උදහරණයක් වශයෙන් එක් පුද්ගලයෙක් කොමිෂන් සභාව ඉදිරියේ " මගේ පියා කොළඹට මාරු කළ විට අපි වව්නියාවේ සිට තාත්තා බලන්නට කොළඹට ආවා. ඒත් අපිට තාත්තා බලන්නට දුන්නේ විනාඩි පහක් විතරයි." මේ සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන කරුණු අවධාරණය කරයි.

" රැඳවියන් හා සංදේශනයට ඒ පුද්ගලයා ගේ ආසන්නතම ඥාතීයාට අයිතියක් තීබේ. එම නිසා එම අයිතිය යටපත් කරන යම්කිසි භාවිතයක් තිබේ නම් එය ඉවත් කළ යුතුය. ආසන්නතම ඥාතීවරයාට පවා තොරතුරු දෙනු ලබන්නේ වාචිකව බව කොමිෂන් සභාව විසින් නීරික්ෂණය කරන ලදී. සමහර විට ඉතා දුර බැහැර සිට පැමිණෙන පුද්ගලයන්ට පවා ආදෘළ රැඳවියා මුණ ගැසෙන්නට ඉඩ නොදෙයි. මේ නිසා බලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින්ගේ ආසන්නතම ඥාතීන්ට සිය පවුලේ සාමාජිකයා මුණ ගැසීමට අන්තර් ජාතික රතු කුරුස සංවිධානය හා වෙනත් ස්වේච්ඡා සංවිධාන වල සහයෝගය ද ඇතිව ඉඩ කඩ සලසා දිය යුතුයැයි මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි[55]

රැඳවියන් ගේ පොදු නාමලේඛණයක අවශ්‍යතාවය මානව හිමිකම් සංවිධාන විසින් දිගින් දිගටම පෙන්වා දෙන ලද කාරණයක් වන අතර, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව විසින් නිකුත් කළ අතුරු වාර්තාවෙන් ඊට එකඟත්වය පළ කොට තිබුන අතර සිය අවසාන වාර්තාවේ ඒ පිළිබඳව මේසේ සඳහන් කරයි.

"රැඳවියා ගේ ආසන්නතම පවුලේ අයට සිය ඥාතීයා පිළිබඳව තොරතුරු දැන ගැනීමේ අයිතියක් ඇත. මේ නිසා විස්තීරණ මධ්‍යම තොරතුරු මධ්‍යස්ථානයක අවශ්‍යතාවයක් පැහැදිලිව පෙනෙන අතර එම තොරතුරු මධ්‍යස්ථානය විසින් රැඳවියාගේ නම, රඳවා තිබෙන ස්ථානය ආදී තොරතුරු අවශ්‍ය වූ විට සැපයිය යුතුය."[56]

2004 දී ශ්‍රී ලංකා රජය විසින් එක්සත් ජාතීන් ගේ වධහිංසාවන්ට එරෙහි කමිටුව වෙත යවන ලද ප්‍රගති වාර්තා මඟින් රැඳවියන් ගේ තොරතුරු ඇතුළත් මධ්‍යම තොරතුරු මධ්‍යස්ථානයක් හා හදිසි ඇමතුම් දුරකථන අංකයක් පිහිටුවා තිබෙන බව කියා සිටියේය[57].

---

[54] සම්මුඛ සාකච්ඡාවක් (මූලාශ්‍රය රහසිගතයි)

[55] උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභා වාර්තාව 171 පිටුව (ඉංග්‍රීසි පිටපත)

[56] උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව 171 වන පිටුව (ඉංග්‍රීසි පිටපත)
http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201112/FINAL%20LLRC%20REPORT.pdf, accessed, 16 February 2012.

[57]-Committee Against Torture," Consideration of reports submitted by States Parties under article 19 of the convention, Sri Lanka" U.N.Doc.CAT /C/ 48/ Add.2 6 August 2004 Pages 7-8 paras 30-31
http://www.priu.gov.lk/news_update/Current_Affairs/ca201112/FINAL%20LLRC%20REPORT.pdf, accessed, 16 February 2012.

නමුත් ප්‍රායෝගිකව එබඳු තොරතුරු මධ්‍යස්ථානයක් හෝ දුරකථන අංකයක් භාවිතයේ නොවීය. 2011 මැයි මාසයේදී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ ඉල්ලීමට අනුව ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් සිය රැඳවුම් භාරයේ සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු ඔවුන් ගේ ආසන්නතම ඥාතීන්ට ලබා ගැනීම පිණිස තොරතුරු මධ්‍යස්ථාන තුනක් පිහිටුවන ලදී. 2011 ජුනි මාසයේ පළ වූ ශ්‍රී ලංකා මාධ්‍ය වාර්තාවන්ට අනුව, වව්නියාවේ මෙම තොරතුරු මධ්‍යස්ථානය විවෘත කළ පළමු දිනයේම සිය ගණනක් තොරතුරු ලබා ගැනීම පිණිස පැමිණි නමුත් එකී මධ්‍යස්ථානයට ලබා දිය හැකි වුයේ ඉතා සුළු තොරතුරු ප්‍රමාණයකි. ඊට හේතුව වශයෙන් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් දක්වන ලද්දේ තොරතුරු ඉල්ලා සිටි පුද්ගලයින් බොහොමයක් දෙනා අත්අඩංගුවට ගෙන තිබුනේ සිය ඒකකය විසින් නොවිමයි.[58]

නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමට ඉඩ නොදීම:

රැඳවියන්ට නීතිඥ සාහය ලබා ගැනීම විශේෂයෙන්ම ආරක්ෂක හේතූන් මත අත් අඩංගුවට ගනු ලබන පුද්ගලයින්ට පොලිසිය විසින් අවහිර කරනු ලබයි. සමහර විට සති මාස ගණන් දිග් ගැස්සෙන පොලිස් විමර්ශන පැවැත්වෙන කාලය අතරතුර කෙසේ වත් සැකකරුට නීතිඥ සාහය ලබා ගැනීමට ඉඩ දෙනු නොලැබේ. බුස්සේ සිට නිදහස් වූ රැඳවියන් තමන් මාස ගණනාවක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රඳවා සිටියත් තමන්ට නීතිඥ සාහය ලබා ගැනීමට අවසර නොදුන් බව ඔවුහු ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත කියා සිටියෝය.

සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 14 (3) ආ වගන්තියට අනුව අවම වශයෙන් " සිය විත්ති වාචකය සුදුනම් කර ගැනිමට තමා ව තෝරා ගනු ලබන නීතිඥයකු හා අදහස් හුවමාරු කර ගැනීමට ප්‍රමාණවත් කාලය හා පහසුකම් ලැබීමට" හිමිකමක් සෑම සාපරාධී වරදක් සම්බන්ධයෙන් චෝදනා ලබන සෑම කෙනෙකුටම හිමිකමක් ඇත්තේය ප්‍රකාශ වේ.

තමාට විරුද්ධව ඇති සාපරාධි චෝදනාව තීරණය කිරීමට පෙර නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීම අපරාධ යුක්ති විනිශ්චයේ දි ඉතාමත් වැදගත් වේ. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ 9 (4) වගන්තියට අනුව " සිරභාරයට ගැනීම හෝ රඳවා තබා ගැනීම හේතු කොට සිය නිදහස අහිමි වූ ඕනෑම කෙනෙකුට, ඔහු එසේ සිරභාරයෙහි රඳවා ගැනීමේ නීත්‍යානුකූලභාවය නොපමාව තීරණය කිරීමත් එම රඳවා තබා ගැනීම නීත්‍යානුකූල නොවන්නේ නම් ඒ පුද්ගලයා මුදා හැරීමට නියෝග කිරීමත් සඳහා අධිකරණයක් ඉදිරියෙහි නීති කෘත්‍යයක් ආරම්භ කිරීමට හිමිකම් ඇත්තේය. ස්වාධීන නීතිඥවරයකු ගේ සාහය ලබා ගැනීම මඟින් වධ හිංසාවලට හා වෙනත් කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් කිරීමට තිබෙන ඉඩ කඩ ඉතා අල්පය. මේ අනුව රැඳවියන් සම්බන්ධ එක්සත් ජාතීන් ගේ ප්‍රමිතිය විසින් නීතිඥවරයකු ගේ සාහය ලබා ගැනීමට තිබෙන අයිතිය තහවුරු වෙයි[59]

---

[58] "Missing Persons": Only 7% gets info" Daily Mirror 24 June 2011 http://www.dailymirror.lk/news/12099-only-seven-per-cent-get-information-on-detainees.html.

[59] බලන්න- කවර ආකාරයක හෝ රඳවා තබා ගැනීමටකට හෝ සිරකිරීමට ලක් වූ සියළු දෙනාගේ ම අයිතීන් පිළිබඳ මූලධර්ම සංහිතාවේ 18 වන මූලධර්මය:(1988 දෙසැම්බර් 9 වන දින එක්සත් ජාතීන් ගේ මහා මණ්ඩල යෝජනාව 43/173) සිරකරුවන්ට සැලකීම පිළිබඳ අවම රෙගුලාසි රෙගුලාසි 93 (1955 ජිනීවා හි රැස්වූ අපරාධ වැළැක්වීම හා සැකකරුවන්ට සැලකීම පිළිබඳ එක්සත් ජාතීන් ගේ පළමුවන සම්මේලනය සම්මත කරන ලද යෝජනාව) සහ 1957 ජූලි 31 වන සම්මත කළ 663 වන යෝජනාව හා 1977 මැයි 13 වන දින සම්මත කළ 2076 වන යෝජනාව.

> රඳවා ගෙන සිටින පුද්ගලයින් මුණ ගැසීමට ඔවුන්ට අවසර නොදීම, රැඳවියන් සම්බන්ධ ප්‍රශ්නයේ දී, ශ්‍රී ලංකාවේ නීතිඥවරු විසින් ඉදිරිපත් කරන එක් ගැටළුවක් වීය. නීතිඥවරුන්ට බුස්ස කඳවුරට පැමිණිය නොහැක. මම නීතිඥවරයක් නොමැතිව අවුරුද්දකට වැඩි කාලයක් හිටියා. ස්වාධීන නීතිඥවරුන්ට බුස්සේ කඳවුරේ රැඳවියන් මුණ ගැසීමට ඉඩ ප්‍රස්ථා දිය යුතුයි"[60] මෙම නීතිඥවරුන්ට සිය සේවා දයකයා සමග පුද්ගලිකව සාකච්ඡා කළ නොහැක. ත්‍රස්තවාදය නීවාරණය කිරීමේ පණත හෝ 2005 හදිසි නීති රෙගුලාසි රැඳවියන්ට නීතිඥ සාහය ලබා ගැනීමට තිබෙන අයිතිය නොසලකා හරින ලදී. උදාහරණයක් වශයෙන් 2005 හදිසි නීති රෙගුලාසි මඟින් රැඳවියන් " හමුවීම හා සංදේශනය" පොලිස්පතිවරයාගේ අභිමතය පරිදි තීරණය කරන්නක් වශයෙන් විධිවිධාන සලස්වා තිබූ බව පෙන්වා දිය හැකිය.[61]
>
> සිවිල් බලධාරීන් ගේ අත්අඩංගුවේ පසුවන රැඳවියන් සම්බන්ධයෙන් තත්වය අභිවෝදනා ඉතිරිපත් කිරීමට නියමිත රැඳවියන්ට වඩා භාත්පසින්ම වෙනස්ය. බුස්ස රැඳවුම් කඳවුරට ත්‍රස්ත විමර්ශන ඒකකයේ අවසරයකින් තොරව නීතිඥවරයෙකුට ඇතුළ් විය නොහැක. නමුත් ත්‍රස්ත විමර්ශණ ඒකකය අවසර පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඔවුන්ට අභිමත පරිදිය"[62]

නීතිඥවරු ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත සිය අදහස් දක්වමින් කියා සිටියේ "ආරක්ෂක හේතූන් මත අත්අඩංගුවේ සිටින පුද්ගලයින් මුණ ගැසීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර ලබා ගත යුතු අතරෘ එය ඉතාමත් ප්‍රමාදකාරී ක්‍රියාපටිපාටියක් වන වෙයි".

ඇත්ත වශයෙන්ම සිවිල් වැරදි සම්බන්ධයෙන් වන වැරදි සම්බන්ධයෙන් අත් අඩංගුවේ සිටින පුද්ගලයින් වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරුන්ට පවා සිය සේවාදයකයා මුණ ගැසීම ඉතාමත් දුෂ්කර කටයුත්තකී. බන්ධනාගාර ගත පුද්ගලයෙකු මුණ ගැසීමට පහසුකමක් තිබෙන්නේ ඒ පුද්ගලයාගේ ආසන්නම පවුලේ උදවියට වන අතර, නීතිඥවරුන්ට පවුල් වල එම සාමාජිකයින් මතය. යම් හේතුවක් නිසා රැඳවියෙකුට සිය පවුලේ සාමාජිකයින් තමා බැලීමට ඉදිරිපත් නොවන්නේ නම් ඒ පුද්ගලයාට නීතිඥ සාහය ලබා ගැනීමේ ගැටළුවක් ද ඇති වෙයි.[63]

2004 දී එක්සත් ජාතීන් ගේ සංවිධානයේ වධ හිංසාවලට එරෙහි කමිටුවට සිය වාර්තාව ඉදිරිපත් කළ ශ්‍රී ලංකා රජය " පොලිස් දෙපාර්තුමේන්තුව සැකකරුවන් ෑ මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමට පෙර ඒ පුද්ගලයාට නීතිඥ සාහය ලබා ගැනීමට තිබෙන අයිතියට තමන් විරුද්ධ නොවන නමුත්, පොලිසියට සිය මූලික විමර්ශනයන් කිසිදු අවහිරතාවයකින් තොරව කිරීම පිණිස ප්‍රකාශයක් සටහන් කර ගන්නා තුරු පිටස්තර කිසිවෙකුට සැකකරු මුණ ගැසිමට ඉඩ නොදෙන බව සඳහන් කළේය. සාමාන්‍යයෙන් ක්‍රියාත්මක වන ක්‍රමය නම් සැකකරු ගේ නීතිඥවරයාට ආදළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා

---

[60] සම්මුඛ සාකච්ඡාවක් (මූලාශ්‍රය රහසිගතයි)

[61] See PTA Section 11(5), see ER 19 (10) Gregory Norton, " The Emergency Regulations 2005" www.unchr.org./refword/pdfid/

[62] *"Joint Alternative Report from the Sri Lankan NGO Collective to the Committee Against Torture,"* 14 October 2011, p.12, http://www2.ohchr.org/english/bodies/cat/docs/ngos/NGOCollective_SriLanka47.pdf, accessed 15 February 2012.

[63] Harshi C. Perera, "*Justice Maker Study on Women Pre-trial Detainees in Sri Lanka*," p. 8, http://www.scribd.com/doc/66525603/JusticeMaker-2010-Study-on-Women-Pre-trial-Detainees-in-Sri-Lanka, accessed 19 February 2012.

මුණ ගැසී සිය සේවාදයකයාට එරෙහිව තිබෙන චෝදනා පිළිබඳව විමසා දැන ගැනීමට ඉඩ ලබා දීමයි"[64]

එක්සත් ජාතීන් ගේ සංවිධානයේ වධ හිංසාවලට එරෙහි කමිටුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිය නිගමන හා නිර්දේශ ප්‍රකාශයට පත් කරමින් නෛතික වශයෙන් මෙන්ම ප්‍රායෝගිකවත් නීතිඥ සාහය ලබා ගැනීම සම්බන්දයෙන් තිබෙන දුෂ්කරතා සම්බන්ධයෙන් සිය කණස්සල්ල ප්‍රකාශ කළේය.[65]. 2008 දී වධ හිංසාවලට එරෙහි එක්සත් ජාතීන් ගේ කමිටුවේ විශේෂ නියෝජිතවරයා ගේ ශ්‍රී ලංකා සංචාරයෙන් පසු සිය නිර්දේශ ඉදිරිපත් කරමින් බලධාරීන් " රැඳවියන්, හදිසි නීති රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගන්නා පුද්ගලයින් ද ඇතුළත්ව සියළුම රැඳවියන්ට පැය 24ක් ඇතුළත ඔවුන්ට නීතිඥ සාහය ලබා ගැනීමට ඉඩ කඩ සලසා දිය යුතු බවට නිර්දේශ කළේය."[66]

ශ්‍රී ලංකා අපරාධ විධිවිධාන සංග්‍රහයේ (1979 අංක 15) 257 වන වගන්තියට යම්කිසි චිත්තිකරුවෙක් අධිකරණයකදී නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීමට තිබෙන අයිතිය පිළි ගනී. නමුත් මෙම නීතිමය විධිවිධාන විසින් පුර්ව අධිකරණ අවස්ථාවේදී එනම් පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමේ සිට අධිකරණයට ඉදිරිපත් කරන තෙක් සැකකරුට නීතිඥ සාහය ලබා ගැනීමට තිබෙන අයිතිය පිළිබඳව සුවිශේෂයෙන් යමක් සඳහන් නොකරයි.

2007 අංක 42 දරණ අපරාධ විධිවිධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පණත මඟින් යම්කිසි තැනැත්තෙක් අත්අඩංගුවට ගෙන පැය 24කට වඩා රඳවා තබා ගෙන සිටින්නේ නම් ඒ පුද්ගලයාට අනිවාර්යෙන්ම නීතිඥ සාහය ලබා ගැනීමට අයිතියක් තිබෙන බවට පිළි ගන්නා ලදී.[67] මීට ඉහතද සඳහන් කළ පරිදි 2007 අංක 42 දරණ පනත 2009 දී අහෝසි වූ නමුත් පොලිසිය අත් අඩංගුවට ගනු ලබන පුද්ගලයින් පැය 48 රඳවා තබා ගැනීම තවදුරටත් සිදු වෙයි. එහෙත් එම සැකකරුවන්ට නීතිඥ සාහය ලබා ගැනීම සම්බන්ධයෙන් යම් වෙනසක් සිදු වූයේ ද යන්න පැහැදිලි නැත[68].

රැඳවියන්ට සංදේශනයට ඉඩ නොදීම හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම:

> " **මා අත්අඩංගුවට ගෙන තුන්වන හෝ හතරවන දින අන්තර් ජාතික රතු කුරුස සංවිධානයෙන් පැමිණියා. පොලිසිය මාව පරණ අබලන් වූ බස් රථයක් තුළ මාව සැඟවුවා. මාව සිටි එක අස්සේ ඔබා ගෙන හිටිය හින්ද, ඔවුන් මාව දැක්කේ නෑ"** [69]

සංදේශනයෙන් තොරව රඳවා සිටීම හෙවත් යම්කිසි රැඳවියෙකුට බාහිර ලෝකය සමග තොරතුරු හුවමාරු කිරීමට, විශේෂයේ ම නීතිඥවරයන් සමග, ස්වාධීන වෛද්‍යවරයෙකු මුණ ගැසීම එසේත් නැත්නම් අපක්ෂපාත අධිකරණයක පිළිසරණ සෙවීමට තිබෙන අයිතිය අහිමි කිරීම දීර්ඝ කාලයක සිට අන්තර් ජාතික ප්‍රජාව විසින් මානව හිමිකම් උල්ලංඝණයක් ලෙස සලකා හෙළා දකිනු ලැබේ.

---

[64] Committee Against Torture, "*Consideration of reports submitted by States Parties under article 19 of the Convention, Sri Lanka*," U.N. Doc. CAT/C/48/Add.2, 6 August 2004, page 9, para 38, http://www.unhchr.ch/tbs/doc.nsf/898586b1dc7b4043c1256a450044f331/763efd6dc17f7d10c1256f350053fe3f/$FILE/G0442277.pdf, accessed 15 February 2012.

[65] Committee Against Torture, "*Conclusions and recommendations of the Committee against Torture: Sri Lanka*," UN Doc. CAT/C/LKA/CO/3-4, 8 December 2011, para. 7.

[66] "*Report of the Special Rapporteur on torture and other cruel, inhuman or degrading treatment or punishment, Manfred Nowak: Mission to Sri Lanka*," UN Doc. A/HRC/7/3/Add.6, 26 February 2008, para. 94(b).

[67] Code of Criminal Procedure (Special Provisions) Act, No. 42 of 2007.

[68] Kelum Bandara, "Police can still detain suspects for 48 hrs; Minister says it's allowed under present regulations" *Daily Mirror*, 19 September 2011, page 1, http://print.dailymirror.lk/news/front-page-news/56639.html, accessed 17 February 2012.

[69] සම්මුඛ සාකච්ඡාවක් (මූලාශ්‍රය රහසිගතයි)

" දිර්ඝ කාලයක් සංදේශනයෙන් තොරව රඳවා තැබීම හෝ රහස් ස්ථානයන් හි රඳවා තැබීම රැඳවියන් වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමක පසුබිම සැලසීමක් වන අතර, මේසේ රඳවා තැබීම ඉහත කී ආකාරයේ සැලකිල්ලකට යටත් කිරීමක් වේ" යනුවෙන් එක්සත් ජාතීන් ගේ මහා මණ්ඩලය විසින් ප්‍රකාශ කොට ඇත[70]. එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටුවද සංදේශනයෙන් තොරව රඳවා තැබීමට එරෙහිව විධිවිධාන සලස්වන මෙන් ඉල්ලා ඇති අතර[71], වධ හිංසාවලට එරෙහි එක්සත් ජාතීන් ගේ කමිටුවද මෙය මුලින්පුටා දමන මෙන් නොකඩවාම යෝජනා කොට ඇත[72]. වධහිංසා පැමිණිවිම පිළිබඳ එක්සත් ජාතීන් ගේ විශේෂ නියෝජිතයා " වධ හිංසාවලට භාජනය කිරීම, සංදේශනයෙන් තොරව රඳවා තබා ගැනීමේ දී නිතරම සිද්ධ වන බවත්, " එබඳු රඳවා තැබීම් නීති විරෝධී වන බවත් ප්‍රකාශ කරයි [73]
සංදේශනයෙන් තොරව රහස්‍ය ස්ථානයන්හි රඳවා තබා ගැනීම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ එක් අංගයකි. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම නිර්වචනය කර ඇත්තේ:
" මෙම සම්මුතියේ අරමුණු වෙනුවෙන් රජයේ නියෝජිතයන් විසින් හෝ රාජ්‍යයේ අධිකාරය, සහාය හෝ අනුමැතිය ඇතිව ක්‍රියා කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින් හෝ අත් අඩංගුවට ගනු ලැබීම, පැහැර ගනු ලැබීම හෝ නිදහස අහිමි කරනු ලැබීමේ වෙනයම් ආකාරයක් හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම හෝ සිටින්නේ කොහේද යන්න වසන් කිරීම මගින් එවැනි පුද්ගලයෙකු නීතියේ ආරක්ෂාවෙන් පරිබාහිරව තැබීම "බලහත්කාර අතුරුදහන් කිරීම" ලෙස සලකනු ලැබේ[74]. බලහත්කාර අතුරුදහන් කිරීම, අත්තනෝමතික රඳවා තබා ගැනීම, නීතිය ඉදිරියට යාම වැළැක්වීම, වධ හිංසාවලට, හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට හෝ දඬුවමකට යටත් කිරීම වැනි මානව අයිතිවාසිකම් ගණනාවක් උල්ලංඝණය කිරීමට මං පාදයි.[75] බලහත්කාර අතුරුදහන් කිරීම පමණක්ම වුවද, අවමන් සහගත සැලකිල්ලකට හා වධ හිංසා පැමිණවීමට ලක් වීමට ඉඩ සලසන නිසාත්, ඒ පුද්ගලයන්ට පිටස්තර ලෝකය සමග සංදේශනයට ඉඩ නොදීමෙන් හා තමන් කවද, කෙසේ නිදහස් කරයිද, සිය පවුල් වෙත නැවත යන්නට ලැබෙයි ද නොලැබෙයි ද යන සැකය හා භීතිය නිසාත්, අප්‍රමාණ වේදනාවකට භාජනය

[70] UN General Assembly resolution 62/148, 17 December 2007, para 15; UNGA res. 63/166, 12 December 2008, para 20; UNGA res. A/RES/66/150 19 December 2011, para 22

[71] UN Human Rights Committee, "General Comment 20, Article 7 (Forty-fourth session, 1992); *Compilation of General Comments and General Recommendations Adopted by Human Rights Treaty Bodies*," UN Doc. HRI\GEN\1\Rev.1 at 30 (1994), para 11.

[72] See for instance Report of the Committee against Torture, UN Doc. A/52/44 (1997), paras 121(d) (re Georgia); 146 (re Ukraine); UN Doc. 44(A/55/44) (2000), para 61(b) (re Peru); UN Doc. A/58/44 (2003), para 42(h) (re Egypt); UN Doc. A/59/44 (2004), para 146(d) (re Yemen).

[73] UN Doc. E/CN.4/2002/76, 27 December 2001, Annex 1

[74] International Convention for the Protection of All Persons from Enforced Disappearance, adopted by UN General Assembly Res. 61/177, 20 December 2006, entered into force 23 December 2010, Art. 2. The widespread or systematic use of enforced disappearance is defined as a crime against humanity in Article 6. (මෙම සම්මුතිය බලහත්කාර අතුරුදහන් කිරීමෙන් සියළු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය නමින් සිංහළයට පරිවර්තනය කර ඇත. එම පිටපත මෙම සම්මුතිය හඳුන්වාදීම සඳහා AIM FOR HUMAN RIGHTS සංවිධානයේ අනුග්‍රහය ඇතිව පවත්වන්නට යෙදුන දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය වැඩමුළුවේදී අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සංගමය විසින් 2008 ඔක්තෝම්බර් මස නිකුත් කරන ලදී. මෙම සම්මුතිය පිළිබඳ සියළු උපුටා ගැනීම් එම පිටපතෙනි)

[75] See for instance reports of the Committee against Torture, UN Doc. A/52/44 (concerning Namibia), para 247; UN Doc. A/57/44 (2001-2); para 93(a) (concerning the Russian Federation); UN Doc. A/59/44 (2003-4), para 56(l) (concerning Chile); and UN Doc. A/61/44 (2005-6), paras 29(24) (concerning Nepal) and 30(12) (concerning Sri Lanka).

වන බව අන්තර් ජාතික මානව හිමිකම් ආයතන සැලකිල්ලට ගනී.[76] මෙම තත්වයම බලහත්කාර ලෙස අතුරුදහන් වූ පුද්ගලයා ගේ ඥාතීන්ට හා මිත්‍රයින්ටත් ඒ හා සමානම වේදනාවක් දරන්නට සිදුවේ. සිද්ධීන් ගණනාවකදීම, බලහත්කාර අතුරුදහන් වීමට ගොදුරු වූ පුද්ගලයාගේ ඥාතීන්ට හා මිත්‍රයින්ට එම පුද්ගලයාගේ තොරතුරු ඉතා දීර්ඝ කාලයක් යනතුරු ලබා නොදීමෙන්, වධ හිංසා පැමිණවීම හා වෙනත් අවමන් සැලකිලි වලට ලක් කිරීම වැළැක්වීම උල්ලංඝණය කරන බව ජාත්‍යන්තර මානව හිමිකම් ආයතන වල මතය වේ. [77]මීට අමතරව ජාත්‍යන්තර පණත් ගණනාවකින් ම උදාහරණයක් ලෙස දැක්විය හැක. ජාත්‍යන්තර අපරාධ අධිකරණය පිළිබඳ රෝම ප්‍රඥාප්තිය මානව සංහතියට එරෙහි අපරාධයක් වශයෙන්[78] "බලහත්කාර අතුරුදහන් කිරීම"[79] සලකන බව පෙන්වා දිය හැක. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත මගින්, ආරක්ෂක අමාත්‍යවරයා විසින් තීරණය කරන ස්ථානයක, විමර්ශන කටයුතු සඳහා හෝ ආරක්ෂක හේතූන් මත පුද්ගලයින් රඳවා තබා ගැනීමට නියෝග නිකුත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට අසීමිත බලතල ලබා දෙයි. ආරක්ෂක අමාත්‍යාංශය මෙම තොරතුරු ප්‍රසිද්ධ කිරීමට බැඳී නැත. මෙම පණතේ 7 (3) වගන්තියට අනුව, පොලිසියට අත් අඩංගුවට ගනු ලැබූ පුද්ගලයෙක් " සාධාරණ කාල සීමාවක් තුළ විමර්ශන කටයුතු හා ප්‍රශ්න කිරීම සඳහා ඕනෑම ස්ථානයකට රැගෙන යා හැකිය".

ඉහත කී පණත බලහත්කාර අතුරුදහන් කිරීම් සඳහා නීත්‍යානුකූල කිරීමක් හා නිල අවසරයක් ලබා දීමක් වන අතර, අන්තර් ජාතික නීතියට අනුව බරපතළ අපරාධයන් ට තුඩු දෙන නීතියක් වශයෙන් සැලකිය හැකිය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම නීතිය අහෝසි කරන ලෙස බලධාරීන් ගෙන් ඉල්ලා සිටින අතර, මෙම නීතිය භාවිතා කිරීමෙන් වළකින ලෙසටද ඉල්ලා සිටියි.

"මට පිටස්තර කිසිවෙක් සමග කථා කිරීමට ඉඩ නොදුන් අතර, කිසිවෙක් මා බැලීමට පැමිණියේද නැත. මම හිතන්නේ මම වගේම තවත් රැඳවියන් මෙම කඳවුරේ සිටින්නට ඕනෑ. මට මිනිස්සු කෑ ගහන සද්දය හා අඬන සද්දය ඇහෙනවා. එක පාරක් හෝ දෙපාරක් මට වෙඩි සද්දයත් ඇහුනා."

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා අතුරු හමුදා ඒකාබද්ධව රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යන බවට චෝදනා එල්ල වී ඇත.[80] ශ්‍රී ලංකා රජය මෙම චෝදනාව බැහැර කරන නමුත්

---

[76]- See for instance UN Human Rights Committee, *El-Megreisi v Libyan Arab Jamahiriya,* Communication No. 440/1990, UN Doc. CCPR/C/50/D/440/1990 (1994); Rafael *Mojica v. Dominican Republic,* Communication No. 449/1991, UN Doc. CCPR/C/51/D/449/1991 (1994).

[77] See above.

[78] Under the Statute, a crime against humanity takes place when certain acts, including enforced disappearance, are "committed as part of a widespread or systematic attack directed against any civilian population, with knowledge of the attack" – Rome Statute of the International Criminal Court, adopted on 17 July 1998 (A/CONF.183/9), entered into force 1 July 2002, Art. 7(2)(a).

[79] රෝම ප්‍රඥාප්තිය ද බලහත්කාර අතුරුදහන් කිරීම නිර්වචනය කරනු ලබන්නේ "රජයේ නියෝජිතයන් විසින් හෝ රාජ්‍යයේ අධිකාරය, සහාය හෝ අනුමැතිය ඇතිව ක්‍රියා කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින් හෝ අත් අඩංගුවට ගනු ලැබීම, පැහැර ගනු ලැබීම හෝ නිදහස අහිමි කරනු ලැබීමේ වෙනයම් ආකාරයක් හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ ඉරණම හෝ සිටින්නේ කොහේද යන්න වසන් කිරීම මගින් එවැනි පුද්ගලයෙකු නීතියේ ආරක්ෂාවෙන් පරිබාහිරව තැබීම" වශයෙනි. 7(2)(i) වගන්තිය

[80] ශ්‍රී ලංකා හමුදා විසින් රැඳවියන් රහස්‍ය ලෙස නිවාස අඩස්සියේ තබා ගැනීම වර්ෂ ගණනාවක් ආපස්සට යන්නකි. 2002 ජනවාරි 10 වන දින ඉක්බාල් අතායස් සන්ඩේ ටයිම්ස් පුවත් පතේ ආරක්ෂක තීරුවට ලියන ලද ලිපියේ දී මේසේ සඳහන් කරයි." ආරක්ෂිත නිවාස වූ කලී 1980 ගණන්වල ජනතා විමුක්ති පෙරමුණ විසින් දියත් කරන ලද ප්‍රචන්ඩත්වය මර්දනය කිරීම පිණිද පොලිසිය හා ආරක්ෂක හමුදා යටතේ බහුල ලෙස පවත්වා ගෙන යනු ලැබීය. වධ හිංසා වලට එරෙහි මානව හිමිකම් කණ්ඩායම් පෙන්වා දුන් පරිදි අත් අඩංගුවට ගත් සැකකරුවන් ගෙන් ප්‍රශ්න කිරීම මෙම ආරක්ෂික නිවාස වලදී සිදු කරන

දිනෙන් දින වැඩිවන ඇසින් දුටු සාක්ෂිකරුවන් ගේ සාක්ෂි වලට අනුව මෙම පහසුකම් රජය විසින් පවත්වා ගෙන යන බව හෙළිදරව් වේ. මෙම මධ්‍යස්ථාන වලට " ආරක්ෂාව" පිළිබඳ ක්‍රියා කරන රාජ්‍ය නොවන සංවිධාන, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හා අන්තර් ජාතික රතු කුරුස සංවිධානය වැනි සංවිධාන වලට පරීක්ෂා කිරීමට අවසරයක් නොමැති නිසා ඉහත කී චෝදනාවේ සත්‍ය අසත්‍යතාවය විමසීමට අවකාශයක් නැත. නමුත් රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන රජය විසින් පවත්වා ගෙන යන බවට කෙරෙන චෝදනා දිනෙන් දින ඉහළ යන නිසා මේ චෝදනාව පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විමේ කාලය උදා වී තිබේ.

- ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ලැබෙන ප්‍රධාන පෙළේ සාක්ෂිකරුවන් ගේ දිවුරුම් ප්‍රකාශ අනුව ශ්‍රී ලංකාව තුළ ඝාතක කල්ලි නමින් හැඳින්වෙන විශේෂ ඒකක ක්‍රියාත්මක වන බවත්, එම කල්ලි ආරක්ෂක අමාත්‍යාංශය විසින් මෙහෙය වන සුපිරි ඒකකයක් බවත්. ආණ්ඩුවේ ගොඩනැගිලි ඔවුන් සිය රැඳවුම් මධ්‍යස්ථාන වශයෙන් පාවිච්චි කරන බවත්, ඔවුන් විසින් පැහැර ගනු ලබන පුද්ගලයින් ප්‍රශ්න කිරීම් වලට මෙන් ම වධ හිංසා වන්ට භාජනය කරන බවත්, අනතුරුව ඝාතනය කරන බවත්, හෙළිදරව් වේ. බොහෝ වින්දිතයින් දැවිඩ ජාතිකයින් වීම කැපී පෙනෙයි.
- ශ්‍රී ලංකා නාවික හමුදාවේ බුද්ධි අංශය විසින් අත් අඩංගුවට ගත් හිටපු එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙක් රඳවා තබා ගෙන වධ හිංසා වලට ලක් කළ අතර. පසුව ඔහු නාවික හමුදාවේ ඔත්තුකරුවෙකු වශයෙන් සේවයේ යොදවන ලදී. ඔහු ප්‍රකාශ කළ ආකාරයට ත්‍රිකුණාමලේ වරාය තුල පිහිටි ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරට අනුබද්ධිත බුද්ධි අංශය ත්‍රිකුණාමලයේ නාවික හමුදා කඳවුර තුළ රැඳවුම් මධ්‍යස්ථානයක් පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකා නාවික හමුදා බුද්ධි අංශය විසින් එල්. ටී. ටී. ඊ. සැකකරුවන් වශයෙන් පුද්ගලයින් අත් අඩංගුවට ගන්නා අතර, ඒ පුද්ගලයින් රඳවා තබා ගෙන වධ හිංසා පමුණුවා අවසානයේ දී ඝාතනය කරයි. ඔහු දන්නා පරිදි අඩු තරමින් මෙලෙස ඝාතනය කරනු ලැබූ පුද්ගලයින් ගෙන් දෙදෙනෙක් 15 හා 17 හැවිරිදි වියේ පසු වුවන්ය.
- 2010 පෙබරවාරි 1 වන දින රැඳවුම් කඳවුරකින් රහසි ගතව පිට කරන ලද, රැඳවියෙක් විසින් සිය පවුලේ උදවියට ලියන ලද ලිපියේ පිටපතකට අනුව එම ලිපිය ලියූ රැඳවියා "බාහිර ලෝකයත් සමග සංදේශනයකට අවසරයක් නොදී රහස්‍ය ස්ථානයක රඳවා සිටින අතර, තමා බාහිර ලෝකයත් සමග සංදේශනයට උත්සාහ දැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් තදින් පහර කෑමට ලක් වූ බවත්, රහසිගත ස්ථානයක සගවා සිටින බැවින් තමා සෙවීමට මහන්සි නොගන්නා ලෙසටත්" සිය පවුලෙන් ඉල්ලා ඇත[81].
- 2009 අගෝස්තු මස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමග සම්බන්ධකම් තිබූ පුද්ගලයෙක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා බුද්ධි අංශය විසින් බලහත්කාර අතුරුදහන් කිරීම්, වධ හිංසා පැමිණ වීම හා අධිකරණ බාහ්‍ය ඝාතන සිදු කරන මධ්‍යස්ථාන කිහිපයක් පවත්වා ගෙන යන්නේ යැයි ඇම්නස්ටි ඉන්ටර් නැෂනල් සංවිධානය වෙත හෙළිදරව් කරන ලදී. මෙම රැඳවුම් මධ්‍යස්ථාන ලැයිස්තුවට වව්නියාවේ පිහිටි 211 යුද්ධ හමුදා

ලදී. පසු කාලීනව රජයේ බුද්ධි අංශ විසින් ද එල් ටී ටී ඊ සැකකරුවන් ගෙන් ප්‍රශ්න කිරීම පිණිස ආරක්ෂිත නිවාස පාවිච්චි කළේය. The Great Betrayal," Situation Report, *Sunday Times*, 10 January 2002, http://sundaytimes.lk/020120/sitrep.html, accessed 19 February 2012.

[81] මෙම ලිපියේ මුල් පිටපත ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය භාරයේ ඇත

සේනාංක මූලස්ථානයද, වවුනියාවේ පිහිටි කුඩා වධකාගාරයක් සහිත ෆ්ලොට් සංවිධානයේ රැඳවුම් මධ්‍යස්ථානයද ඇතුළත්ය.[82]

- 2011 මාර්තු 27 දින, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි, කල්මුණේ හි 45 හැවිරිදි දරුවන් සතර දෙනෙකු ගේ වැන්දඹු මවක්, තමා 2007 වර්ෂයේදී තමා මඩකලපුවේ දී පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන නිදහස් කළ පසු රජය හා සම්බන්ධ දැවිඩ ආයුධ සන්නද්ධ කල්ලියක් විසින් තමා පැහැර ගෙන ගොස් වධ හිංසාවලට ලක් කරන ලද ආකාරය කියා සිටියාය. ඇය ගේ මිත්‍රයෙක් විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට සපයන ලද තොරතුරු අනුව, ඇය රැඳවුම් කඳවුරෙන් පළා ඒමට පෙර දින 14 එම කඳවුරේ රඳවා සිටියාය. මේ කාලය ඇතුළත් ඇය සමග රඳවා සිටි පුද්ගලයින් ගෙන් පස් දෙනෙක් මිය ගිය බවත්, තමා දන්නා පරිදි තමා හැර එම කඳවුරට ගෙන ගිය කිසිවෙක් මේ වන විට ජීවතුන් අතර නැත. තවදුරටත් සාක්ෂි දුන් ඇය මේසේ ද කීවාය. " 2009 දී මගේ නැගණිය මෙලසෙ පැහැර ගනු ලැබුවා. නමුත් අද වෙන තුරු ඇ පිළිබඳ තොරතුරක් ලැබී නෑ." 2011 නොවැම්බර් මස ඇය කල්මුණේ පොලිසිය වෙත කැඳවනු ලැබූ අතර, එහිදී ඇය විසින් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද සාක්ෂිය පිළිබඳ විස්තර විමසනු ලැබිය. ඇය මෙම ක්‍රියාව විස්තර කරන ලද්දේ කොමිෂන් සභාව ඉදිරියට සාක්ෂි දීමට නොබියව ඉදිරිපත් වීම පිළිබඳ රිදවීමක් කිරීමට දරන ලද උත්සාහයක් වශයෙනි.
- ආසියානු මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් ප්‍රකාශයකට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හිටපු කැප්ටන්වරයෙක් හා ගුරුවරයෙක් වූ ආර්.ඩී. වික්‍රමසේකර 2006 ජුනි 26 වන දින දඹුල්ලේ දී පැහැර ගැනීමක විලාශයෙන් අත් අඩංගුවට ගන්නා ලදී. තමන්ට ප්‍රහාරය එල්ල කළේ අතුරු හමුදාවක් විසින් යැයි වික්‍රමසේකර අනුමාන කළේ ඔවුන් සිවිල් ඇඳුමෙන් සැරසී සිටීමත් තමන් කවුදැයි හඳුන්වා නොදීමත් නිසාය. ඔවුහු තමා බලහත්කාරයෙන් වෑන් රථයකට නංවා ගෙන ඇස් බැද දැමූ අතර, පැරණි ගොඩනැගිල්ලක බිම් මාලයට ගෙන යන ලදී. ඔහු ගේ දෑස් හා අත් දිගටම ගැට ගසා තිබූ අතර, දින දෙකකට පසුව වෙනත් ස්ථානයකට මාරු කළේය. ඔහු අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ට බාර දෙන තුරු බාහිර ලෝකයත් සමග කිසිදු සංදේශනයකට ඉඩ නොදී දින 11 මෙලෙස රඳවා ගෙන සිටියෝය. වික්‍රමසේකර පැහැර ගත් පුද්ගලයින් තමා වෙඩි තබා මරා දමන බව දිගින් දිගටම තර්ජනය කළ අතර, ආහාර පාන කිසිවක් කළට වේලාවට හා ප්‍රමාණවත් පරිදි ලබා දී නොතිබින. දැවිඩ බසින් ලියන ලද ලිපියක් සිංහළ බසට පරිවර්තනය කරන ලෙසත් බල කරන ලද අතරෙ මොවුන් තමාට විරුද්ධව චෝදනා

[82] මලර් මලිගායි හෙවත් වධකාගාරය නමින් හැඳින්වෙන මෙම රැඳවුම් මධ්‍යස්ථානය හා වව්නියාවේ පිහිටි අනෙකුත් රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන දශක කිහිපයක සිට පවත්වා ගෙන යනු ලබන්නේ අතුරු හමුදා විසිනි. මෙම තොරතුරු ඇම්නස්ටි ඉනටර්නැෂනල් සංවිධානය විසින් ලේඛන ගත කොට මීට ඉහත ප්‍රකාශයට පත් කර ඇත. විශේෂයෙන්ම බලන්න:Amnesty International, *Sri Lanka: "Possible Disappearance / Fear Of Torture*," (Index: ASA 37/009/2001) http://www.amnesty.org/fr/library/asset/ASA37/009/2001/fr/7cd01fd2-fb2c-11dd-9486-a1064e51935d/asa370092001en.pdf; Amnesty International. *Sri Lanka: "Torture in Custody*" (Index: ASA 37/010/1999) http://www.amnesty.org/en/library/asset/ASA37/010/1999/en/ea0ed8ee-e1d8-11dd-a03a-6b5b1e49bce3/asa370101999en.pdf; Amnesty International, *Sri Lanka: "Amnesty International Appeals for an Immediate Halt to Use of Unauthorized Places of Detention"*, News Service 171/98, (Index: ASA 37/23/98) https://www.amnesty.org/en/library/asset/ASA37/023/1998/en/6fbb2f6d-b506-4a0a-be35-27b42a80c32d/asa370231998en.pdf

ගොතන්නට උත්සාහ දරන බවක් හැඟි ගියේය. 2011 දෙසැම්බර් වන විටත් ඔහු තවමත් මහනුවර බෝගම්බර රිමාන්ඩ් සිරමැදිරියේ සිර කර සිටියි.[83]
2011 නොවැම්බර් මස රැස්වූ වධ හිංසාවන්ට එරෙහි එක්සත් ජාතීන් ගේ කමිටුව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිය නිගමන ඉදිරිපත් කරමින් මේසේ සඳහන් කරයි.
ශ්‍රී ලංකා නියෝජිත පිරිස එරට රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යන බව පිළි නොගන්නා නමුත්, රාජ්‍ය නොවන සංවිධානයන් ගෙන් ලැබෙන වාර්තා අනුව මෙම රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා ආයුධ සන්නද්ධ අතුරු හමුදු විසින් බවත්, ඔවුන් බලහත්කාර අතුරුදහන් කිරීම්, වධ හිංසා පැමිණවීම, හා අධිකරණ බාහ්‍ය ඝාතන සම්බන්ධයෙන් අපරාධ වලට වගකිව යුතු බව පෙනී යයි.(2 හා 11 වන වගන්ති)
රජය රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන නොයන බවට සහතික විය යුතු අතර, මෙම පහසුකම් එක හෙළාම සම්මුතිය උල්ලංඝණය කිරීමකි. රජය විසින් පවතින එබඳු පහසුකම් කවරෙකු ගේ අධිකාරීය යටතේ පිහිටුවා ඇත්ද යන්න පිළිබඳව වහාම විමර්ශනය කිරීමත් මෙම විමර්ශනයන් ගේ ප්‍රතිඵල මහජනයා ගේ දැන ගැනීම පිණිස ප්‍රසිධ කිරීමත් රජය විසින් කළ යුතුය. රජය විසින් මෙබඳු ස්ථාන වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරමින් සැක කටයුතු අපරාධකරුවන් සිය කටයුතු සම්බන්ධයෙන් වගවීම පිණිස අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතුය.[84]

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ නිර්දේශය වන්නේ, දැනට ක්‍රියාත්මක වන රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන පිළිබඳව ශ්‍රී ලංකා රජය ස්වාධීන, අපක්ෂපාතී හා ඵලදායී විමර්ශනයක් පවත්වමින් වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට තමන් විසින් රඳවා ගෙන සිටි පුද්ගලයින් ගොදුරු කරන ලද්දේද යන්න හා එසේ කරන ලද්දේ නම් එසේ කිරීමට නියෝග දීම එම නියෝග ක්‍රියාත්මක කරන ලද්දේ කවුරුන් විසින් ද යන්නත් හෙළිදරව් කරමින් චින්දිතයින්ට හානි පුරණය කිරීම කළ යුතු බවයි.

තර්ජනය කිරීම:

පොලිසිය නිතරම රැඳවියන්ට, නිදහස් කළ රැඳවියන්ට හා මේ කණ්ඩායම් වල පවුල් වල උදවියට එරෙහිව "තර්ජනය" පාපෝච්චාරණ, එසේත් නැත්නම් බුද්ධි තොරතුරු ලබා ගැනීමට, කප්පම් ගැනීමට හෝ වෙනත් සැකකරුවන් නම් කරවා ගැනීමට භාවිතා කරයි.

" රෝෂාන් " මුහුණ දුන් අත්දැකීම් පිළිබඳව මීට පෙර සාකච්ඡා කළ අතරෙ ඔහු අධිකරණ නියෝගයකින් නිදහස් කිරීමෙන් පසුවත් කොළඹ පොලිසිය ඔහු පසුපස හඹා එන්නට පටන් ගත් අතරෙ අවසානයේදී ඔහුට සැඟව පලා යාමට සිදුවිය. රොෂාන් සොයා ගැනීමට

---

[83] "*SRI LANKA: Senior army officer arbitrarily arrested, tortured, and detained without trial*," Asian Human Rights Commission, December 22 2011, http://www.humanrights.asia/news/ahrc-news/AHRC-STM-212-2011, accessed 27 February 2012.

[84] Committee Against Torture, "*Sri Lanka, Concluding Observations of the Committee against Torture*," UN Doc. CAT/C/LKA/CO/3-4, 8 December 2011, para 8, http://www2.ohchr.org/english/bodies/cat/docs/co/CAT.C.LKA.CO.3-4_en.pdf, accessed 19 February 2012.

නොහැකි වූ විට ඔහු ගේ පවුලේ උදවිය මුණ ගැසෙන්නට 2010 නොවැම්බර් වන විට පොලිසිය 18 වතාවක් පැමිණ තිබුනි. බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම් ඔවුන් පැහැර ගැනීමකට ලක් විය හැකි බව කිහිප අවස්ථාවකම සිවිල් ඇඳුමෙන් සැරසුන පුද්ගලයින් ප්‍රකාශ කොට ඇත.

" මා නීත්‍යානුකූලව නිදොස් කොට නිදහස් කළත් ත්‍රස්ත විමර්ශන ඒකකය එය පිළි ගැනීමට මැලිකමක් දැක්වුවා. නිතරම මට මාව කොළඹ අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුවට නැවත ඉදිරිපත් කරන බව දැනුම් දුන්නා. මා සිටින ස්ථානය හෙළිදරව් කරන මෙන් ඉල්ලා මගේ පවුලේ උදවිය හට ඉතා විශාල පීඩනයක් එල්ල කළා.

පොලිසිය මගේ මවට තර්ජනය කරමින් ඇය කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ හතර වන තට්ටුවට රැගෙන ගොස් මා සිටින ස්ථානය හෙළිදරව් කරන තෙක් ඇය එහි රඳවා තබන බවට තර්ජනය කළා.

2010 ඔක්තෝබර් මාසයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් තිදෙනෙක් මගේ දෙමාපියන් ගේ නිවසට ගොස් මගේ මවට පොලිස් ස්ථානයට වාර්තා කරන ලෙසට දැනුම් දී තිබුනා. පොලිස් ස්ථානයේදී තවත් පොලිස් නිලධාරීන් හතර දෙනෙක් පැය හතරක් තිස්සේ ඔවුන් ගෙන් ප්‍රශ්න කරමින් මා බන්ධනාගාරයෙන් නිදහස් කිරීම පිළිබඳව තොරතුරු විමසා තිබුනා. මා පොලිසියේ උසස් නිලධාරීන්ට අල්ලස් දී නිදහස් වූ බවත්, මා එල්. ටී. ටී. ඊ. සංවිධානයේ සාමාජිකයෙක් නිසා තවදුරටත් ප්‍රශ්න කිරීම පිණිස මා අත් අඩංගුවට ගත් යුතු බව ඔවුන් කියා තිබුනා. ත්‍රස්ත විමර්ශන ඒකකය මා අධිකරණය විසින් නීත්‍යානුකූලව මා නිදහස් කළත් විමර්ශනය විවෘතව තබා ගත්තා. මේ සියල්ලටම පසු ඊට පසු දිනයෙත් ඇයට පොලිසියට පැමිණෙන මෙන් දන්වා තිබුනා.[85]

2010 නොවැම්බර් මස රෝෂාන් ගේ දෙමාපියන් හමුවිමට නැවතත් පැමිණි අපරාධ පරීක්ෂණ දෙපාර්තුමෙන්තුවේ නිලධාරීන් තර්ජන හා අපහාස කරන ලදී. එම නිලධාරීන් මගේ පියාට පහර දීමට උත්සාහ කළ අතරඋ මා ඉදිරිපත් නොකළහොත් මා සොයා ගන්නා තෙක් ඔහු අත්අඩංගුවේ තබා ගන්නා බව කියා තිබුනා. මේ සිද්ධීන් ගෙන් මගේ පියා කොපමණ කම්පාවට පත් විදැයි කිවහොත් ඔබට හෘදයාබාධයක් පවා වැළඳුනා."

"රෝෂාන් " පවුලේ උදවිය මුණ ගැසීමට තමන් කවුදැයි හඳුන්වා නොදුන් කණ්ඩායමක් ද පැමිණ තිබිණ.

" මගේ දෙමාපියන් මුණ ගැසීමට සුදු පාට වෑන් රථයකින් පැමිණි සිවිල් ඇඳුමින් සැරසුන කන්ඩායමක් මගේ තොරතුරු විමසා තිබුනා. ඒ කණ්ඩායම තමන් කවුදැයි හඳුන්වාදීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කළ අතර, මා යලිත් වරක් ප්‍රශ්න කිරීම පිණිස කොළඹට අවශ්‍යව ඇතැයි ද මගේ දෙමාපියන්ට ඊට සහයෝගය දෙන ලෙසත් එසේ නොමැති නම් පියා අත්අඩංගුවට ගැනීමට සිදුවන බවත්, දැනුම් දී තිබුනා. මෙයින් දැඩි ලෙස කම්පනයට පත් මව පසුගිය නොවැම්බර් මාසයේ හෘදයාබාධයකින් පෙළෙන පියා රැගෙන නොයන ලෙසට ආයාචනය කළා. පියා ගේ තත්වය ගැන සළකා බලා මාර්තු 4 වන දා තෙක් මා නැවත පොලිසියට ඉදිරිපත් කිරීමට කාලය ලබා දී එසේ ඉදිරිපත් නොකළහොත් බාල සොහොයුරා ඇතුළු සියළු දෙනාම අත්අඩංගුවට ගන්නා බවත් කියා තිබුනා"[86]

2010 දී නිදහස් කරන ලද තවත් රැඳවියෙක් විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට පාපෝච්චාරණයක් ඉදිරිපත් කරන ලදි. පොලිසිය තමාට වධ හිංසා පමුණුවමින් ව්‍යාජ පාපෝච්චාරණයකට අත්සන් කිරීමට බල කරන ලද අතරඋ එසේ නොකළහොත් තම බිරිඳ අත්අඩංගුවට ගන්නා බව කියා සිටියේ යැයි ප්‍රකාශ කරයි. බුස්ස කඳවුර නං මට දඬුවමක්. අපේ සෙල් එක ඇතුලේ අපි රඳවා තිබුනා. අපිව එළියට ගත්තේ දවසකට පැයක් විතරයි. අපි කියන විධියට පාපෝච්චාරණය කරනවා නම් නුඹ කොළඹට මාරු කරන්න පුළුවන්

[85] පෞද්ගලික සංදේශයක් මගින් ලබා දුන් තොරතුරකි

[86] ඉහත බලන්න

ඔවුන් නිතරම මට කිව්වා. එහෙත් මම ඒකට එකඟ වුනේ නෑ. සහකාර පොලිස් අධිකාරිවරයා "පාපෝච්චාරණය කරපල්ලා. නිදහස් කරනවා" යැයි නිතරම කියනවා. එක් දවසක් සෑන්දෑවක මාව කොළඹ මූලස්ථානයට ගෙන ගියා. "පාපෝච්චාරණය කරපන්. නැත්නම් නුඹේ බිරිඳ අත්අඩංගුවට ගන්නවා" ඔවුන් මට කීවා. ඔවුන් මට කොළයක් දී මගේ ජීවිත කථාව දෙමළ බසින් ලියන්නටත් දන්න සියළුම දේවල් කියන ලෙසටත් කිව්වා. නමුත් මා ලිවිය යුත්තේ කුමක්දැයි ඔවුන් මට කියන්නට පටන් ගත්තා. අන්තිමේදී මම පාපෝච්චාරණයට අත්සන් කළා.[87]

විවේචකයින් හෙළා දැකීමට බල කිරීම

2012 දී එස් රධිකා හා ඇගේ සැමියා විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සමග කරන ලද රහස්‍ය සම්මුඛ සාකච්ඡාවක් කරන ලදී. රධිකා විවාහ වන්නේ 2006 දීය. කිලිනොච්චියේ පදිංචි වී සිටි ඔවුන් 2008 දී යුද්ධයත් සමග අවතැන් වෙයි. "අපි සතියක් එක තැනක තවත් දවස් පහක් තවත් තැනක" ෂෙල් වෙඩි නිසා සෑම විටම එහාට මෙහාට යන්න වුනා රධිකා කියා සිටියා. 2008 ඔක්තෝබර් මාසයේ දී ඔවුන් මුලිවයිකාල් වලට පැමිණියා. යලිත් වරක් 2009 මැයි 18 වන දින ඔවුන් තවත් දහස් ගණනක් සමග නැවත පිළිසරණක් සොයමින් සී සී කඩ විසිර ගියා.

යුද්ධ හමුදාව විසින් රධිකා ගේ පවුල වෙන් කළා. රධිකා මැණික් ෆාම් පුනරුත්ථාපන කඳවුරෙහි කලාප අංක හතරට යවන ලද අතරෙ ඇගේ සැමියා එල්. ටී. ටී. ඊ. පාක්ෂිකයෙක් වශයෙන් සලකා අත්අඩංගුවට ගනු ලැබින. රධිකා ගේ ප්‍රකාශයට අනුව සිය සැමියා පළමුව වව්නියාවේ පාසැලක රඳවා ගෙන වධ හිංසා පමුණුවමින් ප්‍රශ්න කළ අතර පසුව ගාල්ලේ බුස්ස රැඳවුම් කඳවුරට යවනු ලැබුවා.

අනෙකුත් රැඳවියන් මෙන්ම රධිකා ගේ සැමියාද 2009 තමා අත්අඩංගුවට ගත් අවස්ථාවේ සිටම තම නිර්දෝෂ භාවය ත්‍රස්ත විමර්ශන ඒකකයට ප්‍රකාශ කරමින් සිටියේය. සිය ප්‍රකාශනයෙන් " තමාට එල්. ටී. ටී. ඊ. සංවිධානය සමග කිසිදු සම්බන්ධයක් නොමැති බවත් තම ව්‍යක්තීය වශයෙන් තමා රාජ්‍ය නොවන සංවිධානයක රැකියාව කරන බවත්, එහි කාර්ය වුයේ අවතැන් වූ ජනතාවට ජලය හා සෞඛ්‍ය පහසුකම් සම්පාදනය බවත්ෙ කියා සිටින ලදී."

රධිකා ගේ සැමියා නිදහස් කිරීමට පෙර මාස 20ක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් රඳවා ගෙන සිටි අතර තවමත් ඔහු කොළඹ පොලිස් මූලස්ථානයට සතිපතා වාර්තා කළ යුතුවේ. මෑතකදී පොලිසිය සිය සැමියාට බලපෑම් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එරෙහිව මහජනතාව නඟන චෝදනා අසත්‍යයැයි ප්‍රකාශ කරන මෙන් ඉල්ලා සිටි බව කියා සිටියාය. "ජාත්‍යන්තර ජන මාධ්‍ය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට හා ආරක්ෂක හමුදාවන්ට එරෙහි යම් ප්‍රවෘත්තියක් පළ කළහොත් තම සැමියාට එය වැරදියැයි ප්‍රකාශ කරන මෙන් බල කරන බව ඇය තවදුරටත් කියා සිටියාය.

2009 මැයි මාසයේ දී රජය විසින් යුද්ධ කලාපයේ වෛද්‍ය සේවයේ නිරත ව සිටියදී, ජනමාධ්‍යයන්ට අසත්‍ය ප්‍රකාශ කරන ලදැයි යන චෝදනාව පිට දැවිඩ ජාතීක වෛද්‍යවරුන් පස් දෙනෙක් අත් අඩංගුවට ගන්නා ලදි. අත්අඩංගුවට ගෙන මාස දෙකකට පසු වෛද්‍ය ටී සත්‍යමූර්ති, වෛද්‍ය ටී වර්ධරාජා, වෛද්‍ය වී ෂන්මුගරාජා, වෛද්‍ය ඉලන්චෙලියන් පල්වාන් හා වෛද්‍ය එස් සිවපාලන් යන වෛද්‍යවරු පස්දෙනාට, ඔවුන් රැඳවුම් භාරයෙන් නිදහස් කිරීමට කොන්දේසියක් වශයෙන්, රජය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවකට සහභාගි වීමට බල කරන ලද අතර, මේනිසා තමන් කලින් කරන ලද ප්‍රකාශ එල්. ටී. ටී. ඊ. සංවිධානයේ බලපෑම පිට කරන ලද බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නට සිදුවිය.

---

[87] සම්මුඛ පරීක්ෂණයක් (මූලාශ්‍රය රහසිගතයි)

අල්ලස් ඉල්ලා සිටීම:

රැඳවුම් මධ්‍යස්ථාන පාරදෘශ්‍යභාවයකින් තොරව රහස්‍යභාවයකින් පවත්වා ගෙන යාමේ ශ්‍රී ලංකා සම්ප්‍රදය නිසා අල්ලස් හා කප්පම් ගැනීමට සුදුසු වාතාවරණයක් නිර්මාණය කොට තිබේ. යුද්ධ හමුදාව මෙන්ම පොලිසිය ද රැඳවියන් නිදහස් කිරීම පිණිස ඔවුන් ගේ ඥාතීන් ගෙන් අල්ලස් ඉල්ලා සිටින බව වාර්තා වී තිබේ. සිය පවුලේ උදවියට අල්ලස් දීම පිණිස සම්පත් නොමැති වීමේ හේතුවෙන් බොහෝ රැඳවියන්, රැඳවුම් මධ්‍යස්ථානයන් හා සිර ගෙවල් වල පශ්චාත්තාපයෙන් පසු වෙති.
2011 දෙසැම්බර් මස ෆිරිඩම් ෆෝරම් ටෝචර් සංවිධානය විසින් සිදු කරන ලද විශ්ලේෂණයේදී අනාවරණය වුයේ රැඳවුම් සිද්ධීන් 35ටම අදාළ පුද්ගලයින් තමන් නිදහස් වුයේ නිලධාරීන්ට අල්ලස් දීමෙන් බවයි.
"……අධ්‍යයනය කළ සෑම සිද්ධියකටම අදාළ පුද්ගලයින් රැඳවුම් භාරයෙන් නිදහස් වී ඇත්තේ තමන් සිටින ස්ථානය සිය ඥාතීන් විසින් සොයා ගත් පසු ආදාළ නිලධාරින්ට අල්ලස් පිරිනැමීමේ ප්‍රතිඵලයක් වශයෙනි. අත්අඩංගුවට පත් වූ පුද්ගලයෙක් සිටින ස්ථානය අනාවරණය කර ගැනීමට නොහැකි වන මෙන්ම නිලධාරීන් කරා ළංවීමට අවශ්‍ය සම්පත් නොමැති හා මේ සියල්ලටම ඉහළින් අල්ලස් දීමට නොහැකි පුද්ගලයින් ගේ ඉරණම කුමක්ද ගැටළුවක් වෙයි. එබඳු තැනැත්තන් රැඳවුම් භාරයේ සිටින තමන්ට අයිති නීතියෙන් නියම කොට ඇති කාර්ය පටිපාටියේ රැකවරණය නොලබා, දිර්ඝ කාලයක් රැඳවුම් මධ්‍යස්ථානයන් තුළ තැවෙන්නට සිදුවන අතර□ වධ හිංසා වලට ගොදුරු වීමේ අනතුරටද මුහුණ දෙයි.[88]

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත මෙබඳු සිද්ධීන් ගණනාවක්මවාර්තා වී තිබේ. 2012 දී ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට සේවය කරන එක් පර්යේෂකයෙක් හට වාර්තා වූ පරිදි එක් තැනැත්තෙක් අපරාධ පර්යේෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන්ට කැනේඩියානු ඩොලර් 10,000 කට ආසන්න මුදලක් (දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් 1,000,000 පමණ) සිය බාල සොහොයුරා නිදහස් කිරීම පිණිස ගෙවා තිබුනි. " අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් අල්ලස් නොදුන්නොත් ඔහු වවුනියාවේ සිට වෙනත් රැඳවුම් කඳවුරකට මාරු කරන බවට තර්ජන කළා. මෙය වළක්වා ගැනීමට අපට කැනේඩියානු ඩොලර් 10,000 ක් ගෙවීමට සිදු වුනා. මාස හයක පමණ කාලයක් අත්අඩංගුවේ සිටි ඔහු නිදහස් කර ගැනීමට පුළුවන් වුනා. මේ ගණුදෙනුව සාකච්ඡා කිරීමට මාස තුනක කාලයක් ගත වුනා. දැන් මල්ලී ප්‍රංශයේ ජීවත් වෙනවා"[89]

5 පුනරුත්ථාපනය ?

ශ්‍රී ලංකා ආණ්ඩුව 2009 මැයි මාසයේ දී එල්. ටී. ටී. ඊ. ය මිල්ටරි වශයෙන් පරාජය කිරීමත් සමගම යුද්ධ කලාපයේ අවතැන්ව සිටි 300,000 ආසන්න සංඛ්‍යාවක් සම්බන්ධයෙන් දැක්වූ ප්‍රතිචාරය වුයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් රැකවල් ලු කඳවුරු තුලට ගාල් කිරීමයි. මෙම කඳවුරු තුළ ඔවුන් මාස හතකට වැඩි කාලයක් අත්තනෝමතික ලෙස රඳවා තබා තිබුනී.

---

[88] Pettitt, Jo, "*Out of the Silence: New Evidence of Ongoing Torture in Sri Lanka 2009–2011"*, Freedom From Torture, December 2011, http://www.freedomfromtorture.org/sites/default/files/documents/Sri%20Lanka%20Ongoing%20Torture_Freedom%20from%20Torture_Final%20Nov_07_2011.pdf, accessed 10 February 2012.

[89] සම්මුඛ සාකච්ඡාවක් (මූලාශ්‍රය රහසිගතයි)

මෙම මහජන ගංගාවෙන්, 12,000 ආසන්න කාන්තාවන්, ළමුන් හා පුරුෂයින් සංඛ්‍යාවක් එල්. ටී. ටී. ඊ. ය සමග සම්බන්ධතා ඇතැයි සැක කොට වෙනත් ස්ථානයක රඳවනු ලැබීය. මෙම පිරිසෙන් යම්කිසි ප්‍රමාණයක් වන්නියේ සිට පලා එමින් සිටියදී හමුදාවට බාරවු පුද්ගලයින්ය. අනෙක් පුද්ගලයින් පුනරුත්ථාපන කඳවුරු තුල දී අත්අඩංගුවට ගනු ලැබුවන්ය. එල්. ටී. ටී. ඊ. ය විසින් බලහත්කාරයෙන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගෙන සිටි ළමුන් ද වූ අතර, රජයට භාර වීම වඩා ප්‍රඥාගෝචර යැයි සිතා, සිය වැඩිහිටියන් සමග පැමිණ රජයට භාර වූ ළමුන් ද සෑහෙන සංඛ්‍යාවක් ඒ අතර වුවෝය.
ඇසින් දුටු සාක්ෂි කරුවන්ට අනුව යුද්ධ හමුදාව දිගින් දිගටම නිවේදන නිකුත් කරමින් "එක් දිනක් හෝ එල්. ටී. ටී. ඊ. ය සමග ඇසුරක් තිබුනේ නම් ඒ පුද්ගලයින්ට රජයට භාර වනමෙන් දැනුම් දෙන ලදී.[90] තමන් හමුදාවට භාර වුවහොත්, තමන්ට ඉතා කාරුණික ලෙස සලකණු ඇතැයි ද, කෙටි කාලීන වෘත්තීය පුහුණුවක් හෝ ලබා දෙනු ඇතැයිද, එසේත් නැත්නම් මුදා හරිනු ඇතැයි යන විශ්වාසය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් ඔවුන් තුළ ඇති කර තිබුනී.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව සිය අවසාන වාර්තාවේ මේසේ සඳහන් කරයි. " ඕමන්තෙයි හි රැදවියෙක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් , එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙක් නොවූ අතරෙ වැටුපට වැඩ කළ තැනැත්තෙක් බවත් කියා සිටියේය. තමා ආනන්ද කුමාරස්වාමි කඳවුරේ සිටියදී, යුද්ධ හමුදාව විසින් එල්. ටී. ටී. ඊ. ය සම්බන්ධකම් තිබූ සියළු දෙනාටම ලියා පදිංචිවන ලෙස නිවේදනය කළ බවත්, තමා ද ඉදිරිපත් වී තම පසුබිම සඳහන් කළ පසු වෘත්තීය පුහුණුවක් ලබා දී පිණිස යැයි කියමින් තමා අනෙක් පුද්ගලයින් සමග බස් රථයකට නංවා ගත් බව පැවසීය. එල්. ටී. ටී. ඊ. සාමාජිකයෙක් නොවූ තමා මාස 16ක් තිස්සේ රඳවා ගෙන සිටින බවත්ෙ පොරොන්දු වූ වෘත්තීය පුහුණුව නොලැබුන බවත්ෙ සඳහන් කළේය. [91]
යුද්ධයෙන් පීඩාවට පත් ළමුන් පිළිබඳ එක්සත් ජාතීන් ගේ විශේෂ නියෝජිත පැට්රික් කැමරට් සඳහන් කරන පරිදි..."බොහෝ දරුවන් ගේ දෙමාපියන් තමන් පළිගැනීමකට ලක් වේ යැයි හිතයෙන් රජය වෙත වාර්තා කිරීමට සිය දරුවන් දිරි ගන්වන ලදී. මීට ඇත්ත වශයෙන්ම යුද්ධයේ අවසාන දින කිහිපයේ දී, පැය කිහිපයකට එල්. ටී. ටී. ඊ. අත් අඩංගුවේ සිටි දරුවන් ද ඇතුළත් වීය. බොහෝ දරුවන් තමන් විසින් ම වාර්තා කිරීම් කළ අතර බොහෝ දෙනෙක් එවේලෙහිම අත්අඩංගුවට ගෙන තිබුනි. එසේ නොමැතිනම් පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් ඔවුන් සොයා ගෙන විත් ප්‍රශ්න කොට තිබුනී. අත්අඩංගුවට ගත් දරුවන් බාර දී තිබුනේ වැඩිහිටියන් ද රඳවා සිටින රැඳවුම් කඳවුරු වලට වන පසුව ළමුන් ළමා ආරක්ෂක හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලට මාරු කරන ලදී.[92]

---

[90] See for example, "Testimony of Witness 3, *Proceedings of the Commission of Inquiry on Lessons Learnt and Reconcilliation*," Divisional Secretariat Nedunkerny, 15 August 2010, http://www.llrc.lk/images/stories/docs/August2010/Nedunkerni.pdf; See also, Visit to Sri Lanka of Major General (ret.) Patrick Cammaert, Special Representative for Children Affected by Armed Conflict, 05–11 December 2009, http://www.reliefweb.int/sites/reliefweb.int/files/resources/90A1C4379684850A492576F2000BA481-Full_Report.pdf, accessed 19 February 2012.

[91] LLRC final report, footnote 290.

[92] Visit to Sri Lanka of Major General (ret.) Patrick Cammaert, Special Representative for Children Affected by Armed Conflict, 05–11 December 2009, http://www.reliefweb.int/sites/reliefweb.int/files/resources/90A1C4379684850A492576F2000BA481-Full_Report.pdf, accessed 19 February 2012.

සමස්තයක් වශයෙන් රැඳවියන්ට චෝදනා ගොනු කිරීමක් සිදු නොවූ අතර, මහේස්ත්‍රාත්වරයෙක් වෙත ඉදිරිපත් කිරීමක් ද නොවීය. ඒ අතරම ඔවුන්ට සිය රැඳවුම් මධ්‍යස්ථාන මාරු කර ගැනීමට අවසර නොවීය. ශ්‍රී ලංකා බලධාරීන් මෙම පුද්ගලයින් " ස්වේච්ඡාවෙන් "බාර වූ පිරිසක් වශයෙන් හැඳින්වූ අතර, ඔවුන් " රැඳවුම් කඳවුරු තුළ මෙම රැඳවියන් රැඳී සිටින්නේ " සිය කැමැත්තෙන් බවත්, " ප්‍රකාශ කළෝය. 2011 නොවැම්බර් මස ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන් ගේ වධ හිංසාවලට එරෙහි කමිටුව ඉදිරියේ මේසේ ප්‍රකාශ කළේය." හදිසි අවස්ථා නියෝග 22 වන වගන්තියට අනුව යම්කිසි පුද්ගලයෙක් පුනරුත්ථාපනය පිණිස පහත සඳහන් හේතු මත යොමු කළ හැකිය:

- යම්කිසි පුද්ගලයෙක් සිය කැමැත්තෙන් කරන ප්‍රකාශයක් මඟින් " තමන් ස්වේචඡාවෙන් භාර වෙන පුද්ගලයෙක් බව " ප්‍රකාශ කරන්නේ නම් හෝ
- යම් පුද්ගලයෙක් හදිසි අවස්ථා නියෝග 22 වන වගන්තියේ සඳහන් ආකාරයේ වරදක් කර ඇති බවට යම්කිසි අධිකරණයක් විසින් තීරණය කරන්නේ නම්; පළමුවෙන් සඳහන් කර ඇති වගන්තියට අනුව සිය කැමැත්තෙන් බාර වෙන පුද්ගලයෙකුට නීතිඥ සාහය ලබා ගැනීමේ අයිතිය පිළිබඳ කිසිවක් මෙහි සඳහන් නොවන අතරඋ නීතිඥ සාහය අවශ්‍ය වන්නේ දෙවන ගණයට අයත් කාරණා සම්බන්ධයෙනි.[93]

නිදහස් වූ රැඳවියන් ගේ දිවුරුම් ප්‍රකාශයන්ට අනුව, යථාර්ථය නම් කිසිවෙක් ස්වේච්ඡාවෙන් "පුනරුත්ථාපන " ක්‍රියාවලිය තෝරා නොගත් බවයි. අත්අඩංගුවට ගත් හෝ බාර වූ කිසිවෙකුට පුනරුත්ථාපනය සම්බන්ධයෙන් තමන්ට විකල්පයක් ඇතැයි දැනුවත් කිරීමක් නොවූ බවත්, ඇත්ත වශයෙන්ම ඔවුන්ට ඒත්තු ගන්වන ලද්දේ එක්කෝ පුනරුත්ථාපනය එසේ නැත්නම් සිරබත් යන දෙකෙන් එකක් තෝරා ගත හැකි බවය.

වර්ජිනියා සරසවියේ නීති පීඨයේ ශිෂ්‍යාවක් වූ කාල්රී මැක්රීත් 2012 ජනවාරි මස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ තක්සේරුවක් කිරීම පිණිස ශ්‍රීලංකාවට පැමිණි ඇයට පුනරුත්ථාපන කඳවුරු වල රඳවා සිට නිදහස් වූ පුද්ගලයින් 12 දෙනෙක් සමග සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබින. ඇය සමග සාකච්ඡා කළ කිසිවෙක් තමන් ස්වේච්ඡාවෙන් පුනරුත්ථාපන කඳවුරු තුළ රැඳී සිටින්නට තීරණය නොකළ බව කියා සිටියි:

රජය තම පුනරුත්ථාපන වැඩ සටහන රැඳවියන් ගේ පැසසුමට භාජනය වී යැයි පුන පුනා කීවත්, රැඳවියන් හෙළිදරව් කරන විස්තර අනුව පුනරුත්ථාපනය හා නිලවශයෙන් රඳවා තබා ගැනීම අතර, වෙනසක් ඔවුන්ට නොවීය. මම කථා කළ සෑම රැඳවියෙක්ම තමන්ට පුනරුත්ථාපනය සම්බන්ධයෙන් තෝරා ගැනීමක් තිබූ බව පිළි නොගත් අතර, ආණ්ඩුවේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරමින් තමන් කිසිවෙක් සිය කැමැත්තෙන් පුනරුත්ථාපනය තෝරා නොගත් බව කියා සිටියි. සෑම බාර වූ පුද්ගලයෙක්ම තමන් ස්වේච්ඡාවෙන් බාර වූ බවට ලියවිලි වලට අත්සන් කළ බව මා සමග පැවසුවත්, මට හමුවූ කිසිම රැඳවියෙකු තමන් එබඳු ලියවිල්ලකට අත්සන් කළ බවට මතකයක් නොතිබුනි. රැඳවියන් කිහිප දෙනෙක් අවස්ථා කිහිපයක දී සිය පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලින් මිදී පලා යාමට උත්සාහ කළ අතරඋ ඔවුන්

[93] Sri Lankan Government "*Responses to List of issues to be considered during the examination of Sri Lanka's 3rd and 4th combined periodic reports on the Convention Against Torture and other Cruel, Inhuman or Degrading Treatment or Punishment,"* page 35, http://www2.ohchr.org/english/bodies/cat/docs/CAT.C.LKA.Q.3-4.Add.1_en.pdf, accessed 19 February 2012.

එක්කෝ වෙනත් කඳවුරකට මාරු කිරීම හෝ නැතිනම් බරපතළ ලෙස පහර දීම් වලට ලක් කරනු ලැබින."[94]

රඳවා ගනු ලැබූ 12,000 කට ආසන්න රැඳවියන් ගෙන් බොහෝ දෙනෙක් එල්. ටී. ටී. ඊ. සංවිධානයට සිය කැමැත්තෙන් බැඳුන පුද්ගලයින් නොව එල්. ටී. ටී. ඊ. ය විසින් බලහත්කාරයෙන් බඳවා ගනු ලැබූ පුද්ගලයින්ය. මෙම පිරිස පසුගිය කාලය තුළ කණ්ඩායම් වශයෙන් නිදහස් කරනු ලැබුවේය. 2012 ජනවාරි මස වන විට "බාර වුවන් " තවත් ඉතිරිව සිටියේ 1,000කට ආසන්න ප්‍රමාණයකි. නමුත් තවත් සිය ගණනක් පුද්ගලයින්, රජය විසින් නම් කර තිබෙන පරිදි "එල්. ටී. ටී. ඊ. ප්‍රධාන පෙළේ " සාමාජිකයින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් ගාල්ල බුස්ස රැඳවුම් කඳවුරෙහි රඳවා ගෙන සිටිති.

බන්ධනාගාර නිරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වන හිටපු තානාපති කල්‍යාණනන්ද ගොඩගේ මහතා 2010 වසරේ දී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියට පැමිණ රඳවා තබා ගැනීමේ පරිචයන් පිළිබඳව සිය අදහස් පළ කළේය.

" මම දැන් ඔබට කියන්නට යන්නේ ඉතාමත් කණගාටුදායක, නරක මෙන්ම භායනක තත්වයක් පිළිබඳවයි. සිරකරුවන් වශයෙන් අපිට තරුණ දැවිඩ සිරකරුවන් 2000 විතර ඉන්නවා. වැලිකඩ රිමාන්ඩ් සිර ගෙදර මෙයින් 500 විතර ඉන්න අතරෙ 700 විතර ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ ඉන්නවා. තවත් 600 හෝ ඊට ටිකක් වැඩියෙන් ගාල්ලේ බුස්ස කඳවුරේ ඉන්නවා. ඔවුන් මහේස්ත්‍රාත්වරකු වෙත ඉදිරිපත් කරමින් පොලිසිය කියනවා " අපි තවම විමර්ශන කටයුතු අවසන් කර නැති නිසා තවදුරටත් අත්අඩංගුවේ තබා ගන්නට අවසර දෙන්න කීයා". [95]

පුනරුත්ථාපන කටයුතු පිළිබඳ කොමසාරිස් ජනරාල් මේජර් ජනරාල් චන්දන රාජගුරු ප්‍රකාශ කරන පරිදි "බාරවුවන් " විටින් විට පුනරුත්ථාපන කඳවුරු වලට යැවීම තීරණය කිරීමේ අධිකාරිය බලධාරින් වෙත රඳවා ගෙන තිබුනි. ආරක්ෂක කේෂත්‍රයට අයත් අනෙක් අංශ වලද හා බුද්ධි අංශ ද රැඳවියන් අත්අඩංගුවේ තබා ගෙන සිටින නමුත් එහි නීතිම වලංගුභාවය හෝ කවර ස්ථානයක රඳවා ගෙන සිටින්නේ ද යන්න පැහැදිලි නැත. මේජර් ජනරාල් චන්දන රාජගුරු තවදුරටත් මේසේ ද කිවේය:

"පසු ගිය සතියේ අපි එල්. ටී. ටී. ඊ. සාමාජිකයින් 1,800 ක් සමාජගත කළා: පුදුමතලාන් හි සිට පැමිණි කණ්ඩායම ඔවුන් ගේ පුනරුත්ථාපන වැඩ සටහන ආරම්භ කළේ 2009 ඔක්තෝබර් වල; රෙගුලාසි වලට අනුව කටයුතු කරන්නේ නම් ඔවුන් ගේ පුනරුත්ථාපන වැඩ සටහන 2011 සැප්තැම්බර් මස අවසන් විය යුතුයි: එම කණ්ඩායමත් සමග ම අපි ඒ අය ගේ සම්පූර්ණ අවුරුදු දෙකක පුනරුත්ථාපන වැඩ සටහන අවසන් කරනවා:
තවමත් කණ්ඩායමක් ඉන්නවා අධිකරණයට ඉදිරිපත් කොට අධිකරණ තීන්දුවක් වශයෙන් පුනරුත්ථාපනය ලබාපු අය. ඒ අය 1,000ක් විතර ඉන්නවා. ඒ ගොල්ලෝ අපිත් එක්ක ඉන්නේ. අපේ බලාපොරොත්තුව ඒ අය අවුරුද්දක් විතර කාලයක් තියාගන්න. බුස්ස

[94] Calleigh McRaith, "Arbitrary Detention in Sri Lanka: *Internment, Rehabilitation, and Surrendees in the Prison System*," 14 Feb, 2012, http://groundviews.org/2012/02/14/arbitrary-detention-in-sri-lanka-internment-rehabilitation-and-surrenderees-in-the-prison-system/, accessed 27 February 2012.

[95] Representations done by Mr K. Godage, "*Proceedings of public sittings of the Commission of Inquiry on Lessons Learnt and Reconciliation appointed by His Excellency the President in terms of Section 2 of the Commissions of Inquiry Act*," Lakshman Kadirgamar Institute of International Relations and Strategic Studies, 15 September, 2010, http://www.llrc.lk/images/stories/docs/Sep2010/K%20Godage.pdf.

කඳවුරේ තව 1000ක් විතර ඉන්නවා ඒගොල්ලෝ විටින් විට මේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලට ඇවිත් යනවා."[96]
කොමසාරිස් ජනරාල්වරයා රජයට අයිති සන්ඩේ ඔබ්සර්වර් පුවත් පතත් සමග කළ සාකච්ඡාවකදී පුනරුත්ථාපන ක්‍රියාවලිය පිළිබඳ විස්තරයක් කළේය.[97]ඔහු සිය මධ්‍යස්ථාන (ආරක්ෂක නවාතැන් දීමේ හා පුනරුත්ථාපන මධ්‍යස්ථාන) 2006 දී අධිකරණ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද බවත්:
2009 මැයි මාසයේ වේලුපිල්ලේ ප්‍රභාකරන් ගේ මරණයත් සමගම දහස් ගණනක් සෙනඟ මේ පැත්තට ආවා. ඒ නිසා අපිට තාවකාලිකව මෙම මුලික වැඩ පිළිවෙළ තිබුනා. එල්. ටි. ටි. ඊ. ය සමග සම්බන්ධකම් තිබුන අයට භාරවීමේදී විකල්පයක් තිබුනා. එල්. ටි. ටි. ඊ. ය සමග ඉතා සුළු සම්බන්ධයක් තිබුන තැනැත්තන්ට පවා භාරවීමට ඉල්ලා සිටියා. ඉතින් 12,000 ක් ස්වේච්ඡාවෙන්ම භාර වුනා. ඔවුන් වෙන් වෙන්ව රඳවනු ලැබුවා.
තවදුරටත් ඔබ්සර්වර් පුවත්පතට කළ ප්‍රකාශයෙන්, සිය මධ්‍යස්ථානය ආරම්භයේදී ස්ථාන 24ක දී " භාරවු" අපි ඔවුන් ගේ වගතුග සහ සටහන් ලබා ගත්තා. ත්‍රස්ත විරෝධී මධ්‍යස්ථානයත් ඔවුන් ගෙන් ප්‍රශ්න කළා.
අපිට ඔවුන් ගේ වෙනත් සම්බන්ධකම් පිළිබඳව ඒ කියන්නේ එල්. ටි. ටි. ඊ. ය සමග තිබූ සම්බන්ධතා ආදිය සොයන්න ගියේ නැහ. ඒ කාර්ය කළේ ත්‍රස්ත විමර්ශන ඒකකය විසින්. යන්තම් හරි සම්බන්ධයක් තිබෙන කෙනෙක් ළඟට පවා ගිහින් ඔවුන් ප්‍රශ්න කළා.

එල්. ටි. ටි. ඊ. යත් සමග කිට්ටු සම්බන්ධකම් තිබූ ක්‍රියාකාරීන් තමන් පිළිබඳ තොරතුරු මහජනයා ඔත්තු සපයනු ඇතැයි බියෙන් ස්වේච්ඡාවෙන්ම භාර වන්නට ඉදිරිපත් වුනා. මේ පදනමින් තමයි ඔවුන් අපි වර්ග කළේ. එල්. ටි. ටි. ඊ. ය සමග කිට්ටු සම්බන්ධකම් තිබූ ක්‍රියාකාරීන් බුස්සට මාරු කළ අතර, ඔවුන් සෑහෙන ප්‍රමාණයක් සිටියා ත්‍රස්තවාදී වැළැක්වීමේ පණත යටතේ ඔවුන් රඳවා ගත් අතර, ඊට විවිධ පදනම් තිබුනා.

මේජර් ජනරාල් රාජගුරු ගේ ප්‍රකාශයට අනුව ත්‍රස්තවාදී විමර්ශන ඒකකය විසින් ඒ බි හා සී නමින් සිය රැඳවියන් කොටස් තුනකට බෙදනු ලැබුවා."මේ කාණ්ඩයට එල්. ටි. ටි. ඊ. නායකයින්, අනුගාමිකයින්, සහ අනෙක් අය අත්අඩංගුවට ගත් තැනැත්තන් හා වෙනත් කාර්යන් කළ අය ඇතුළත් විය. ඩි ඊ හා එෆ් යන කාණ්ඩ වලට අයත් වුයේ එල්. ටි. ටි. ඊ. කාඩර්වරු, ආධාරකරුවන් හා කම්කරුවන් ඇතුළත් වුනා.
ඔහු තවදුරටත් මේසේ ද කියා සිටියේය. 2006 හදිසි අවස්ථා නියෝග වලට අනුව, පුනරුත්ථාපන කාලය වර්ෂයක කාලයකී. නමුත් ආරක්ෂක ලේකම්වරයා ගේ නියෝගයක් මත මාස තුනෙන් තුනට තවත් වර්ෂයක කාලයක් දීර්ඝ කළ හැකි විය. ඇතැම් පුද්ගලයින් වැඩිපුර කාල පරිච්ඡේදයක් රඳවා තබා ගැනීමට අවශ්‍ය නම් මේ නියෝග අනුව කළ හැකි විය."[98]

---

[96] "Rehabilitation, resettlement of ex-LTTEers, a success," *Bureau of The Commissioner General of Rehabilitation, Ministry of Rehabilitation And Prison Reforms*, http://www.bcgr.gov.lk/news.php?id=108, reprinted from the *Sunday Observer*, 9 October 2011, accessed 19 February 2012.

[97] See above.

[98]- See above.

"භාර වුවෙමි"

ශ්‍රී ලංකික දෙවිඩ ප්‍රභවයක් සහිත විදේශ පුරවැසිභාවයක් හිමි ශාන්තන්, 2011 ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය සම්මුඛ සාකච්ඡාවක් පවත්වනු ලැබීය. ශාන්තන් ගේ උපන් ගම යාපනය දිස්ත්‍රික්කයේ පොයින්ට්පේදුරුය. 2005 සුනාමියෙන් පසු ඔහු අනාථ නිවාසයක ස්වේච්ඡා සේවකයෙක් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණියේය. ඔහු එල්. ටී. ටී. ඊ. ය විසින් බඳවා ගෙන කර්නල් තනතුරක් පිණිස පුහුණු කරන ලද්දේය. 2009 ඔහු තුවාල ලබනතෙක් විවිධ සටන් පෙරමුණු වල සටන් කළේය. 2009 මැයි මාසයේ දී ඔහු භාර විය. කඳවුරු ගණනාවක රඳවනු ලැබූ ඔහුට කිහිප අවස්ථාවකදීම වධ හිංසා පමුණුවන ලද්දේය. ඔහු විදේශීය රටක පුරවැසියෙක් නිසා එම තානාපති කාර්යාලයේ බල කිරීම මත අවසානයේ දී ඔහු කොළඹට රැගෙන එන ලදී. ශාන්තන් ට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනාව වුයේ ආයුධ පුහුණුව ලැබීමය. ඔහු ගේ තානාපති කාර්යාලය ඉදිරිපත් කළ නීතිඥවරයෙකු ඔහු වෙනුවෙන් පෙනී සිටි අතර, 2010 අප්‍රියෙල් 6 වන දින ඔහු මහාධිකරණය විසින් නිදහස් කරන ලදී. 2010 අප්‍රියෙල් 11 වන දින තානාපති කාර්යාලයේ රැකවරණය යටතේ ශ්‍රී ලංකාවෙන් නික්ම ගියේය.

" මැයි 18 වන දින මම සිටියේ නන්දිකාඩාල් කලපුවේ. ළමයින් හා වැඩිහිටි අය විශාල ප්‍රමාණයක් එහි සිටියා. බොහෝ දෙනෙක් මිය ගියා. සමහරු පීනන්න බැරි වුනත් කලපුවට බැහැලා පීනන්න උත්සාහ කළා. වෙඩි තැබීමෙන් බේරෙන්න ඔවුන් ඒ මේ අත දිව ගියා. මම සිවිල් වැසියන් සමග ගොස් බාර වුනා.

" ශාන්තන් ප්‍රථමයෙන් ම මිල්ටරි පොලීසිය විසින් රඳවා ගනු ලැබුවා. ඔහු හිතන්නේ ඒ 57 වන සේනාංකයෙන් කියලා. ඔහු ගෙන් ප්‍රශ්න කළ අතර, අල්ලස් දීමෙන් පසු ඔහු පළා ගියා.

" මට බැටන් පොල්ලකින් පහර දෙනු ලැබුවා. කම්බි කපන කතුරකින් මට පහර දුන්නා. මේ ඔක්කෝම කළේ ප්‍රශ්න කිරීම පිණිසයි. ඔවුන්ට දැන ගන්නට ඕනෑ කළේ එල්. ටී. ටී. ඊ. නායකයා ඉන්නේ කොහෙද කියලා. " කෝ එල්. ටී. ටී. ඊ. නායකයා. වෙන කවුද එල්. ටී. ටී. ඊ. නායකයෝ ඉන්නේ. ඔවුන් කොහාට ද පැනලා ගියේ. තමුන් ගේ තනතුර මොකක්ද වගේ ප්‍රශ්න මගෙන් ඇහුව්වා.

" පලා ගිය මම ඕමන්තෙයි වලට ගියාම එහිදී මිනිස්සු මාව හඳුනා ගෙන මම එල්. ටී. ටී. ඊ. නායකයෙක් කියලා පෙන්නුවා. ආයෙත් මාව අත්අඩංගුවට අර ගෙන ප්‍රශ්න කරන්න පටන් ගත්තා.

" ඒක කුඩා ගොඩනැඟිල්ලක්. මම හිතන්නේ කාමර හතරයි තියෙන්නේ. යුද්ධ හමුදාවේ බුද්ධි අංශය මගෙන් ප්‍රශ්න කළා. ඔවුන් ළඟ පිස්තෝල තිබුනා. ඒවාට උන්ඩ පුරවලා මගේ කටේ ඔබනවා වෙඩි තියන්න. ඔවුන් ළඟ පුංචි බ්ලේඩ් තල තිබුනා. ඒවායින් මගේ අත් කැපුවා. ඔවුන් මගේ පුරුෂ ලිංගය කපා දමන බවට තර්ජනය කළා.

" මාව දවස් ගණනාවක් රඳවා ගෙන එකම ප්‍රශ්න නිතරම අහනවා. දින කිහිපයකට පසු මාව ඕමන්තේ පාසැලකට යවනු ලැබුවා. එතන තව සටන්කාමීන් 15 දෙනෙක් විතර හිටියා. ඒක පරණ පාසැල් ගොඩනැඟිල්ලක්. එතන 3,000 ක් විතර හිටියා. එතන ප්‍රශ්න ගොඩක් තිබුනා. අපි පේළියට වාඩි වෙන්න ඕනෑ. ඊට පස්සේ හමුදා භටයෝ අපිට පයින් පහර දෙන්න පටන් ගන්නවා. ඔවුන් රතු නිල ඇඳුමක් ඇඳ ගෙන හිටියේ. ප්‍රධාන පරීක්ෂක නිතරම වෙනස් වුන හින්දා අපි කවුරුන් භාරයේ හිටියා ද කියලා හරියටම කියන්න බෑ. මෙතන දී රෑ දහයෙන් පස්සේ අපිව වධකාරගාරයකට ගෙනි යනවා. මගේ අත් දෙක පුටුවකට ගැට ගහනවා. ඊට පස්සේ ඇඟ හැමතැනටම අතින් පයින් සමහර වේලාවට බැටන් එකකින් පහර දෙමින් කුණු හරපෙන් බනිනවා.

" සති දෙකකට පස්සේ අන්තර් ජාතික රතු කුරුස සංවිධානයෙන් පැමිණියා. ඊට පස්සේ මාව වධකාගාරයට ගෙන ගියේ සතියකට වරයි. වධකයෝ නිතරම මත්පැන් සමහර විට ගංජා බීලයි ඉන්නේ. මං මුහුණ දුන් තර්ජන වලට තවත් බොහෝ දෙනෙක් මුහුණ දී සිටියා. මේ

තත්වය නිසා අපි තනි වුනා. බුද්ධි අංශයේ මගේ ඉතා හොඳ යාළුවෙක් එතන හිටියා. එයාව හොඳටම වධ හිංසාවලට ලක් කර තිබුනා. ලේ පේරා ගෙන එන කොට හඳුනා ගන්න බැරි වුනා. නමුත් අපි ඔහුව මඟ හැරියා. අපි ඔක්කෝටම ඕනෑ වෙලා තිබුනේ තම තමන් බේරෙන ක්‍රමයක් හොයා ගන්නයි.

" ඒ ස්ථානය ඉතාමත් සවුත්තු තැනක්. එක් පංති කාමරයක 60 දෙනෙක් රඳවා තිබුනා. නිද ගත්තේ නිකං සිමෙන්ති පොළවේ. අපිට කෑම ලැබුනේ තුන් දෙනෙකුට එක් පැකට් එක ගානේ. ඒවා පරණ පිළුණු වෙච්ච කෑම.

" ඊට පස්සේ මාව වවුනියා මධ්‍ය මහා විද්‍යාලයට ගෙන ගියා. මෙතන 600ක් විතර හිටියා. ඒක හැඳින්වුනේ "පුනරුත්ථානපන කඳවුරක්" වශයෙන්. මෙතන තරමක් හොඳයි. මෙතන අපි කෑම උයා ගන්න ඕනෑ. නමුත් තිබුනේ එළවළු විතරයි. මෙතනත් වතුර හා වැසිකිලි පිළිබඳ ප්‍රශ්න තිබුනා. සතියකට දෙපාරක් එක් කෙනෙකුට වතුර ලීටර පහ ගනනේ දුන්නා. එකෙන් ඔක්කෝම වැඩ ටික ඒ කියන්නේ සේදිලි, වැසිකිලි, උයන්න හා බීමත් කර ගන්න වුනා.

" මෙතන දී උදෙන්ම නැගිලා නාන්න ඕනෑ. ඊට පස්සේ අපි පේළියට ඉන්න ඕනෑ. හමුදාවෙන් ඊට පස්සේ පෙරෙට්ටුවක් ගන්නවා. කවුරු හරි අතුරුදහන් වේලා තිබුනොත් අපිට ගුටි කන්න වෙනවා. ඊට පස්සේ සොල්දාදුවෝ අපි බලහත්කාරයෙන් ශ්‍රී ලංකා කොඩිය ඔසවා ජාතික ගීය ගයන්න කියනවා. ඊට පස්සේ අපි ආයෙත් පංති කාමරයට යවනවා මුළු දවසම ඒක ඇතුලේ ඉන්න ඕනෑ. අපිට කියවන්න පොතක් පතක් වත් තිබුනේ නෑ.

" මෙතනදීත් අපිට යම් ප්‍රමාණයකට වධ හිංසාවලට මුහුණ දෙන්න වුනා. නිතරම එල්. ටී. ටී. ඊ. එක පිළිබඳව ප්‍රශ්න අහනවා. රාත්‍රීයට අපි නිද ගෙන ඉන්න කොට සොල්දාදුවෝ ඇවිත් අපිට පයින් ගහනවා. මාස හතරකට පස්සේ මාව බලන්න අමුත්තන්ට අවසර දී තිබුනා.

" අන්තිමේදී තානාපති කාර්යාල නිලධාරීන්ට මාව බලන්න අවසර දී තිබුනා. ඔවුන් මට පුවත් පතක් ගෙනවිත් තිබුනා. මාව තවදුරටත් වධ හිංසාවලට ගොදුරු වුනා. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බුද්ධි අංශය මට නිතරම අවවාද කළා මට වධ හිංසාවලට ලක් කළ බව රහසක් වශයෙන් තබා ගන්නා ලෙසට. නැත්නම් මා මරා දමන බවට තර්ජනය කළා. තායනාපති නිලධාරීන්ට මීට පෙර මාව බලන්න එන්න බැරි වුනේ ඔවුන්ට ගෝඨාභය රාජපක්ෂ ආරක්ෂක ලේකම් අවසර නොදුන් නිසා යැයි කිව්වා.

" මාව බලන්න අම්මාවත් කැඳවා ගෙන ඇවිත් තිබුනා. එයාට මාත් එක්ක කථා කරන්න ඉඩ දුන්නේ විනාඩි 10ක් පමණයි.

" මම අම්මාව දැක්කේ සෑහෙන කාලයකට පස්සේ. ඒ නිසා මේ මුණ ගැසීම අපි දෙන්නාටම සතුටුදායක හමුවිමක් වුනා. එයා දැන ගෙන හිටියේ නැහ මම ජීවතුන් අතරෙ ඉන්නවාද මළා ද කියලා. නමුත් මට මුහුණ දෙන්නට සිදු වූ අත්දැකීම් ගැන මම මොකුත් කිවේ නැහ. මම තමයි පවුලේ වැඩිමහල් පුතා. අම්මා මාව බලන්න එනකොටත් හුඟක් දුර්වල වෙලා හිටියේ මේවා එයාට දරා ගන්න බෑ.

" 2010 මාර්තු 17 වන දින ශාන්තන් කොළඹ අපරාධ විමර්ශන දෙපාර්තුමේන්තුවේ අපකිර්තීමත් හතර වන තට්ටුවට ගෙන ගියේය.

" කොළඹට එන්න සිදු විම අවාසනාවක්. ඇත්තටම අවාසනාවක්. මේක සම්පූර්ණයෙන්ම වධකාගාරයක්. මෙතන විදුලි පුටුවක් තියෙනවා. මට ඒක ගැන හිතන්නවත් බෑ. ඔබ දන්නවා ඇති ඔවුන් අතර, කියමනක් තියෙනවා.....දෙවන තට්ටුව විමර්ශන.....හතරවන තට්ටුව වධ හිංසා..... හය වන තට්ටුව පරලොව.

" මට මෙතන ඉන්න සිද්ධ වුනේ දින කිහිපයයි. තානාපති කාර්යාලයෙන් ආවා. ආණ්ඩුව මාව කොළඹට ගෙන ආ බවක් තානාපති කාර්යාලයට දැනුම් දී තිබුනේ නෑ. මම එතනට ආපු ආගන්තුකයෙක් අතේ තානාපති කාර්යාලයට පණිවුඩයක් යැව්වා.

" තානාපති කාර්යාලය නීතිඥවරයෙකු මඟින් අධිකණයේ නඩුවක් පැවරුවා. ඒ නඩුව දවස් දෙකෙන් ඉවර කළා. අප්‍රියෙල් 6 වන දින මහා අධිකණය මාව නිදහස් කළා.

" ඊට දින හතරකට පසු ශාන්තන් දිවයිනෙන් බැහැර ගියේය.

6- නිගමන

ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම පිළිබඳ නීතිමය ක්‍රියා පටිපාටීන් නිරන්තරයෙන්ම ක්‍රමානුකූලව උල්ලංඝණය කරමින් , බලහත්කාරයෙන් හා අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම සැලකිල්ලට ගත යුතු දීර්ඝ කාලීන ගැටළුවක් වෙයි. මෙම වාතාවරණය තුළ වරදින් නිදෙස්වීම වර්ධනය වෙයි; සියළුම ආකාරයේ මානව අයිතීන් උල්ලංඝණය වන සියළුම ආකාරයේ මානව අයිතීන් පිළිබඳ විමර්ශනයක් හෝ දඬුවම් දීමක් හෝ සිදු නොවේ. අහිංසක මිනිසුන්ට අධිකරණයේ පිළිසරණ අහිමිවන අතර, අපරාධ සම්බන්ධයෙන් වගකිව යුත්තන් වගවීමකින් තොරව නිදැල්ලේ සිටිති. මෙම ගණයට ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් ප්‍රලේඛනය කොට ඇති අන්දමට, එල්. ටි. ටි. ඊ.ය විසින් සිවිල් වැසියන් ඝාතනය හා වධ හිංසා පැමිණවීම, බලහත්කාරයෙන් ළමා සොල්දාදුවන් බඳවා ගැනීම හා සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස භාවිතා කිරීම වැනි අපරාධ ද ඇතුළත්ය.

තමන් විසින් කරන ලද වරදක් පිළිබඳ කිසිදු චෝදනාවකින් තොරව රඳවා ගෙන සිටින ශ්‍රී ලංකිකයින් එක්කෝ නිදහස් කළ යුතුය එසේ නැත්නම් ඔවුන්ට අධිචෝදනා ඉදිරිපත් කළ යුතුය. පිළිගත හැකි සාක්ෂි තිබෙන සියළු දෙනාමට අධිකරණය ඉදිරියේ නඩු පවරා දඬුවම් ලබා දිය යුතුය.

මෙම වාර්තාවේ විස්තර සහිත ව දක්වා තිබෙන පුද්ගල සිද්ධි අධ්‍යනයන් මෙන් තවත් දහස් ගණනක් පුද්ගලයින්, ඔවුන් වරදක් කර තිබේ ද එසේ නැත්නම් අහිංසකයින් ද යන්න නොසලකා ඔවුන් සියළු දෙනාම, මානව අයිතීන් උල්ලංඝණය වූ වින්දිතයින් බවට පත් කොට තිබේ. ඔවුන්ට මෙන්ම ඔවුන් ගේ පවුලේ ඥාතීන්ට ද සහනයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් තිබේ.

සිය රටේ ජනතාවගේ අයිතීන්, අත්‍යවශ්‍ය නීත්‍යානුකූල පියවර මඟින් ආරක්ෂා කිරීමේ අයිතියක් මෙන්ම යුතුකමක් ද ශ්‍රී ලංකා ආණ්ඩුවට ඇත. මීට ආරක්ෂාව තහවුරු කිරිමද ඇතුළත් වන නමුත් කිසිම අවස්ථාවක ඔවුන් ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝණය කරමින් නොකළ යුතුය. ශ්‍රී ලංකාව බැඳී සිටින අන්තර් ජාතික නීති පණත් විසින් මෙන්ම ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් ද පිළි ගන්නා නිදහසට ඇති අයිතිය මූලික මානව අයිතිවාසිකමක් වෙයි. මෙය නොසලකා, අහෝසි කිරිමට පෙර හදිසි නීතිය යටතේ හා වර්තමානයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ද චෝදනාවකින් හා නඩුවිභාගයකින් තොරව මෙන්ම නඩු විභාගයක් පැවැත්වුවත් එය සාධාරණ නඩු විභාගයක් යැයි කළ නොහැකි නඩු යටතේ ද පුද්ගලයින් අත්තනෝමතික ලෙස රඳවා තබා ගනී. මේ නිසා ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසඳලීමේ ක්‍රමයට ඇති වූ හානිය සුළු පටු නොවේ. ඒ නිසා ශ්‍රී ලංකාව ත්‍රස්ත වාදය වැළැක්වීමේ පණත එල්ලී සිටීම අහෝසි කළ යුතු අතරඋ නිල නොවන ලෙස රඳවා තබා ගැනීමේ ක්‍රමය අහෝසි කළ යුතුය.

අත්තනෝමතික රඳවා තබා ගැනීම නිරන්තරයෙන්ම සංදේශනයට ඇති අයිතිය, වධ හිංසාවලට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොවීමේ අයිතිවාසිකම මෙන්ම අධිකරණ බාහ්‍ය ඝාතන හා බලහත්කාර අතුරුදහන් කිරීම් වැනි අනෙකුත් මානව අයිතිවාසිකම් උල්ලංඝණයට මාර්ගය පාදන නිසා බලධාරීන් විසින් කඩිනමින් මෙම උල්ලංඝණයන් මුලින්පුටා දැමීමට පියවර ගත යුතුය.

ඇත්ත වශයෙන්ම මානව අයිතිවාසිකම් උල්ලංඝණයන් හා වරදින් නිදෙස් වීම නතර කොට වගවීම සහතික කරමින් ශ්‍රී ලංකා ආණ්ඩුව සිය අන්තර් ජාතික වගකීම් ඉටු කිරිම පිණිස නිර්ව්‍යාජ ප්‍රයත්නයක්

දරන්නේ නම් යුද්ධය නිසා සී සී කඩ විසිරි ගිය ජනතාව අතරඋ සාමය හා සංහිඳියාවත් යුක්තිය හා මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම එම ප්‍රයත්නයේ අංගයක් විය යුතුය.

නිර්දේශ

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය, ශ්‍රී ලංකා බලධාරීන් ගෙන් මේසේ ඉල්ලා සිටියි;

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත වහාම අහෝසි කිරීම හා නිලනොවන අත්තනෝමතික ලෙස රඳවා තැබීම් අහෝසි කිරීම;
- හදිසි නීතිය හා ත්‍රස්තවාදය මැඩපැවැත්වීමේ නීති යටතේ අත්අඩංගුවට ගෙන ඇති සියළුම පුද්ගලයින් පිළිගත් අධිකරණයක් ඉදිරියේ අධිචෝදනා ඉදිරිපත් කළ නොහැකි හා රිමාන්ඩ් භාරයට පත් කළ නොහැකි සියළු දෙනාම වහාම නිදහස් කිරීම. සෑම නඩු විභාගයක්ම කඩිනමින් පැවැත්විය යුතු අතරඋ ජාත්‍යන්තර පිළි ගැනීමක් සහිත අධිකරණයන් මඟින් එබඳු නඩු විසදිය යුතුය.
- අධිකරණය විසින් දී තිබෙන තීන්දු (විශේෂයෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මූලික අයිතිවාසිකම් නඩු සම්බන්ධයෙන් හා හේබයාස් කේපුස් නඩු සම්බන්ධයෙන් දී තිබෙන තීන්දු) ක්‍රියාත්මක කරමින් රැඳවියන් වහාම නිදහස් කිරීම;
- සෑම තැනැත්තෙකුට ම, මත දැරීමේ සහ තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද, ඇතුළුව; සිතිමේ නිදහසට, හෘද සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට ඇති හිමිකම භුක්ති විඳින ලද තැනැත්තන් කොන්දේසි විරහිතව රඳවා ගෙන සිටින තැනැත්තන් වහාම නිදහස් කිරීම;
- සංදේශනයෙන් තොරව රඳවා සිටීම වහාම අහෝසි කිරීම;
- වහාම නිල නොවන රැඳවුම් මධ්‍යස්ථාන හා රහස්‍ය ස්ථාන වසා දමමින්, නිල වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති රැඳවුම් මධ්‍යස්ථාන හැර අනෙකුත් රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථාන නීති විරෝධී කරන නීති සම්පාදනය කිරීම, නිල රැඳවුම් මධ්‍යස්ථාන වලට රැඳවියන් ගේ ඥාතීන්ට හා මිත්‍රයින්ට ප්‍රවේශ වීමේ අවසරය ලබා දීම;
    - රැඳවියන් හා ඔවුන් ගේ පවුල් වලට එරෙහිව කරන ලද වධ හිංසාවලට ලක් කිරීම හා අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවම්වලට යටත් කිරීම, බලහත්කාර අතුරුදහන් කිරීම් හා අධිකරණ බාහ්‍ය ඝාතන ඇතුළු මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නඟන චෝදනා, ස්වාධීන මෙන්ම අපක්ෂපාතී හා නිර්ව්‍යාජ ලෙස විමර්ශනය කිරීම සහ එම විමර්ශන වාර්තා ප්‍රසිධ කිරීම; මානව අයිතිවාසිකම් හා සම්බන්ධ අපරාධ වලට සම්බන්ධ ත්‍රිවිධ හමුදාවේ උසස් අණ දෙන නිලධාරීන් ද ඇතුළු පුද්ගලයින් සාධාරණත්වය පිළිබඳ අන්තර් ජාතික පිළි ගැනීමක් සහිත අධිකරණයක් මඟින් පවත්වන නඩු විභාගයකට ඉදිරිපත් කිරීම;
    - අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් අත් අඩංගුවට ගැනීමට හේතු ඔවුන්ට දැනුම් දීම හා සැකකරුවන්ට සිය ඥාතීන්, මිත්‍රයින් සමග සංදේශනයට හා නීතිඥ සාහය ලබා ගැනීමට තිබෙන අයිතිය සහතික කිරීම; ඉල්ලා සිටිනු ලබන්නේ නම් අත් අඩංගුවට ගත් නිලධාරීන් ගේ නම් ලිඛිතව ලබා දීම.
    - යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගනු ලබන නිලධාරීන් විසින් ඒ පුද්ගලයා රඳවා තබන ස්ථානය ලිඛිතව ඒ තැනැත්තා ගේ පවුලේ උදවියට ලබා දීම.
    - මින් අනතුරුව රැඳවියා යම්කිසි වෙනත් මධ්‍යස්ථානයකට මාරු කරනු ලබන්නේ නම් ඒ පිළිබඳ විස්තරද ඒ පුද්ගලයාගේ පවුලේ උදවියට ලබා දීම.
    - "භාරවන තැනැත්තන්" ඇතුළු සියළුම රැඳවියන් කඩිනමින් මහේස්ත්‍රාත්වරයෙක් වෙත ඉදිරිපත් කිරීම; මහේස්ත්‍රාත්වරයාට එම අත්අඩංගුවට ගැනීම නීත්‍යානුකූලද නැද්ද යන

සළකා බලා ඒ අනුව අත්අඩංගුවට ගත් පුද්ගලයා රඳවා තබන්නේ ද එසේ නැතිනම් නිදහස් කරනු ලබන්නේ ද යන තීරණය කිරීමට බලයක් තිබීම;

- කඩිනමින් සියළුම රැඳවියන්ට තමන් ගේ පවුලේ උදවිය සමග සංදේශනයට අවකාශ සැලසීමද, ඔවුන් තෝරා ගන්නා නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීමට හා අවශ්‍ය නම් ස්වාධීන වෛද්‍යවරයෙකු ගේ උපදේස් ගැනීමට තිබෙන අවසරය සහතික කිරීම;
- "පුනරුත්ථාපනය" සඳහා රඳවා තබා ගන්නා පුද්ගලයින් ඇතුළු සියළුම රැඳවියන් මුණ ගැසීම පිණිස අන්තර් ජාතික රතු කුරුස සංවිධානය වැනි අන්තර් ජාතික මානවීය සංවිධානයන්ට අවසර දෙන බවට සහතික වීම;
- සියළුම රැඳවියන්ට තම රඳවා තබා ගැනීම ස්වාධීන සිවිල් අධිකරණයක් ඉදිරියේ හෝ ඒ හා සමාන නිසි බලධාරියෙකු ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට තිබෙන අයිතිය සහතික කිරීම;
- සියළුම රැඳවියන් ගෙන් ප්‍රශ්න කිරීමේ දී ඔවුන්ට නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීමට අවසර ලැබෙන පරිදි පවත්නා නීති සංශෝධනය කිරීම;
- සියළුම රැඳවියන්ට තමන් අත්අඩංගුවට ගත් වහාම ස්වාධීන වෛද්‍යවරයෙකු ලවා සිය සෞඛ්‍ය තත්වය පරික්ෂා කරවා ගැනීමේ අයිතිය මෙන්ම සෑම ප්‍රශ්න කිරීම් වාරයක් අවසානයේ දීම සිය සෞඛ්‍ය තත්වය ස්වාධීන් වෛද්‍යවරයෙක් ලවා නියාමනය කරවා ගැනීමට තිබෙන අයිතිය සහතික කිරීම;
- "පුනරුත්ථාපනය" කිරීම ඇතුළු සියළුම රැඳවියන් ගේ පොදු නාම ලේඛනයක් පිහිටුවීම හා නඩත්තු කිරීමත් එය මහජනයා ගේ පරිශීලනය පිණිස ලබා දීම; මෙම නාම ලේඛනයට අත්අඩංගුවට ගැනීමේ නියෝගය නිකුත් කළ දිනය හා අත්අඩංගුවට ගත් දිනය, නියෝගය නිකුත් කල බලධාරියා, රැඳවියන් මාරු කිරීම නිදහස් කිරීම හා නැවත අත්අඩංගුවට ගැනීම පිළිබඳ විස්තර ඊට ඇතුළත් කළ යුතුය.
- බන්ධනාගාර, සිරකුටි හා සියළු ආකාරයේ රැඳවුම් මධ්‍යස්ථානයන් හි තත්වය වැඩි දියුණු කිරීම, තදබදය අවම කිරීම, ආහාර පාන හා වෛද්‍ය ප්‍රතිකාර සැපයීම ඇතුළු සියළු සත්කාර එක්සත් ජාතීන් ගේ සිරකරුවන්ට සත්කාර කිරීම පිළිබඳ අවම ප්‍රමිතිය හා එක්සත් ජාතීන් ගේ කවර ආකාරයකින් හෝ රඳවා තබා සිටින හෝ සිරගත කර තිබෙන පුද්ගලයින්ට සත්කාර කිරීම පිළිබඳ මුලධර්ම සංහිතාවට අනුව පවත්වා ගෙන යාම;
- එක්සත් ජාතීන් ගේ සියළුම ආකාරයේ වධ හිංසවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකිරීම ප්‍රඥාප්තිය අනුමත කිරීම හා ඊට අනුරූපව ජාතික යාන්ත්‍රණයක් පිහිටුවීම හා සිය නිදහස අහිමිවු සියළුම පුද්ගලයින් රඳවා තිබෙන ස්ථාන ස්වාධීනව නියාමනය කිරීම සහතික කිරීම.
- මානව හිමිකම් උල්ලංඝණයන්ට ගොදුරු වූ චින්දිතයින්ට අන්තර් ජාතික ප්‍රමිතීන්ට අනුරූපව හානිපූරණය සහතික කිරීම;
- විශේෂයෙන්ම එක්සත් ජාතීන් ගේ වධ හිංසා සහ අත්තනෝමතික රඳවා තබා ගැනීම් ක්‍රියාකාරී කමිටුවේ විශේෂ නියෝජිත, බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ කිරීම් පිළිබඳ ක්‍රියාකාරී කමිටුව, භාෂණයේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන් ගේ විශේෂ නියෝජිත සහ ස්වාධීන විනිසුරුවන් ගේ හා නීතිඥයින් පිළිබඳ එක්සත් ජාතීන් ගේ විශේෂ නියෝජිත යන අයට ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලෙසට ආරාධනය කිරීම හා එම සංචාරයන් සම්බන්ධීකරණය කිරීම සහ මෙම විශේෂ නියෝජිතයින් හා ක්‍රියාකාරී කමිටු විසින් කර තිබෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අභිලාෂයෙන් සලකා බැලීම;
- අන්තර් ජාතික අපරාධ අධිකරණය පිළිබඳ රෝම ප්‍රඥාප්තිය හා බලහත්කාර අතුරුදහන් කිරීමෙන් සියළු පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අනුමත කිරීම හා මානව අයිතිවාසිකම් හා සම්බන්ධ සියළුම පණත් දේශීය නීති පද්ධතියට අන්තර් ග්‍රහණය කරමින් ඒවා ක්‍රියාත්මක කිරීම සහතික වීම;

- අධිකරණයන් ඉදිරියේ මෙන්ම මහජන අවකාශය තුළ සිය අදහස් ප්‍රකාශ කිරීමට සතුටු පුද්ගලයින් හා ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් ගේ ආරක්ෂාව සහතික කිරීම පිණිස සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ඵළදයි වැඩ සටහනක් පිහිටුවීම;

  වරදින් නිදෙස් වීම පිළිබඳ දිර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ, එල්. ටි. ටි. ඊ. යට එරෙහි යුද්ධයේ අවසාන අදියරේ දී සිදුවුනා යැයි කියන මානව හිමිකම් උල්ලංඝණයන් ඉතාමත් බරපතළ වන අතර, අන්තර් ජාතික යුක්තිය ඉටු කිරීම සම්බන්ධයෙන් විශාල අභියෝගයක් වන අතර. මීට අන්තර් ජාතික වශයෙන් පමණක් නොව දේශීය වශයෙන් ද ප්‍රතිකර්මයන් අවශ්‍ය වෙයි. ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එක්සත් ජාතීන් ගේ මහ ලේකම් බෑන් කිං මූන් ගේ විද්වත් කමිටු වාර්තාවේ දක්වා ඇති ආකාරයට "යුද්ධය පවත්වා ගෙන යනු ලැබූ ආකාරය මගින් යුද්ධයක් මෙන්ම සාමයක් පවතින කාල වකවානු තුළ පුද්ගලයින් ගේ ජීවිතයට ඇති ආවේනික හිමිකම් සම්බන්ධ අන්තර් ජාතික නීතියට ඉතා විශාල ප්‍රහාරයක් එල්ල කර ඇත."[99] එක්සත් ජාතීන් ගේ සංවිධානය මෙම භායනක සම්ප්‍රදය පිටු දැකීම පිණිස ක්‍රියා කරමින් ස්වාධීන අන්තර් ජාතික විමර්ශනයක් සඳහා සහයෝගය දිය යුතුය.

  ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මේ අනුව එක්සත් ජාතීන් ගේ සංවිධානයෙන් මේ සේ ඉල්ලා සිටියි.

  - " ශ්‍රී ලංකාවේ මෙන්ම අන්තර් ජාතික මානවීය නීතියද උල්ලංඝණය කරන ලද බවට කරන චෝදනා සම්බන්ධයෙන් එක්සත් ජාතීන් ගේ මහ ලේකම්වරයා විසින් පිහිට විය යුතු ස්වාධීන අන්තර් ජාතික යාන්ත්‍රණයක් පිහිටුවීමට සහයෝගය දිය යුතුය"

7- ඇමුණුම්

7.1- අත්අඩංගුවට ගත් හෝ රඳවා තබනු ලබන පුද්ගලයින් ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිණිස ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නියෝග.

2006 ජූලි මස ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් 2007 අප්‍රියෙල් මාසයේ දී, ආරක්ෂක අමාත්‍යාංශය විසින් නැවත ආරක්ෂක අංශ වෙත නිකුත් කරමින් රැඳවියන් හට ඇතැම් ආරක්ෂාවන් සපයා තිබෙන බවත්. ඔවුන් සම්බන්ධයෙන් පරිපාලන බලතල ක්‍රියාත්මක කිරීමේ සීමාවන් තිබෙන බවත්. අවධාරණය කරන ලදී. මෙම නියෝග මගින් ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ඉලක්ක කළ අතර, ඔවුන්ට (1) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සාහය දෙන ලෙසටත් (2) හදිසි නීතිය හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ අක්‍රමවත් ලෙස හා නීත්‍යානුකූල නොවන ආකාරයෙන් අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අවවාද කිරීමක් කරන ලදී.
මෙම නියෝග මගින් පුද්ගලයින්ට තමන් අත්අඩංගුවට ගෙන රඳවා තබන ලද ස්ථානය සිය ඥාතීන් හා මිත්‍රයින් දැනුම් දීමට තිබෙන අයිතිය යලි තහවුරු කළ නමුත් නීතිඥවරයෙකු ගේ සාහය ලබා ගැනීමට ඉඩ දීම සම්බන්ධයෙන් සහතිකයක් නොවීය. මෙම නියෝග මගින්;

3- යම් කිසි තැනත්තෙක් අත්අඩංගුවට ගනු ලබන විට ඒ තැනැත්තා ගේ ඥාතීන්ට හා මිත්‍රයින්ට තමන් ගේ නම සහ නිලය හඳුන්වා දීම, ඒ තැනැත්තා අත්අඩංගුවට ගනු ලබන හේතුව දැනුම් දීම හා අත්අඩංගුවට ගනු ලබන තැනැත්තන් ආරක්ෂක අමාත්‍යාංශය විසින්

[99] "*Report of the Secretary-General's Panel of Experts on Accountability in Sri Lanka*," 31 May 2011, Pages ii and 71, http://www.un.org/News/dh/infocus/Sri_Lanka/POE_Report_Full.pdf, accessed 19 February 2012

නියම කර තිබෙන ආකාරයට ලේඛන ගත කිරීම කළ යුතුය. අත්අඩංගුවට පත් තැනැත්තාට තමා රඳවා සිටින ස්ථානය සිය ඥාතීන් ට හා මිත්‍රයින්ට දන්වා යැවීමට ඉඩ දිය යුතුය.

4- වයස අවුරුදු 18 ට අඩු ළමයෙකු හෝ කාන්තාවක් අත්අඩංගුවට ගත් විට ප්‍රශ්න කරනු ලබන ස්ථානයට ඔවුන් ට අභිමත පුද්ගලයෙක් කැටුව ඒමට ඉඩ දීමත්, හැකි සෑම අවස්ථාවකම ඒ පුද්ගලයින් කාන්තා නිලධාරීනියක ගේ භාරයේ තැබීමත් කළ යුතුය.

5- අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයාට තමන්ට අභිමත භාෂාවකින් සිය ප්‍රකාශය කිරීමටත්, ඒ පුද්ගලයා සිය අත් අකුරෙන් සිය ප්‍රකාශය ලියා දීමට සතුටු නම් ඒ සඳහාත් අවසර දිය යුතුය.

6- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයින්ට හෝ ඔවුන් ගේ අවසරය ලත් නියෝජිතයෙකුට අත්අඩංගුවේ තබා තිබෙන හෝ රඳවා තබා ඇති ස්ථානයන්ට ප්‍රවේශ විමට අවසර දිය යුතුය. තවද, යම්කිසි පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමෙන් හෝ රඳවා තබා ගැනීමෙන් පසු පැය 48ක් ඇතුළත ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දැනුම් දිය යුතුය.

7.2- ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ 2011 අගෝස්තු 29 දින සාදනු ලැබූ නියෝග

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 27 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

(2) යම් තැනැත්තෙක්-

(1) මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම බලපැවැත්වූ යම් හදිසි අවස්ථා නියෝගයක විධි විධාන ප්‍රකාරව, රඳවනු ලැබ ඇති යම් තැනැත්තෙකු, මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වූ වහාම අදාළ මහේසත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ මහේස්ත්‍රාත්වරයා විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව ඒ තැනැත්තා රැඳවුම් භාරයට පත් කිරීමට කටයුතු කරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු-

(අ) මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම බලපැවැත්වූ යම් හදිසි අවස්ථා නියෝගක විධිවිධාන ප්‍රකාරව වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයෙකු විසින් රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබ ඇතිනම් හෝ

(ආ) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ අර්ථානුකූලව යම් නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කිරීමට සම්බන්ධ වූ බවට හෝ ඊට ප්‍රවේදිතාවක් දක්වා ඇති බවට සාධාරණව සැක කරනු ලැබ ඇතිනම් හෝ

මෙම නියෝග ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට බලපවත්වන පරිදි 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ විධි විධාන යටතේ රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතුය. තැනැත්තන් සිරභාරයට ගැනීම හා ඔවුන්ට ඇප දීම සම්බන්ධයෙන් එකී පනතේ අන්තර්ගත විධි විධාන ඒ තැනැත්තා සම්බන්ධයෙන් එවිට අදාළ විය යුතුය..

3- (40 වන අධිකාරිය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 2වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථාව ඉකුත්ව ගොස් තිබීම සහ (40 වන අධිකාරිය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 5වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් වලංගුවීම සහ බලාත්මකවීම 2011 අගෝස්තු මස 30 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අවසන් වී තිබීම යන කරුණු

නොතකා, අධිකරණය භාරයෙහි හැර එවැනි යම් නියෝගයක් ප්‍රකාරව අත් අඩංගුවෙහි රඳවනු ලැබ ඇති කිසිම තැනැත්තකු 2011 අගෝස්තු මස 30 වන දින සිට දින 30ක් ඉක්ම යන තෙක් නිදහස් කරනු නොලැබීය යුතුය;

එසේ වුවද,ඉහත කී කාලසීමාව ඉකුත් වීමට පෙර 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 111 වන කොටස ප්‍රකාරව රඳවා ගැනීමේ නියෝගයක්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිකුත් කරනු නොලැබී නම් එම පනතේ 11 වන කොටසේ විධි විධාන යටතේ හෝ තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරනු ලැබ රිමාන්ඩ්භාරයට පත් කරන ලද්දේ නම් මිස ඒ තැනැත්තා රඳවනු ලැබ සිටියේ යම් තැනැත්තකුගේ භාරයේද එකී තැනැත්තා විසින් එ 'තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතු ය.

එසේ වුවද, ඉහත කී කාලසීමාව ඉකුත් වීමට පෙර 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධි විධාන) පනතේ 111 වන කොටස ප්‍රකාරව රඳවා ගැනීමේ නියෝගයක්, ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිකුත් කරනු නොලැබී නම්, එම පනතේ 11 වන කොටසේ විධි විධාන යටතේ හෝ තත් කාලයෙහි බලපවත්නා වෙනත් යම් නීතියක් යටතේ ඒ තැනැත්තා මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කරනු ලැබ රිමාන්ඩ්භාරයට පත් කරන ලද්දේ නම් මිස, ඒ තැනැත්තා රඳවනු ලැබ සිටියේ යම් තැනැත්තකුගේ භාරයේද, එකී තැනැත්තා විසින් ඒ තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතුය.

7.3- ශ්‍රී ලංකාවේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත එවන ලද ලිපිය 2011 මැයි

යොමු අංකය: TG ASA 37.2011.005

මේජර් ජනරාල් වී. ආර්. ඩී. සිල්වා,

බන්ධනාගාර දෙපාර්තුමේන්තුව,

අංක 150,

බෙස්ලයින් පාර,

කොළඹ 09.

12 මැයි 2011

හිතවත් බන්ධනාගාර කොමසාරිස් මේජර් ජනරාල් වී. ආර්. ඩී. සිල්වා,

ශ්‍රී ලංකාවේ රැඳවියන් සම්බන්ධයෙනී

මෙම ලිපිය ඔබ වෙත යොමු කරන්නේ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, මහජන ආරක්ෂක පනත හා හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා ගෙන සිටින පුද්ගලයින් පිළිබඳව, විශේෂයෙන් ම නඩු විභාගයකින් තොරව රඳවා සිටින තැනැත්තන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා වෙනී.

2010 සැප්තැම්බර් 15 වන දින උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි බන්ධනාගාර නීරික්ෂණ කමිටුවේ සභාපති කේ. ගොඩගේ මහතා බන්ධනාගාරවල තත්වය පිළිබඳ

කරුණු දක්වා සිටියේය. මෙහිදී ඔහු විසින් 2000කට ආසන්න දවිඩ ජාතිකයින් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ සිර ගෙවල් වල සිටින බවත්ඌ මෙයින් 500කට ආසන්න සංඛ්‍යාවක් වැලිකඩ රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා සිටින බවත්, මෙයින් බොහෝ දෙනෙක් සැක පිට අත්අඩංගුවට ගනු ලැබුවද, මේ වන තුරු කිසිම අපරාධ චෝදනාවක් සම්බන්ධයෙන් අධි චෝදනා ඉදිරිපත් කොට නැති බව කියා සිටියේය. ගොඩගේ මහතා මෙහිදී එබඳු පුද්ගලයින් පිළිබඳව සොයා බලා එක්කෝ නඩු පැවරීමට හෝ එසේ නැත්නම් නිදහස් කිරීමට විශේෂ වැඩ පිළිවෙළක් නිර්දේශ කරන මෙන් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටියේය.

ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍ය ස්ථාපිත වනු දැක්ම ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ ද ප්‍රාර්ථනාවක් වන අතරඌ ඒ සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවත්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය දරන ප්‍රයත්නය අපි ද අගය කරන්නේමු. සුවිශේෂ පියවරයන් වශයෙන් සැලකෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි අවස්ථා රෙගුලාසි මත එල්ඔ ගෙන සිටීම, පුද්ගලයන් අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම, රඳවා ගැනීමට මෙන්ම බලහත්කාර අතුරුදහන් කිරීමට හා වධ හිංසාවලට ලක් කිරීම මෙන්ම වෙනත් අවමන් සහගත සැලකිලි වලට ලක් කිරීමට වතාවරණය සලසයි.

ඖනව හිමිකම් ප්‍රවර්ධනය පිණිස අප දරන උත්සාහයේ තවත් ඉදිරියට ගෙන යනු පිණිස, ඉහත කී නීති හා රෙගුලාසි යටතේ යාවත් කාලීන කරන ලද පහත සඳහන් තොරතුරු අප වෙත දෙන්නේ නම් ඉතාමත් කෘතඥ වෙමු. බන්ධනාගාර දෙපාර්තුමේන්තුව අපට උපකාර කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. අපට පහත සඳහන් තොරතුරු ලබා දෙන්නේ නම් මැනවි.

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීති රෙගුලාසි යටතේ අද වන විට කොපමණ සංඛ්‍යාවක් රඳවා තබා සිටියිද?
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ විමර්ශනය නොකර සැක පිට අත්අඩංගුවේ රඳවා ගෙන සිටින පුද්ගලයින් ගෙන් සංඛ්‍යාව කොපමණද?
- ත්‍රස්තවාදය යටතේ වැරදිකරුවන් වී දඬුවම් ලැබුවන් ගෙන් කොපමණ සංඛ්‍යාවක් තවමත් බන්ධනාගාරයේ සිටිද?
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයින් රඳවා තිබෙන බන්ධනාගාර හා රැඳවුම් මධ්‍යස්ථාන මොනවාද?
- ස්ථානය, රඳවා සිටි කාලය, රඳවා සිටීමට හේතුව, වයස, ස්ත්‍රී පුරුෂ භාවය හා වරදකරු වීද නැද්ද යන ශීර්ෂ යටතේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හා හදිසි නීති රෙගුලාසි යටතේ රඳවා සිටින සංඛ්‍යාව කොපමණද?
- වැඩිදුර විස්තර දැන ගැනීම පිණිස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් සම්බන්ධ විය යුතු පුද්ගලයා කවරේද?
  ශ්‍රී ලංකාවේ බන්ධනාගාර කළමනාකරණය ප්‍රාදේශීයව සිදුවන ආකාරය පිළිබඳ තොරතුරුත් බන්ධනාගාර තුළ ඉහත කී නීති හා රෙගුලාසි යටතේ රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාවත් පිළිබඳ දත්ත ලබා දිය හැකි ඉතාමත් අගනේය.
  ත්‍රස්ත විරෝධී නීති රිති භාවිතය පිළිබඳ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ ස්ථාවරය දැන ගැනීම පිණිස අපගේ නවතම ප්‍රකාශනය වන " Forgotten Prisones" ප්‍රකාශනයේ පිටපතක් ද මේ සමග එවා ඇත.

ඔබගේ හිතවත්,
මධු මාලෝත්ත්‍රා,
ආසියානු පැසිෆික් කලාපීය,
නියෝජ්‍ය වැඩ සටහන් අධ්‍යක්ෂක,
ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය.



මම සාහය විමට කැමැත්තෙමි

සෑම දෙනාටම යුක්තිය, නිදහස හා අභිමානය සහිත ජනතා සහයෝගයෙන් ගොඩ නැගෙන යහපත් ලොවක් සඳහා මිහිතලයේ අධිත්‍රිවතාවයෙන් යුක්ත ගැටුම් වල, සිට හුදකලාතැන් හි කෙරෙන අරගල දක්වා **ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්** පෙනි සිටියි.

ඔබට කළ හැක්කේ කුමක් ද?

ලොව පුරා ක්‍රියාධරයන් විසින් මානව හිමිකම් මර්දනය කරනු ලබන බලවේග සමග ජයග්‍රාහි ලෙස සටන් කළ හැකි බව ඔප්පු කොට ඇත. මෙම සමාජ ව්‍යාපාරයෙහි කොටස්කරුවෙකු වන්න. බිය හා අවමානය පතුරන්නන් ට එරෙහි වන්න.

- මානව හිමිකම් උල්ලංඝණයන් අවසන් කිරීම පිණිස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් හි සාමාජිකත්වය ගෙන, ලොව පුරා ගොඩ නැගෙන උද්ඝෝෂණ ව්‍යාපාරයන් හි කොටස් කරුවෙක් වන්න
- ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත ඔබ ගේ පරිත්‍යාග යොමු කරන්න.

එක් ව සිටීමෙන් අප ගේ හඬට සවන් යොමු වනු නිසැකය.

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සාමාජිකත්වය ලබා ගැනීම පිණිස වැඩි විස්තර දැන ගැනීමට කැමැත්තෙමි.

නම

ලිපිනය

රට

විද්‍යුත් ලිපිනය

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත මම දායක වීමට කැමැත්තෙමි. (ඔබ ගේ දායක මුදල් බ්‍රිතාන්‍ය පවුම්, ඇමරිකන් ඩොලර් හෝ යුරෝ යන මුදල් ඒකක මගින් ගෙවිය හැක).

මුදල

කරුණාකර මගේ ගිනුමට බැර කරන්න විසා ☐ මාස්ටර් කාඩ් ☐

කාඩ් අංකය

අවලංගු වන දිනය

අත්සන

මෙම අයදුම් පත ඔබ ගේ රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයට යොමු කරන්න.

විස්තර ලබා ගැනීම පිණිස මෙම වෙබ් අඩවියට පිවිසෙන්න.
www.amnesty.org/en/worldwide-sites
ඔබ පදිංචි රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයක් නොමැති නම් ඔබ ගේ අයදුම් පත පහත සඳහන් ලිපිනයට එවන්න

Amnesty International, International Secretariat, Peter Benenson House,
1 Easton Street, London WC1X 0DW, United Kingdom

www.amnesty.org

මාංචු පිට

අත්තනෝමතික රඳවා තබා ගැනීම හා ජාතික ආරක්ෂාව

එල්ටිටිඊ්ය සමඟ දිර්ඝ කාලයක් පැවති යුද්ධය නිමා වූ නමුත්, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම අඛණ්ඩව ක්‍රියාත්මක වෙයි.

ඔවුන් රඳවා ගෙන ඇත්තේ ත්‍රස්තවාදය මැඩ පැවැත්වීමේ මර්දනකාරී නීති යටතේය. බලධාරීන්ට සාක්ෂි හා වරෙන්තුවකින් තොරව සැකකරුවන් අත්අඩංගුවට ගැනීමටත්, චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව දිර්ඝ කාලයක් රඳවා තබා ගැනීමටත් හැකිය.

සැකකරුවන් රැඳවුම් මධ්‍යස්ථාන අතර නිරන්තරයෙන් ම මාරු කරනු ලබයි. ඇතැම් රැඳවියන් රහසිගත නිල නොවන රැඳවුම් මධ්‍යස්ථානයන් හි, රඳවා තබා ගනිමින් වධහිංසා පමුණුවනු ලබයි. මේ අතර බරපතළ ලෙස මානව හිමිකම් හා යුද්ධ පිළිබඳ අන්තර් ජාතික නීති උල්ලංඝණය කළ බවට සාක්ෂි ඇති රැඳවියන් අතලොස්ක් දෙනා සම්බන්ධයෙන් පමණක් නඩු පවරා තිබේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම නීතියට නියම කොට ඇති කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිදු තැනැත්තකු සිරභාරයට ගැනීම, බන්ධනාගාර ගත කිරීම හෝ අන්‍යාකාරකින් ශාරීරක අවරෝධනයකට පාත්‍ර කිරීම නොකළ යුතුය. නමුත් පසුගිය වකවානුව තුළ හඳුන්වා දෙන ලද ආරක්ෂක නීතිරිති හා රෙගුලාසි මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීති සෝදා පාළුකට ලක් වූයේය. මෙම වාර්තාව මගින් අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීමේ භාවිතය වහාම නතර කරන මෙන් ද, රැඳවියන් විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් ඇත්නම් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් හා සාධාරණ නඩු විභාගයක් පවත්වන මෙන්ද, අන්තර් ජාතික මානව හිමිකම් නීති හා ගැටෙන දේශීය නීතිරිති වහාම සංශෝධනය ලෙසටත් ඉල්ලා සිටියි.

amnesty.org

සුචිය: ASA 37/003/2012
2012 මාර්තු

AMNESTY INTERNATIONAL